




# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# PROGRESS REPORT
# 2018



**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

**சுற்றுலா அபிவிருத்தி, வனஜீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சு**

**Ministry of Tourism Development, Wildlife and Christian Religious Affairs**

# ප්‍රගති වාර්තාව- 2018

සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

| පටුන | පිටුව |
|---|---|
| *අමාත්‍යාංශයේ දළ විශ්ලේෂණය* | vii |
| *අමාත්‍යාංශ කාර්යයන්* | viii |
| *අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන* | viii |
| *සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු ඇමතිතුමාගේ පණිවිඩය* | ix |
| *සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පණිවිඩය* | xi |
| *සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ විවරණය* | xii |
| *සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්තුමියගේ පණිවුඩය* | xiii |
| *අමාත්‍යාංශය* | xiv-xv |
| **සංචාරක සංවර්ධන අංශය** | |
| අමාත්‍යාංශයේ සංචාරක සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති | **4-22** |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | **23-38** |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | **39-48** |
| ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය | **49-60** |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | **61-72** |
| **වනජීවී අංශය** | |
| වනජීවී අංශය | **73-78** |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 79-88 |
| ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | 89-98 |
| ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | 99-110 |
| ශ්‍රී ලංකා වනජීවී භාරය | 111-114 |
| **ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව** | **115-127** |

| | වගු | පිටුව |
|---|---|---|
| 1.1 | සංචාරක කාර්යසාධනය- 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | 2 |
| 1.2 | සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රමුඛතම වෙළඳපොළ 10 | 3 |
| 1.3 | සංවර්ධන ව්‍යාපෘති -2018 | 4 |
| 1.4 | සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති සංවර්ධනය | 5 |
| 1.5 | මූල්‍ය කාර්යසාධනය | 12 |
| 1.6 | ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සාරාංශයක්-(2018.12.31) | 14 |
| 1.7 | සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන (තෙදින)-2018 | 15 |
| 1.8 | දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සහ ඒවා පුරාවිද්‍යාත්මක ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීම - ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා | 16 |
| 1.9 | 2018-12-31 දිනට සංචාරක අංශයේ මූල්‍ය ප්‍රගතිය | 21 |
| 2.1 | සංචාරක සංවර්ධන අරමුදලට බැර කරන ලද මුදල් | 26 |
| 2.2 | සංචාරක සංවර්ධන අරමුදල -ආදායම් | 26 |
| 2.3 | 2018.01.01 සිට 2018.12.31 දක්වා විගමන බද්ද හා සංචාරක සංවර්ධන බද්ද වියදම්කල ආකාරය | 26 |
| 2.4 | (IRU) ඒකකය විසින් ලබා ඇති සංඛ්‍යානමය ප්‍රගතිය | 28 |
| 2.5 | 2010 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් 31 දක්වා ආයෝජක සබඳතා ඒකකය (IRU) මඟින් ක්‍රියාකරන ලද ව්‍යාපෘතිවල සමස්ත ප්‍රගතිය | 28 |
| 2.6 | අනුමැතිය ලබා දෙන ලද ව්‍යාපෘතිවල ඉදිකිරීම් තත්වය | 29 |
| 2.7 | අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘති- දිස්ත්‍රික් මට්ටමින් වර්ගීකරණය | 29 |
| 2.8 | අයදුම්පත් ලද ව්‍යාපෘති හා අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල තත්වය | 30 |
| 2.9 | නවාතැන් සපයන අංශය | 33 |
| 2.10 | විශේෂිත සංචාරක සේවා | 34 |
| 2.11 | මාර්ගෝපදේශ සේවා | 34 |
| 2.12 | හෝටල් ලියාපදිංචිය සඳහා පරීක්ෂා කිරීම | 35 |
| 3.1 | මූල්‍යය කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය | 46 |
| 3.2 | අනුමත වාර්ෂික අයවැය 2018.12.31 දිනට වියදම | 47 |
| 4.1 | 2018 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සිසුන්ගේ සාරාංශය | 50 |
| 4.2 | පාඨමාලා අනුව නිමැවුමේ වර්ධනය 2015- 2018 | 51 |
| 4.3 | මූල්‍ය කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණය | 55 |
| 4.4 | අමතර ක්‍රියාකාරකම් - 2018 | 59 |
| 5.1 | සපුරාගත් ඉලක්ක | 62 |

| | | |
|---|---|---|
| 5.2 | සිද්ධි සඳහා සහාය | 69 |
| 5.3 | මූල්‍ය කාර්යසාධනය | 72 |
| 6.1 | මූල්‍ය ප්‍රගති සාරාංශය - 2018 | 76 |
| 7.1 | මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018 | 81 |
| 7.2 | සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය - 2018 | 81 |
| 7.3 | වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති (සාරාංශය) - 2018 | 82 |
| 7.4 | 2018 වර්ෂයේ සිදුකරන ලද සුවිශේෂ සේවාවන් හා වැඩසටහන් | 87 |
| 7.5 | මූල්‍ය ප්‍රගතිය (සාරාංශය) - 2018 | 88 |
| 7.6 | සංචාරක පැමිණීම සහ ආදායම - 2018 | 88 |
| 8.1 | සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය - 2018 | 91 |
| 8.2 | මූල්‍ය ප්‍රගතිය සාරාංශය | 92 |
| 8.3 | සංචාරක පැමිණීම සහ ආදායම - 2018 | 95 |
| 8.4 | සත්ත්ව සංරක්ෂණය සහ අභිජනනය | 96 |
| 8.5 | සත්ත්ව හුවමාරු වැඩසටහන් - 2018 | 97 |
| 9.1 | මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018 | 101 |
| 9.2 | සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය - 2018 | 101 |
| 9.3 | සංචාරක පැමිණීම සහ ආදායම - 2018 | 109 |
| 10.1 | 2018 වර්ෂයේ ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා ආදායම - වියදම සාරාංශය | 114 |
| 11.1 | අනුමත කළ වාර්ෂික අයවැය හා වියදම් 2018.12.31න් අවසන් වර්ෂය සඳහා | 117 |
| 11.2 | දේවස්ථාන ඉදිකිරීම් පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය | 117 |
| 11.3 | ප්‍රසිද්ධ දේවස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම | 118 |
| 11.4 | ආර්ථික සහාය අවශ්‍ය කිතුනු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම | 119 |
| 11.5 | ඉරු දින දහම්පාසල් ගුරු භවතුන් සඳහා නිළ ඇඳුම් ලබාදීම | 120 |
| 11.6 | අධ්‍යාත්මික පෞරුෂත්ව වැඩසටහන් | 120 |
| 11.7 | දහම් අධ්‍යාපන වැඩසටහන් | 121 |
| 11.8 | වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදු කිරීම | 123 |
| 11.9 | සංවර්ධන සහයන් | 124 |
| 11.10 | ඓතිහාසික වටිනාකම් ඇති දේවස්ථාන වල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම | 125 |

**ප්‍රස්ථාර / රූප සටහන්** **පිටුව**


| | | |
|---|---|---|
| 1.1 | විදේශ විනිමය උපයන්නකු ලෙස සංචාරක ව්‍යාපාරයේ වර්ධනය (ඇ.ඩො.මිලියන) | 3 |
| 2.1 | ගෝලීය සංචාරක දළ විශ්ලේෂණය | 24 |
| 2.2 | 2014 සිට 2018 දක්වා සංචාරක පැමිණීම | 24 |
| 2.3 | 2014 සිට 2018 දක්වා විදේශ විනිමය ඉපයීම | 25 |
| 2.4 | ඉහළම වෙළඳ පොළ දහය 2018 | 25 |
| 2.5 | අයදුම්පත් ලද ව්‍යාපෘති හා අවසන් අනුමැතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘති වල තත්ව දර්ශකය | 30 |
| 4.1 | කොළඹ හා ප්‍රාදේශීය වශයෙන් පාසල් පිහිටුවා ඇති ස්ථාන | 50 |

## අමාත්‍යාංශයේ දළ විශ්ලේෂණය

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය අංක 2103/33 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 2018 දෙසැම්බර් 28 වන දින ස්ථාපිත කරන ලදී. එහි විෂය පථයට සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු විෂය සම්බන්ධව ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා ඇගයීම, සංචාරක කර්මාන්තය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහතික කිරීම, සංචාරක කර්මාන්තය සම්බන්ධ ප්‍රමිති, නීතිරීති සහ රෙගුලාසි සකස් කිරීම, සංචාරක නියෝජිත ආයතන ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම, ශ්‍රී ලංකාව ඉහළම මට්ටමේ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය කිරීම, උද්භිද උද්‍යාන නඩත්තුව හා මල් වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම, විවිධ සතුන්, පක්ෂීන් සහ උරගයන් එක්රැස් කිරීම හා ප්‍රදර්ශනය කිරීම, වනජීවී සම්පත් තිරසාර ලෙස සංරක්ෂණය කිරීම, සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම හා රට තුළ ආගමික සහජීවනය ඇතිකිරීම අරමුණු කරගත් ක්‍රිස්තියානි ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කිරීම, අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන නියාමනය හා අධීක්ෂණය ආදිය ඇතුළත් වේ.

## දැක්ම

මතකයේ රැදෙන, අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දූපත ලෙස හඳුනාගැනීම.

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත්වීම.

## දැක්ම (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

“ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික සහ අධ්‍යාත්මික සංවර්ධනය”

## මෙහෙවර (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

සමාජ පිළිගැනීම සමඟ ක්‍රිස්තියානි සංස්කෘතියේ අගයන්, ආචාර ධර්ම සහ විශ්වාස ප්‍රචලිත කිරීම.

## අමාත්‍යාංශ කාර්යයන්
## (2018.12.28 දිනැති අංක 2103/33 දරණ ගැසට් පත්‍රයට අනුව)

1. සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු විෂයයට සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. සංචාරක කර්මාන්තය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
3. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු
4. විවේකය ගතකිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
5. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම.
6. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශී කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු
7. වනජීවී සම්පත් සංරක්ෂණය
8. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
9. වඳවී යාමේ තර්ජනයට මුහුණ පාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු
10. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
11. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
12. අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
13. අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයන් අධීක්ෂණය කිරීම.

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
3. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
4. ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය
5. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
6. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
7. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
8. වනජීවී භාරය
9. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව



## සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු ඇමතිතුමාගේ පණිවිඩය

මාගේ අමාත්‍යාංශයේ 2018 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය සම්බන්ධයෙන් මෙම පණිවිඩය ලබාදීම පිළිබඳව මම සතුටුවෙමි.

ශ්‍රී ලංකාව 2019 වර්ෂයේදී සංචාරය කිරීම සඳහා අංක 01 ගමනාන්තය බව ලෝකයේ වඩාත්ම බලවත් සංචාරක සඟරාව විසින් 2018 වර්ෂයේ අවසාන භාගයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකාවට එවැනි ජාත්‍යන්තර මට්ටමේ ගෞරවනීය පිළිගැනීමක් ලැබුණු ප්‍රථම අවස්ථාව මෙය වන අතර පසුගිය වසර 03 පුරා අමාත්‍යාංශය විසින් දරන ලද දැඩි කැපවීම හා උත්සාහවන්තභාවය එමඟින් පෙන්නුම් කරයි.

2018 දෙසැම්බර් 31 දිනට සංචාරකයින් 2,333,796 ක් ශ්‍රී ලංකාවට පැමිණ ඇති අතර, එය ලිත් වර්ෂයක් තුළ වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණි වසර ලෙස වාර්තා වී ඇත. එය පසුගිය වසරේ එම කාලයට සාපේක්ෂව 10.3% ක යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි. ආසියා සහ පැසිෆික් කලාපය ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් පිරිසක් පැමිණෙන කලාපය බවට තවදුරටත් පත්වෙමින්, 2018 දී එම කලාපයේ සංචාරකයින්ගේ පැමිණීම 47% ක් වූ අතර යුරෝපීය සංචාරකයින්ගේ පැමිණීම 43% ක් විය. ඉතිහාසයේ පළමු වතාවට සංචාරක ව්‍යාපාරයේ ඉපයීම් වර්ෂය තුළදී ඩොලර් බිලියන 4 ඉක්මවිය.

මේ අතර, 2018 සැප්තැම්බර් 30 දිනට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කරන ලද මුළු සංචාරක ආයතන සංඛ්‍යාව 2,215 කි. වර්ගීකරණය කරන ලද සංචාරක හෝටල් සංඛ්‍යාව 138 ක් විය. ඒ අතරට තරු පහේ සංචාරක හෝටල් 22 ක් ද ඇතුලත් විය.

වසර අවසානය වන විට රටතුළ ලියාපදිංචි කළ මුළු කාමර ප්‍රමාණය 38,214කි. ඒ අතරින් ලියාපදිංචි කළ ඉහළම කාමර ප්‍රමාණය වූ 13,408, තරු1 සිට 5 දක්වා වර්ගීකරණය කරන ලද සංචාරක හෝටල් වලින් වාර්තා විය. එයින් කොළඹ දිස්ත්‍රික්කයේ කාමර 7,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් තිබූ අතර කුරුණෑගල, කෑගල්ල, රත්නපුර සහ යාපනය යන දිස්ත්‍රික්කවල කාමර 500 කට වඩා අඩු වූ අතර මුලතිව්, කිලිනොච්චි, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල කාමර 100 කට වඩා අඩු විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වී ඇති මුළු අවන්හල් සංඛ්‍යාව 498 කි. ඒ අතරින් අවන්හල් 399 ක් හෝ 80% ක්ම A ශ්‍රේණියේ අවන්හල්වූ අතර 99 හෝ 20% B ශ්‍රේණියේ අවන්හල්ය.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදුකරන ලද ආයෝජන ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත්කල 2018 දෙසැම්බර් අවසානය වන විට මුළු ව්‍යාපෘති 350කට අවසන් අනුමතිය ලබා දී තිබූ අතර එයින් ව්‍යාපෘති 103ක් ඉදිකෙරෙමින් පවතින අතර ව්‍යාපෘති 193ක් දැනට ක්‍රියාත්මකය. සංචාරක ආයෝජන ව්‍යාපෘති 5 ක් තවමත් ආරම්භකර නැත.

අවසන් අනුමතිය ලබාදුන් ව්‍යාපෘතිවල මුළු ආයෝජන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 2,954.8ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඉදිකෙරෙමින් පවතින ව්‍යාපෘතිවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 962.7ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. දැනට මෙහෙයුම් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 1,754.5ක් වන අතර ආරම්භකර නොමැති ව්‍යාපෘතිවල වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 237.5ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2015 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මුළු පුහුණුලාභීන් සංඛ්‍යාව 2,632 ක් විය. 2017 වර්ෂය අවසානයේ මෙම හෝටල් පාසල්වල ඒකාබද්ධ නිමවුම 3,800 ක් දක්වා වර්ධනය වූ අතර 2018 වර්ෂය අවසන් වන විට පුහුණුලාභීන් සංඛ්‍යාව 5,800 දක්වා වැඩි කරගැනීමට අපට හැකි විය.

මේ අතර, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සියළුම ප්‍රධාන ගෝලීය සංචාරක ප්‍රදර්ශන වලට ක්‍රියාකාරීව සහභාගීවූ අතර ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඩුබායි, රුසියාව, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ස්කැන්ඩිනේවියා ආදී සියළුම ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළවල නිරන්තරයෙන් මාර්ග ප්‍රදර්ශන පවත්වන ලදී.

සංචාරකයින් අඩුවෙන් පැමිණෙන කාලවලදී එනම් සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා කාලය හා අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ සංචාරකයින් ආකර්ෂණය කරගැනීම සඳහා කොළඹට පියාසර කරන ජාත්‍යන්තර ගුවන් සමාගම්,

ගමනාන්ත අලෙවිකරණ සමාගම් හා තරු පන්තියේ හෝටල් සමග සහයෝගයෙන් 'Island Escapes' නමින් විශේෂ දේශීය ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරන ලදී. මෙම ප්‍රවර්ධන වැඩසටහනට ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබුණු අතර එහි පළමු සති තුන තුළදී වෙන් කිරීම් 1000කට වඩා වැඩි සංඛ්‍යාවක් ලැබී තිබුණි.

මේ අතර ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය එහි මෙහෙයුම් කටයුතු විධිමත් කරමින් ඉහළම කලාපීය MICE ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල ක්‍රියාකාරීව නිරතව සිටී. මේ සම්බන්ධයෙන් ඉන්දියාවේ සහ චීනයේ සිට විශාල කණ්ඩායම් පැමිණෙමින් සිටින අතර, සැලකිය යුතු ප්‍රතිශතයක් විවාහ මංගල ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව තෝරාගෙන ඇත.

2018 වර්ෂය පුරාම මාගේ අමාත්‍යාංශය කිතුනු ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීමේදී හා රට පුරා ඇති කිතුනු දේවස්ථාන හා ක්‍රිස්තියානි ආගමික ආයතන හරහා සමාජීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේදී ක්‍රියාකාරීව කටයුතු කර ඇත.

ඉදිරි ක්‍රියාමාර්ග දෙස අවධානය යොමුකිරීමේදී, සංචාරකයින්ගේ පැමිණීම වර්ධනය කරගැනීම සඳහා තිබෙන විශාලතම බාධාව බවට පත්ව ඇති බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ ධාරිතාවය පුළුල් කිරීම සම්බන්ධව 2019 වසරේදී ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදිය යුතුය.මෙයට හේතුවී ඇත්තේ, මෙම ගුවන් තොටුපල සංචාරකයින්ට ඉමහත් අපහසුතාවයක් ගෙනදෙමින් එහි සැලසුම් කරන ලද ධාරිතාවයෙන් 165% ක පමණ මෙහෙයුම් වර්තමානයේදී සිදුකිරීමය. ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකරන තුරු අවම වශයෙන් තාවකාලික පර්යන්තයක් ඉදිකිරීම සම්බන්ධව හදිසි අවධානය යොමුකිරීම අවශ්‍යවේ. ඉහළ වියදම්කරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය ගුවන් තොටුපලවල ධාරිතාව වැඩි දියුණු කිරීම සහ දේශීය ගුවන් ගමන් ප්‍රවර්ධනය කිරීම ද වැදගත්වේ.

ඉතා මෑතකදී වනජීවී අමාත්‍ය ධූරයද බාරගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව සත්කාරකත්වය සපයන ලද විශාලතම සමුළුවෙහි සත්කාරත්වය දැරීම සඳහා මෙම අමාත්‍යාංශය අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටී. රටවල් 180 ක නියෝජිතයන් 3500 කට අධික සංඛ්‍යාවක් සහභාගී වන වඳවී යෑමේ තර්ජනයට ලක්වී සිටින සත්ව හා වෘක්ෂලතා විශේෂ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 18 වන සමුළුව (CITES) මෙම වර්ෂයේ මැයි මාසයේදී කොළඹදී පවත්වනු ලැබේ.

වනජීවීන් යන්නට භූමියෙහි වෙසෙන සතුන් පමණක් නොව අප දිවයින වටා ඇති මුහුදේ වෙසෙන මුහුදු ජීවීන්ද ඇතුලත් වේ. අතීතයේ ජෛව විවිධත්වයෙන් පෝෂිතව පැවති සාගර, මසුන් වඳ වී යන ආකාරයට අධික ලෙස මසුන් ඇල්ලීම, සාගර දූෂණය, වාසස්ථාන අහිමිවීම හා කාලගුණ විපර්යාස හේතුවෙන් මේවන විට පෙර නොවී විරූ තර්ජන වලට මුහුණ පා සිටී. සාමුද්‍රික පරිසරය ඉක්මවා යන ප්‍රතිවිපාක එවැනි බලපෑම් මඟින් සිදුවේ. අපගේ වනජීවී උද්‍යාන හා රක්ෂිත වලට අවධානය යොමු කිරීමට අමතරව මුහුදු ජීවීන් ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම කෙරෙහිද අප අවධානය යොමුකල යුත්තේ එබැවිනි. මේ සම්බන්ධයෙන් ගත්කල විශේෂයෙන් දකුණු මුහුදු තීරයේ තල්මසුන් නැරඹීමේ සේවාවල නිරත සේවා සපයන්නන් විසින් අනිවාර්යයෙන් අනුගමනය කල යුතු අවම ප්‍රමිති අප අමාත්‍යාංශය සකස්කර ඇත.

අලි මිනිසුන් ගැටුම හැකි ඉක්මනින් විසඳීම, ජාතික වනෝද්‍යාන වල අධිගහනය සහ වන උද්‍යාන නැරඹීමට පැමිණෙන සංචාරකයන් සඳහා වඩා හොඳ පහසුකම් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටින අතර ප්‍රධාන ජාතික වන උද්‍යාන වල මාර්ගගත ක්‍රමයට ප්‍රවේශපත් වෙන් කරවා ගැනීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ලැබීම අප ලද ප්‍රධාන ජයග්‍රහණයකි.

අවසාන වශයෙන් මාහට ඉමහත් ශක්තියක් වූ මාගේ අමාත්‍යාංශයේ උද්යෝගීමත් කාර්ය මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුදකර සිටිමි. එමෙන්ම, 2019 වර්ෂයේදී ලොව අංක 01 සංචාරක ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම සඳහා දැඩි උනන්දුවෙන් හා කැපවීමෙන් කටයුතුකල අමාත්‍යාංශ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයට, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ට, උපදේශක කමිටුවේ සහ කාර්ය සාධක බලකායේ සාමාජිකයින්ට, අධ්‍යක්ෂවරුන්ට සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට, මාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට සහ සියලු පාර්ශවකරුවන්ට මම ස්තුතිවන්ත වෙමි.

**ජෝන් ඒ.ඊ.අමරතුංග (පා. ම)**
**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය.**



## සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පණිවිඩය

මාගේ ධූර කාලය තුළ අප අමාත්‍යාංශය විසින් මෑත කාලයේදී සිදුකරන ලද කාර්යයන් සහ අනාගතයේ දී සිදු කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් පිළිබඳව කෙටි විස්තරයක්ද සහිතව මාගේ අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සඳහා මෙම පණිවිඩය ලබාදීම පිළිබඳව මම සතුටු වෙමි.

මා මෙම ධූරයේ වැඩභාරගත් දා පටන්, දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ට විශාල අමතර ප්‍රතිලාභයක් ලබාදීම සඳහා හෝටල්, තානායම් සහ අමුත්තන්ගේ නිවාස ඒවායේ තත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් නිරන්තරයෙන් අධීක්ෂණයට ලක් කරන ලදී.

අතීතයේදී සංචාරකයන් බොහෝ දෙනෙක් උනන්දුවක් දැක්වූ ශ්‍රී ලංකාවේ තල්මසුන් නැරඹීම සඳහා සංචාර අකර්මණ්‍ය තත්වයක පැවතුණ අතර එය විධිමත් කිරීම සඳහා පියවර ගෙන ඇත. මෙය වාසිදායක කර්මාන්තයක් බවට පත්වීමේ විශාල විභවතාවක් මේවනවිට පෙන්නුම් කිරීමට පටන්ගෙන ඇත.

ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර චාරිකා අභිවෘද්ධියට ඉඩ හසර ලබාදෙන තලෙලමන්නාරම හා රාමේශ්වරන් එකට යා කෙරෙන නෞකා සංචාරක ව්‍යාපෘතියක්ද ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අදාළ අමාත්‍යංශ සමඟ එක්ව දැනට පවතින නාවික වරාය 3 ක සංවර්ධන කටයුතු සඳහා අරමුදල් සැපයීමේ කටයුතු සිදුකරමින් පවතී.

ඕනෑම රටක ආදිවාසී ජනතාව එම රටට වත්කමක් වන අතර, එය බාහිර ලෝකයේ අවධානය එම සුවිශේෂී රටට යොමු කර ගැනීම සඳහා ඉවහල් වේ. ආදිවාසී ජනතාව එනම් ශ්‍රී ලංකාවේ වැදි ප්‍රජාව වෙත මෙන්ම අප රටටද ප්‍රතිලාභ ගෙන දෙමින් ඔවුන් ජාත්‍යන්තර කරළියට ගෙන ඒමට පසුගිය මාස කිහිපය තුළදී අපට හැකිවිය.

නව ගෝලීය සංචාරක ආකර්ෂණයන් හඳුනාගනිමින් සිටින අතර, ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ හොඳම තේරීම බවට දැනටමත් පත්වී ඇති සංචාරක වෙරළ තීර පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පියවර ගෙන ඇත. පෞරාණික උරුමය පිළිබඳ සංචාරක කර්මාන්තය හා ආධ්‍යාත්මික සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සහ ක්‍රමෝපායන් ද ක්‍රියාත්මක කර ඇත.

වනජීවී රාජ්‍ය අමාත්‍යවරයා ලෙස ධූරය භාර ගැනීමෙන් පසුව,පසුගිය මාස 03 ඇතුළත, අලි-මිනිස් ගැටුම් නතර කිරීමට මෙන්ම වනජීවී සංචාරකයින්ට අවට ඇති හෝටල් පෙන්වන එළිමහන් දැන්වීම් පුවරු ඉදිකිරීම මඟින් එම සංචාරකයින්ගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විවිධ ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතී.

වනජීවී උද්‍යානවල සහ වෙනත් ආසන්න ස්ථානවල සංචාරක පහසුකම් සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කරනු ලබන අතර, වනජීවී උද්‍යාන සඳහා නව ජාත්‍යන්තර ප්‍රවර්ධන වැඩසටහනක් ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

අවසාන වශයෙන් එකී කාර්යයන් පිළිබඳව ලබාදෙන ලද සුවිශේෂී සහ කැපවූ සේවාව සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට හා සියලු අනුබද්ධ ආයතන වලට මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

**රංජිත් අලුවිහාරේ,**

**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය.**



## සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ විවරණය

සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් පසුගිය මූල්‍ය වර්ෂය තුළ ගන්නා ලද ප්‍රයත්න හා ඒවායේ මාහැඟි ප්‍රතිඵල පිළිබඳ සවිස්තරාත්මක වාර්තාව වන, 2018 මූල්‍ය වර්ෂයේ අපගේ කාර්යසාධන වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම සතුටු වෙමි.

සංචාරක කර්මාන්තය අප රටේ ආර්ථිකයට සැබෑ වටිනාකමක් එකතු කරයි. 2018 වර්ෂය ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා ධනාත්මක කාර්යසාධනයක් අත්කරදුන් තවත් සුවිශේෂී වසරකි. ප්‍රගති වාර්තාවට අනුව, 2018 වර්ෂයේදී සංචාරක පැමිණීම් 2,333,796ක් වාර්තා වී ඇති අතර 2017 වසරට සාපේක්ෂව එය 10 3% ක වර්ධනයක් පෙන්නුම් කරයි. දළ සංචාරක ඉපයීම් ආදායම රුපියල් මිලියන 712,027ක් දක්වා ඉහළ ගොස් ඇති අතර 2018 මූල්‍ය වර්ෂය තුළ සෘජු රැකියා 169,003ක් හා ඇස්තමේන්තු කරන ලද වක්‍ර රැකියා 219,484ක් ඇතුළුව චාරිකා හා සංචාරක කර්මාන්තය සම්බන්ධ සමස්ත රැකියා ප්‍රමාණය 388,487 ක් ලෙස වාර්තා වී ඇත. තවද,2018 මූල්‍ය වර්ෂය තුළදී ආදායම් වර්ධනය රුපියල් මිලියන 4,380.60 දක්වා වැඩිවී ඇති බව දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. කෙසේ වුවද, කර්මාන්තයේ තිරසාරත්වය සම්බන්ධයෙන් සාධනීය හා විපර්යාසී බලපෑමක් ඇතිකරන, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා නැගී එන ඩිජිටල් තාක්ෂණය පිළිබඳව අප අවධානය යොමුකළ යුතුය.

වන සත්ව ප්‍රජාවන්ගෙන් සමන්විත වූ පරිසර පද්ධතියේ පැවැත්ම සුරක්ෂිතකොට වත්මන් හා අනාගත පරපුර වෙනුවෙන් වනජීවී උරුමය සංරක්ෂණය කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණු වලින් එකක් වන අතර ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා වනජීවී භාරය මෙම අමාත්‍යාංශයේ වනජීවී අනුබද්ධ ආයතන වශයෙන් ක්‍රියාත්මක වේ.

ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වාගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීමේ දැක්ම තුළින් නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාව උපයෝගී කරගනිමින් දැනට පවතින සත්වෝද්‍යාන තුළ සතුන් කූඩු කිරීමේ ක්‍රමයෙන් පරිබාහිරව සතුන්ට නිදහසේ ගත කිරීමට අවශ්‍ය ඉඩ පහසුකම් සලසා දෙමින් සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව, පින්නවල නව සත්වෝද්‍යානය හා රිදීයගම සෆාරි උද්‍යානය මෙම සංකල්ප අනුව ක්‍රියාත්මක වේ. මහජනතාවට උපරිම සේවයක් ලබාදීමටත්, දේශීය විදේශීය සංචාරකයන් ආකර්ශනය කර ගැනීමටත්, ඔවුන්ගේ රසාස්වාදය සඳහා අවශ්‍ය නවීන පහසුකම් සත්වෝද්‍යාන තුළ සංවර්ධනය කරමින් පවතී. එමෙන්ම වනජීවී භාරය මගින් ද විවිධ පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

මේ වන විට වඳ වීමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධව අන්තර් ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ පාර්ශවකරුවන්ගේ 18 වැනි සමුළුව (CITES) රටවල් 193ක නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් මේ වර්ෂයේ මැයි මස 22 සිට ජුනි මස 3 දින දක්වා ශ්‍රී ලංකාවේ දී පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

තවද, මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම හා රට තුළ ආගමික සහජීවනය ඇතිකිරීම අරමුණු කරගත් ක්‍රිස්තියානි ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සුවිශේෂී කාර්යභාරයක් 2018 වර්ෂයේදී ඉටුකර ඇත.

අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවතින ආයතනවල සමස්ත කළමනාකරණයේදී සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමාගෙන් හා සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය, ගරු රංජිත් අලුවිහාරේ මැතිතුමාගෙන් ලැබුණු නායකත්වය හා නොමසුරු මාර්ගෝපදේශනය සම්බන්ධයෙන් කෘතඥතාවය පළකරමි. තවද, අතිරේක ලේකම්වරු, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය, සියළුම සංචාරක ආයතනවල සභාපතිවරු හා ඔවුන්ගේ සියළුම මට්ටම්වල අදාළ කාර්ය මණ්ඩලය, ක්‍රිස්තියානි ආගමික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලවල කැපවීම හා බැදීමද, රාජ්‍ය හා පුද්ගලික අංශවල අනෙකුත් සියළුම නිලධාරීන් විසින් සමාලෝචනයට ලක්වූ කාල පරිච්ඡේදය තුළදී දක්වන ලද සහයෝගය සහ උපකාරය බෙහෙවින් අගයකරන බව සඳහන් කිරීමට කැමැත්තෙමි.

**එස්. හෙට්ටිආරච්චි**
**ලේකම්,**
**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය.**



## සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්තුමියගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්යයන් සමඟ සමීප හා ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් දැනට ක්‍රියාත්මක දේශීය ව්‍යාපෘති, වැඩසටහන්වල නිරන්තර ප්‍රගතිය සමාලෝචනය කිරීම ,අධීක්ෂණය කිරීම ,ඇගයීම හා ඵලදායීතාවය සහතික කිරීමත් , දැනට දිවයින පුරා පවතින නීත්‍යානුකූල නොවන; අවිධිමත් ,සංචාරක ව්‍යාපාර විධිමත් අංශ බවට පත් කිරීමට කටයුතු කිරීමත්, ඒවායේ සංවර්ධනය හා නියාමනය පිළිබඳව කටයුතු කිරීමත්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ දේශීය සංචාරක ක්‍රියාකාරකම් වර්ධනය කරමින් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දායක වීමත්, මෙහෙයවීමත්, සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමත්, සමාලෝචනයත්, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට පැවරුන කාර්යයන් අතර වේ.

ඒ අනුව, සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් දැනටමත් වැඩසටහන් රාශියක් ආරම්භ කර ඇත. ඒ අතර, දිවයින පුරා පවතින නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පවත්වාගෙන යන සංචාරක ව්‍යාපාරික ආයතන පිලිබඳව තොරතුරු රැස්කිරීම හා ඒවා ලියාපදිංචිය සඳහා යොමු කිරීම, සංචාරක නිවාස, බංගලා, තානායම්වල තත්වය වැඩිදියුණු කිරීමේ පියවරක් වශයෙන් එම නිවාස, බංගලා, තානායම් අධීක්ෂණය හා ඒවා තවදුරටත් දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම, සංචාරක සත්කාරක නිවාස, බංගලා ලියාපදිංචිය තව දුරටත් පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම, මෙරටට පැමිණෙන සංචාරකයින්ට මාර්ගෝපදේශනය සඳහා ගුවන් තොටුපල පරිශ්‍රයේ හා ප්‍රධාන නගරවල අන්තර්ජාතික ප්‍රමිතියට ගැළපෙන අයුරින් ප්‍රදර්ශන පුවරු සකස් කිරීමට අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ලබා ගැනීම සඳහා ගුවන් සේවා අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම , ශ්‍රී ලංකාවේ ජාතික උරුමයන් ආරක්ෂාවන පරිදි සහ ආදිවාසී ජනතාවගේ සංස්කෘතිය විදහා දැක්වෙන පරිදි නිර්මාණය කරනු ලබන සංචාරක ප්‍රවර්ධන වැඩසටහන්, සංස්කෘතික අමාත්‍යාංශය සමඟ එක්ව සංවිධානය කිරීම තුළින්, ආදිවාසී ජනතාව ජීවත්වන ප්‍රදේශවල සාමාන්‍ය ජනතාවගේද ජීවන මට්ටම ඉහළ නැංවීම හා දෙස් විදෙස් සංචාරක ආකර්ශනය එම ප්‍රදේශවලට රැගෙන යාමට කටයුතු කිරීම, දැනට රාජ්‍ය අමාත්‍යාංශය ආරම්භ කර ඇති ව්‍යාපෘති, වැඩසටහන් අතුරින් කිහිපයකි. මීට අමතරව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ආයුර්වේද දෙපාර්තමේන්තුව හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති රාශියකි .

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන ප්‍රධාන මාර්ගයක් වශයෙන් සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛස්ථානයක් ගනී. එබැවින් නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාව “ගෝලීය සංචාරක මධ්‍යස්ථානයක්” ලෙස වර්ධනය කර ගැනීම අරමුණු කරගනිමින් තම කටයුතු මෙහෙයවීම සංචාරක ව්‍යාපාරයේ නියැලෙන රාජ්‍ය අංශ මෙන්ම පෞද්ගලික අංශවල සියළු දෙනාගේම වගකීමද වන්නේය. ඒ අනුව, සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රමිතීන් හා ඉලක්ක සපුරා ගැනීම සඳහා මේ වන විට සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියළු රාජ්‍ය ආයතන විසින් දරනු ලබන උත්සාහය බෙහෙවින් අගය කළ යුතු වේ. ශ්‍රී ලංකාව, ආසියාවේ විශිෂ්ටතම සංචාරක ගමනාන්තයක් බවට පරිවර්තනය වෙමින්, ලෝකයේ “විශිෂ්ටතම දූපත” බවට පත් කිරීම සඳහා අවශ්‍ය සියළු කටයුතු සම්පාදනය කිරීම, සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් කටයුතු කරන අප සැමගේ වගකීම වන්නේය .

**පී.පී.කේ.අබේසිරිගුණවර්ධන**
**රාජ්‍ය ලේකම්**
**සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

## අමාත්‍යාංශය

**ගරු ජෝන් ඒ. ඊ. අමරතුංග මැතිතුමා (පා.ම.)**
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය

**ගරු රංජිත් අලුවිහාරේ මැතිතුමා (පා.ම.)**
සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍ය

**එස්. හෙට්ටිආරච්චි මහතා**
ලේකම්, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

**පී. පී. කේ. අබේසිරිගුණවර්ධන මහත්මිය**
රාජ්‍ය ලේකම්, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

**සංචාරක අංශය**

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර මහතා
අතිරේක ලේකම් ( සංවර්ධන)

ඩී. එල්. සන්නසූරිය මෙය
අතිරේක ලේකම්
( පරිපාලන, ක්‍රිස්තියානි ආගමික කටයුතු)

එස්. එල්. එම්. හසීම් මහතා
අධ්‍යක්ෂ ( සංවර්ධන)

සුනන්දා පියසීලි මෙය
ප්‍රධාන අභ්‍යන්තර විගණක

උමා නිරන්ජනන් මෙය
අධ්‍යක්ෂ (සැලසුම්)

කේ. එම්. සී. කේ. බණ්ඩාර මහතා
ප්‍රධාන ගණකාධිකාරී

සී. එච්. ගමගේ මහතා
ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්

**වනජීවී අංශය**

පී. එච්. ආනන්ද මහතා
අතිරේක ලේකම් ( පරිපාලන)

එච්. ඩී. රත්නායක මහතා
අතිරේක ලේකම් ( කාර්මික)

එම්. එම්. එස්. එස්. බී. යාලේගම මහතා
අතිරේක ලේකම් (තිරසාර සංවර්ධන)

කුමාරසිරි පෙරේරා මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

ඩබ්. ඒ. විජේරත්න මෙය
අධ්‍යක්ෂ (සැලසුම්)

ජී. පී. සපුතන්ත්‍රී මහතා
අධ්‍යක්ෂ (තිරසාර සංවර්ධන)

ඩී. සී. සිරිබද්දන මහතා
අධ්‍යක්ෂ (සංවර්ධන)

| සංචාරක අංශය | වනජීවී අංශය |
|---|---|
| කේ. ඩී. ඩී. පීරිස් මෙය<br>සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | ජේ.ඩී.ඒ.පී.ජයසිංහ මෙය<br>ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ජී.ඩී.පී.මුනිදාස මහතා<br>සහකාර අධ්‍යක්ෂ ( සැලසුම්) | ජේ. කේ. ඩී. නිලන්ති මෙය<br>ප්‍රධාන ගණකාධිකාරී |
| ප්‍රසාදිකා බස්නායක මෙය<br>සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | එම්. ඒ. පී. අයි. ගුණවර්ධන මහතා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| කල්පනී චන්දිමා මෙය<br>සහකාර ලේකම් (පාලන) | ටී. ජී. එම්. යූ. ප්‍රියංගිකා මෙය<br>සහකාර අධ්‍යක්ෂ ( සැලසුම්) |
| ඩී.එච්.ආර්.එම්.එම්.අබේවර්ධන මෙය<br>සහකාර ලේකම් (පාලන) | ඩබ්. එම්. වී. එම්. වනිගසේකර මෙය<br>සහකාර අධ්‍යක්ෂ ( සැලසුම්) |
| ආර්.එම්.ප්‍රසන්න ප්‍රියදර්ශන මහතා<br>සහකාර අධ්‍යක්ෂ ( සංවර්ධන) | එල්. එස්. එස්. අභයවික්‍රම මෙය<br>සහකාර අධ්‍යක්ෂ ( සැලසුම්) |
|  | එම්. ඩී. එම්. කුමුදුනී මෙය<br>සහකාර ලේකම් (පාලන) |

# 1.

# සංචාරක සංවර්ධන අංශය



# 1. සංචාරක සංවර්ධන අංශය

## 1.1 2020 වර්ෂය සඳහා උසස් මට්ටමේ අරමුණු

- 2020 වර්ෂයේදී උපයා ගැනීමට අපේක්ෂිත ඇ. ඩො. බිලියන 7 ක ඉලක්කය සමගින් ශ්‍රී ලංකාවේ තුන්වැනි ශුද්ධ විදේශ විනිමය උත්පාදනය කරනු ලබන ක්ෂේත්‍රය සංචාරක කර්මාන්තය විය යුතුය.
- සංචාරක කර්මාන්තය සහ එහි සහායක කර්මාන්ත විසින් ශ්‍රී ලාංකිකයන් 600,000 ක් සේවයේ යොදවා ගත යුතුය.
- එක් සංචාරකයෙකු විසින් දෛනිකව වියදම් කරනු ලබන මුදල ඇ.ඩො. 210 දක්වා ඉහළ නැංවීම.

## 1.2 සංචාරක කාර්යසාධනය- 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා

වගුව - 1.1

| සංචාරක පැමිණීම් (ගණන) | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (ගණන) | 1,274,593 | 1527153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 2,333,796 |
| විනෝදය | 980,162 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 1,744,149 | N/A |
| ව්‍යාපාරික | 94,320 | 29,381 | 23,323 | 37,121 | 70,683 | N/A |
| වෙනත් | 200,111 | 460,128 | 576,817 | 303,684 | 301,575 | N/A |
| සංචාරක අමුත්තන්ගේ රාත්‍රී ('000) | 10,961 | 15,119 | 18,163 | 20,918 | 23,068 | 25,205 |
| කාමර වෙන් කිරීම් ප්‍රමාණය (%) | 71.7 | 74.3 | 74.5 | 74.76 | 73.27 | N/A |
| දළ සංචාරක ආදායම (රු. මිලි.) | 221,720 | 317,502 | 405,492 | 512,594 | 598,356 | 712,027 |
| මුළු රැකියා (ගණන) | 270,150 | 299,890 | 319,436 | 335,659 | 359,215 | 388,487 |
| සෘජු රැකියා | 112,550 | 129,790 | 135,930 | 146,115 | 156,369 | 169,003 |
| ඇස්තමේන්තුගත වක්‍ර රැකියා | 157,600 | 170,100 | 183,506 | 189,544 | 202,846 | 219,484 |
| N/A දත්ත සකස්කර අවසන් නැත | | | | | | |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 1.3 සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රමුඛතම වෙළඳපොළ 10


වගුව - 1.2

| රට | 2017 | 2018 | % |
|---|---|---|---|
| ඉන්දියාව | 384,628 | 424,887 | 10% |
| එක්සත් ජනපදය | 201,879 | 254,176 | 26% |
| චීනය | 268,952 | 265,965 | -1% |
| ජර්මනිය | 130,227 | 156,888 | 20% |
| ඕස්ට්‍රේලියාව | 81,281 | 110,928 | 36% |
| රුසියාව | 59,191 | 64,497 | 9% |
| ප්‍රංශය | 97,282 | 106,449 | 9% |
| ඇමරිකා එක්සත් ජනපදය | 57,479 | 75,308 | 31% |
| ස්වීඩනය | 24,275 | 28,267 | 16% |
| සවුදි අරාබිය | 35,481 | 34,703 | -2% |
| **සමස්ත පැමිණීම** | **2,116,407** | **2,333,796** | **10.3%** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 1.4 විදේශ විනිමය උපයන්නකු ලෙස සංචාරක ව්‍යාපාරයේ වර්ධනය (ඇ.ඩො.මිලියන)

ප්‍රස්තාරය - 1.1




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

## 1.5 . අමාත්‍යාංශයේ සංචාරක සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ විශාලතම ශක්තිය රඳාපවතින්නේ එහි ඇති ස්වාභාවික සම්පත්වල සුවිශේෂී විවිධත්වය, පෞරාණික හා අද්‍යතන සංස්කෘතිය, සමෘද්ධිමත් ඉතිහාසය සහ මිත්‍රශීලී ජනතාවයි මතය.

ශ්‍රී ලංකාව ඒකාබද්ධ සංචාරක ගමනාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් තිරසර සංචාරක ගමනාන්ත ඵලදායි ලෙස ගොඩනැඟිය හැකි සංචාරක සැලසුම්කරණ ආකෘතියක් සහ ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සම්බන්ධ ක්‍රියාවලියක නිරත වී සිටී. සම්පත් ඉහළම ප්‍රතිලාභ ලබාගත හැකි අංශ වෙත මෙන්ම සියලුම මට්ටම්වල රජයේ ආයතන සඳහා (ජාතික,පළාත්,ප්‍රාදේශීය හා නාගරික) යොමුකල හැකි හෙයින් සංචාරක සැලසුම්කරණය විශේෂයෙන් වැදගත්වේ.

2018 අයවැය අනුව, සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සංචාරක සංවර්ධන වැඩසටහන් හතක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 845.00 ක මුදලක් වෙන් කර ඇත.

එවැනි ව්‍යාපෘතිවල විස්තර පහත දැක්වේ.

**සංවර්ධන ව්‍යාපෘති -2018** **වගුව: 1.3**

| අංකය | සංවර්ධන ව්‍යාපෘති | ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| | **අයවැය ප්‍රතිපාදන** | | | |
| 01 | සංචාරක ආකර්ෂණය සංවර්ධනය කිරීම | 375.00 | 390.00* | 256.83 |
| 02 | සංචාරක මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම | 40.00 | 40.00 | 31.65 |
| 03 | ප්‍රජා සංචාරක සංවර්ධනය (සංචාරක ගම්මාන සංවර්ධනය) | 25.00 | 10.00 | 2.19 |
| 04 | ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශවල සංචාරක පොලිසි ව්‍යාප්ත කිරීම | 30.00 | 30.00 | 0.012 |
| | **එකතුව** | 470.00 | 470.00 | 290.67 |
| | **විශේෂ අයවැය යෝජනා** | | | |
| 06 | සංචාරක හිතකාමී "ටුක් ටුක්" වැඩසටහන | 50.00 | 50.00 | 1.11* |
| 07 | බළකොටු 06 ක් සංවර්ධනය කිරීම | 250.00 | 250.00 | 3.77 |
| 08 | දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සහ ඒවා පුරාවිද්‍යාත්මක ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීම | 75.00 | 75.00 | 35.538 |
| | එකතුව | 375.00 | 375.00 | 40.418 |
| | **මුළු එකතුව** | **845.00** | **845.00** | **331.088** |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

**අතැති බිල්පත්*

### 1.5.1 සංචාරක ආකර්ෂණය සංවර්ධනය කිරීම

මෙම අමාත්‍යාංශය අන්තර් සම්බන්ධිත හා ඌනපූරක කලාපීය හා දේශීය ගමනාන්ත වලින් ගොඩනැංවීය යුතුවන සාර්ථක හා තිරසර සංචාරක කර්මාන්ත සඳහා ගමනාන්ත පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගණනාවක් ගෙන ඇත. මෙම ගමනාන්ත කාලයත් සමග ඒවායේ අද්විතීය විකුණුම් ප්‍රස්තුතය අර්ථ දක්වා ඇත. ඔවුන්ගේ ඉල්ලුම් හා සැපයුම් ගතිකතාවයන්ට ගැළපෙන පරිදි ඔවුන් ආකර්ෂණය, පොදු පහසුකම්, ප්‍රවේශ මාර්ග, මානව සම්පත්, ප්‍රතිරූපය සහ මිලගණන් ද ඒකාබද්ධ කර ඇත.

මෙම තත්ත්වය හේතුවෙන්, පළාත්වල සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 අයවැය යටතේ රු.මි. 390.00ක මුදලක් වෙන් කර ඇත.

**ව්‍යාපෘතියේ අරමුණු:**

- ග්‍රාමීය ප්‍රදේශවල සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුකරන සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනයක් තහවුරු කිරීම.
- ග්‍රාමීය ප්‍රජාවේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ග්‍රාමීය සංචාරක සංවර්ධන උපාය මාර්ග ඒකාබද්ධ කිරීම.
- ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම සහ කුඩා ව්‍යවසායකයින් හා වාණිජ මෙහෙයුම් කරුවන් සඳහා ආදායම් මූලාශ්‍ර වැඩි කිරීම.
- සංචාරකයින් සංඛ්‍යාව වැඩි කිරීම සහ දේශීය ආර්ථිකය තුළ මුදල් වියදම් කිරීම සඳහා සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම.
- විවිධ සංස්කෘතීන් හා ඒවායේ උරුමය පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

### 1.5.1.1. සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති සංවර්ධනය

මෙම අමාත්‍යාංශය හඳුනාගත් සංචාරක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ රාජ්‍ය ආයතන සමඟ එක්ව කටයුතු කරමින් සිටී.

**විස්තර පහත පරිදි වේ.** **වගුව: 1.4**

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | | | | |
| 1 | නුවර වැව් බැම්මේ පයින් ගමන්කරන්නන් සහ පාපැදිකරුවන් සඳහා මංතීරුවක් ඉදි කිරීම | 2.80 | 2.80 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත් සභාව |
| 2 | ඉසුරුමුණි විහාරයේ සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදි කිරීම | 10.28 | 10.28 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් සභාව |
| 3 | කුට්ටම් පොකුණ සහ සමාධි පිළිමය අතර වාහන නැවතුම ආසන්නයේ සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදි කිරීම- අනුරාධපුරය | 7.03 | 7.03 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් සභාව |
| | උප එකතුව | **20.11** | **20.11** | | |

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| | **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| **4** | මැදිරිගිරිය වටදාගෙය අසල පොකුණ අවට සංවර්ධනය කිරීම-පොළොන්නරුව | 13.43 | 13.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් සභාව |
| | **උප එකතුව** | **13.43** | **13.43** | | |
| | **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| **5** | ආරච්චිකට්ටුව විවේක ස්ථානය වටා වැට සකස් කිරීම - පුත්තලම | 5.67 | 5.65 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **6** | අංගම්පිටිය හන්දිය සිට අලුත්තොට හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 0.77 | 0.599 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **7** | කම්මල පාලම සිට වෙරළ දක්වා සංවර්ධනය කිරීම | 1.55 | 1.25 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **8** | මානවේරිය විවේක කාමරය අසල මාර්ගය සහ වාහන නැවතුම සංවර්ධනය කිරීම | 5.52 | 4.63 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **9** | වෛක්කාල ප්‍රදේශයේ ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම - පුත්තලම | 4.58 | 4.58 | ක්‍රියාත්මකවෙමින් පවතී | ලංකා විදුලිබල මණ්ඩලය |
| **10** | පුත්තලම වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීම | 9.14 | 8.66 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **11** | ඉරණවිල වෙරළ සංවර්ධනය කිරීම | 0.06 | 0.06 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| **12** | කල්පිටිය තුරෙරඅඩි මාර්ගය සංවර්ධනය කිරීම | 33.52 | 11.40 | ක්‍රියාත්මක වෙමින් පවතී - 52% | දිස්ත්‍රික් ලේකම් පුත්තලම |
| | **උප එකතුව** | **60.81** | **36.83** | | |
| | **මහනුවර දිස්ත්‍රික්කය** | | | | |
| **13** | ගඩලාදෙණිය පූජා භූමියේ පෙරහැර මාවත කාපට් අතුරා සංවර්ධනය කිරීම | 15.43 | 15.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| **14** | නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය | 2.50 | 0.79 | ක්‍රියාත්මක වෙමින් පවතී - 40% | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| **15** | ගඩලාදෙණිය රජමහා විහාරස්ථානය ආශ්‍රිතව සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - අදියර 111 - මහනුවර | 7.25 | 7.25 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| | **උප එකතුව** | **25.18** | **23.47** | | |
| | **කෑගල්ල දිස්ත්‍රික්කය** | | | | |
| **16** | බතලේගල පර්වතය ආශ්‍රිත සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම | 2.70 | 2.63 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| **17** | රුවන්වැල්ල පෙතන්ගොඩ කටු උණ පඳුර සහිත ප්‍රදේශය දක්වා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම | 7.96 | 1.75 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කෑගල්ල |
| | **උප එකතුව** | **10.66** | **4.38** | | |
| | **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | |
| **18** | හැටන් දුම්රිය ස්ථානය සංවර්ධනය කිරීම සහ සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම | 3.59 | 0.50 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| **19** | සංචාරක ආකර්ෂණීය ස්ථානයක් වශයෙන් ග්‍රෙගරි වැව සංවර්ධනය කිරීම - පියවර IV- නුවරඑළිය | 38.18 | 38.18 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| **20** | කොත්මලේ මහවැලි මහා සෑය සංවර්ධනය කිරීම - නුවරඑළිය | 43.40 | 10.50 | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| **21** | හැටන් දුම්රිය ස්ථානයේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයක් සඳහා උපකරණ මිලදී ගැනීම | 0.17 | 0.17 | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| | **උප එකතුව** | **85.34** | **49.35** | | |
| | **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| **22** | ඓතිහාසික යාපහුව පුරාණ රජමහා විහාරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | 10.64 | 10.64 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| 23 | ඓතිහාසික රිදී විහාරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | 9.11 | 9.11 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 24 | අරන්කැලේ භාවනා මධ්‍යස්ථානය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 5.99 | 5.99 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 25 | පඬුවස්නුවර පුරා විද්‍යා ස්ථානය සඳහා පුරාවිද්‍යා පුවරු සවිකිරීම | 1.48 | 1.48 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 26 | රම්බඩගල්ල මොනරාගල විහාරය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 16.51 | 11.14 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 27 | කට්ටිමහන ශාන්ත ආනා දේවස්ථානයෙහි විවේක ස්ථානයක් ඉදිකිරීම | 21.72 | 6.28 | ක්‍රියාත්මකවෙමින් පවතී -70% | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 28 | පාදෙණිය නගරයේ විවේක ස්ථානයක් ඉදිකිරීම | 3.12 | 0.63 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| | **උප එකතුව** | **68.57** | **45.27** | | |
| | **යාපනය දිස්ත්‍රික්කය** | | | | |
| 29 | කිරිමලේ ඇඳුම් මාරු කිරීමේ කාමරය ප්‍රතිසංස්කරණය | 1.77 | 1.77 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |
| 30 | පොදුවාහන නැවැත්වීමේ පහසුකම් හා අක්කරෙයි වෙරළේ සෙවණ සහිත කුටි ඉදි කිරීම | 2.64 | 2.64 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |
| 31 | මාවට්ටපුරම් කන්දස්වාමි දේවාලයේ වන්දනාකරුවන් සඳහා විවේක ශාලාවක් ඉදිකිරීම | 1.69 | 1.66 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් යාපනය |
| 32 | ඩෙල්ෆ්ට් දූපතේ මනල්තුරෙයි පිහිටි විවේක ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගෘහ භාණ්ඩ සහ උපකරණ සැපයීම. (අදියර-ii) | 1.53 | 1.53 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |
| 33 | කන්තරෝඩායිවිල හා ඒ ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ආකර්ෂණීය ප්‍රදේශයක් ලෙස ඉදි කිරීම | 5.45 | 4.50 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් යාපනය |

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| **34** | යාපනය දූපත් ආශ්‍රිතව පාරිසරික සංචාරක මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම (අදියර-ii) | 26.32 | 25.75 | ක්‍රියාත්මකවෙමින් පවතී -90% | දිස්ත්‍රික් ලේකම් යාපනය |
| | **උප එකතුව** | **39.39** | **37.85** | | |
| | **මාතර දිස්ත්‍රික්කය** | | | | |
| **35** | දෙනියාය සත්මහල් ඇල්ල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම . අදියර I සහ ii (කි.මී. 0.459 ක්වූ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම) | 3.60 | 2.96 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| | **උප එකතුව** | **3.60** | **2.96** | | |
| | **ගාල්ල දිස්ත්‍රික්කය** | | | | |
| **36** | අකුරල වෙරළ තීරයේ සනීපාරක්ෂක පහසුකම් සපයන ජංගම සේවා ඒකකයක් ස්ථාපිත කිරීම | 0.81 | **0.69** | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| **37** | අම්බලන්ගොඩ මාදම්පාවිල අභය භූමිය අසළ පාරිසරික සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම සහ ගොඩහේන පාවෙන ජැටි ඉදි කිරීම | 4.43 | 2.01 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| | **උප එකතුව** | **5.24** | **2.70** | | |
| | **රත්නපුර දිස්ත්‍රික්කය** | | | | |
| **38** | බටතොටලෙන දේවගුහාව ආශ්‍රිතව ජලය සැපයීම සහ සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම -රත්නපුර | 0.23 | 0.23 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| **39** | උඩවලව ජාතික උද්‍යානයේ හදගිරිය පිවිසුම් මාර්ගය මතුපිට (කි.මී.15) කැළය එළි කිරීම සහ සංවර්ධනය කිරීම -රත්නපුර | 1.28 | 1.46 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| **40** | බෝපත් ඇල්ල ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම (ඒකාබද්ධ සැලැස්මක් සකස් කිරීම) | 1.79 | 1.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| **41** | බටතොට ප්‍රවේශ මාර්ගය අසල ඇඳුම් මාරු කරන කාමරය ඉදිකිරීම | 1.00 | 1.00 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |

| අ.අ. | ව්‍යාපෘතියේ නම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු. මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| **42** | කුරුවිට බෝපත් ඇල්ල ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම (වාහන නැවතුම්පළ අසල) | 6.01 | | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| | **උප එකතුව** | **10.31** | **4.12** | | |
| | **මඩකලපුව දිස්ත්‍රික්කය** | | | | |
| **43** | එරාවුර් කලපු ප්‍රදේශය අලංකරණය හා ප්‍රවර්ධනය කිරීම - මඩකලපුව | 3.05 | 3.05 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් නැගෙනහිර පළාත් සභාව |
| **44** | එරාවුර්පත්තු වෙරළ තීරය සංවර්ධනය කිරීම | 9.45 | 9.45 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව |
| | **උප එකතුව** | **12.50** | **12.50** | | |
| | **බදුල්ල දිස්ත්‍රික්කය** | | | | |
| **45** | රාවනා ඇල්ල සංචාරක පහසුකම් සහ නැරඹුම් වේදිකාව සංවර්ධනය කිරීම | 12.01 | | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධානලේකම් ඌව පළාත් සභාව |
| | **උප එකතුව** | **12.01** | **0.00** | | |
| | **අම්පාර දිස්ත්‍රික්කය** | | | | |
| **46** | ලාහුගල මගුල් මහා විහාරයෙහි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 3.79 | 1.44 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් අම්පාර |
| | **උප එකතුව** | **3.79** | **1.44** | | |
| | **මාතලේ දිස්ත්‍රික්කය** | | | | |
| **47** | සීගිරිය හෝටලය හන්දියෙහි සිට දියකැපිල්ල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 2.49 | 2.48 | ක්‍රියාත්මක වෙමින් පවතී | දිස්ත්‍රික් ලේකම්, මාතලේ |
| | **උප එකතුව** | **2.49** | **2.48** | | |
| | **මුළු එකතුව** | **373.24** | **256.90** | | |

**විශේෂ අවස්ථා**



ගොඩහේන පහසුකම් මධ්‍යස්ථානය අම්බලන්ගොඩ, ගාල්ල



අම්පාර, ලාහුගල මඟුල්මඩු විහාරය සංවර්ධනය



යාපනය කන්තොරඩෙයි සංචාරක ස්ථාන ඉදිකිරීම



රුවන්වැල්ල, පෙතන්ගොඩ කටු උණ පඳුරු වෙත යන ප්‍රවේශ මාර්ගය සංවර්ධනය



මහනුවර, ගඩලාදෙණිය පෙරහැර මාර්ගය සංවර්ධනය



කුරුණෑගල විවේක ස්ථාන ඉදිකිරීම



යාපනය, කීරමලෛ විවේක කාමර සංවර්ධනය කිරීම



මනවේරිය විවේක කාමර අසල රථවාහන නැවතුම්පොළ සංවර්ධනය කිරීම



මහනුවර නෙල්ලිගල සනීපාරක්ෂක පහසුකම්

## 1.5.2. ප්‍රජා ගම්මාන සත්කාරක නිවාස

### 1.5.2.1. හැඳින්වීම

ස්වභාව ධර්මය, කෘෂි ආර්ථිකය සහ වෙරළබඩ සංචාරක කර්මාන්තය හා බද්ධව පවතින සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ජන ජීවිතය ස්පර්ශ කරන ප්‍රජා ගම්මාන සත්කාරක නිවාස සංකල්පය ග්‍රාමීය සමාජයේ නිදන්ගත චින්තනය සමඟ යමින් සුවිශේෂී අව්‍යාජ සාම්ප්‍රදායික අත්දැකීමක් ලබාදේ.

මෙම සත්කාරක නිවාසවල නවාතැන් ගන්නා සංචාරකයින්ට ග්‍රාමීය ජීවිතය ස්පර්ශ කිරිමට සහ එහි රසය අත්විඳීමට අවස්ථාව සලසන දේශීය චාරිත්‍ර, වටිනාකම් සහ සංස්කෘතීන් අත්විඳිමින් පවුල සමඟ ගුණාත්මක කාලයක් ගත කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇත. සත්කාරක නිවාස මගින් සංචාරකයින්ට සුවිශේෂී දේශීය අත්දැකීමක් සපයන අතර සත්කාරක පවුල සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීමට අවස්ථාවක්ද සැපයේ. මෙම සත්කාරක නිවාස සංචාරකයින්ට නව සංචාරක ස්ථාන අත්විඳීමට අවස්ථාවක් සපයනවා පමණක් නොව රජයට සංචාරක ගමනාන්ත ප්‍රචලිත කිරීම සඳහාත් ග්‍රාමීය ජනතාවට විකල්ප ආදායම් මාර්ගයක් ලබා දීම සඳහාත් හැකියාව ද ලබාදේ.

### 1.5.2.2. භෞතික ප්‍රගතිය

ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී, අමාත්‍යාංශය විසින් ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පහක්, උපකරණ සහිත පිළිගැනීම් මධ්‍යස්ථාන දෙකක්, ප්‍රවර්ධන අත්පොත්, සංඥා පුවරු සවිකිරීම, ගම්මානවල පිළිගැනීමේ පුවරු සවිකිරීම, වීඩියෝ දර්ශන පට සහ වෙබ් අඩවි සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබීය.

### 1.5.2.3. මූල්‍ය කාර්යසාධනය

වගුව: 1.5

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අනුමත අයවැය | රු.මි.10 |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.2.19 |

### 1.5.2.4. ප්‍රධාන අභියෝග

- සත්කාරක නිවාස සංකල්පය පිළිබඳව ප්‍රජා දැනුවත්භාවය හිඟවීම
- පළාත් සහ දේශීය මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නන් අතර අන්තර් පුද්ගල සම්බන්ධීකරණය හීනවීම
- ව්‍යාපෘති අලෙවිකරණ ක්‍රියාකාරකම් වල අඩු ක්‍රියාකාරිත්වය



මධ්‍යම පළාතේ හීලිඔය



වයඹ පළාතේ යාපහුගම.

### 1.5.3. සංචාරක මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය භාවිතා කරන,ඉහළ මට්ටමේ පුහුණු ශ්‍රම බලකායක් සහිත සංචාරක ක්ෂේත්‍රයක් නිවැරදි රැකියාවක් සඳහා නිවැරදි පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වේ. ශ්‍රී ලංකාව ඉහළ වටිනාකමකින් යුත් ගමනාන්තයක් බවට පත්වීම සඳහා මෙය අතිශය වැදගත්වේ. සංචාරක හා සත්කාරක සේවා ක්ෂේත්‍රයේ දැවැන්ත වර්ධනයක් මඟින් රැකියා අවස්ථා හා වෘත්තීය අවස්ථා ඇති කරවන අතර ශ්‍රී ලාංකිකයන්ගේ නෛසර්ගික ආගන්තුක සත්කාරක ගුණාංගය ද වර්ධනය කර ගත හැකිය.

#### 1.5.3.1 ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහන

2018 වර්ෂයේ දී රැකියා විරහිත තරුණ තරුණියන් 2200 ක් සත්කාරක අංශයේ පුහුණු කිරීම සඳහා රුපියල් මිලියන 36.5 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙම සත්කාරක සේවා පිළිබඳ පුහුණු වැඩසටහන් පළාත් සභා, පෞද්ගලික හෝටල් පාසල් හා පුද්ගලික හෝටල්වල සහයෝගිතාවෙන් ක්‍රියාත්මක කර ඇත. මෙය පෙරටු කාර්යාල කළමනාකරණය, ආපනශාලා හා බීමහල් කළමනාකරණය හා ගෘහ පාලන කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකින් සමන්විත පාඨමාලාවකි. තවද මෙම පාඨමාලාව මඟින් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ඉංග්‍රීසි කතාව, ජීවන කුසලතා, යහපත් සන්නිවේදනය, සිල්ලර වෙළෙඳාම හා පාරිභෝගික සේවා පිළිබඳ පුළුල් දැනුමක් ලබාදේ. මෙහි විෂය මාලාව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනය (SLITHM) විසින් සකස් කරන ලද අතර ඇගයුම් හා විභාගද එම ආයතනය විසින්ම සිදුකරන ලදී.

සිසුන්ට වටිනාකම් එකතු කළ පුහුණුවක් මෙන්ම වෘත්තීය සංවර්ධනය පිළිබඳව මාර්ගෝපදේශනයක් ද ලබා දෙන ලදී. මෙහි සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය අමාත්‍යාංශය විසින් පවත්වන ලදි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනය විසින් නිකුත්කරන පිළිගැනීමේ සහතිකය හෝටල් ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය රැකියා අවස්ථා පහසුවෙන් ලබාගැනීමට උපකාරී වේ.

**අරමුණු:-**

1. හොඳින් පුහුණුවලත් සේවකයින් සමඟ සත්කාරක කර්මාන්තයට අවශ්‍ය ශිල්පීන් සැපයීම.
2. සත්කාරක සේවා කර්මාන්තයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.
3. රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා ලබා දීම.
4. ආගන්තුක සත්කාර පුහුණුව සඳහා කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම සහ ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම.

**ජයග්‍රහණය :- ( 2018.12.31 දක්වා)**

- අවන්හල් සහ බීමහල් සේවා පිළිබඳව තරුණ තරුණියන් 1724 ක් පුහුණු කරන ලදී.
- ගෘහ කළමනාකරණය පිළිබඳව තරුණ තරුණියන් 252 ක් පුහුණු කරන ලදී.
- පෙරටු කාර්යාල කළමනාකරණය පිළිබඳව තරුණ තරුණියන් 231 ක් පුහුණු කරන ලදී.

**ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සාරාංශයක්- (2018.12.31)** වගුව 1.6

| | පළාත | පාඨමාලාව | | | | මුළු බැඳීම් (රු.මි) | 2018.12.31 දක්වා සත්‍ය වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| | | ආපන ශාලා සේවය | ගෘහ පාලනය | පෙරටු කාර්යාල | එකතුව | | |
| 1 | සබරගමුව | 40 | 0 | 40 | 80 | 1.20 | 8.25 |
| 2 | දකුණු | 95 | 55 | 40 | 190 | 2.85 | 2.34 |
| 3 | උතුරු මැද | 662 | 177 | 0 | 839 | 12.585 | 12.345 |
| 4 | උතුරු | 37 | 0 | 40 | 77 | 1.155 | 0.96 |
| 5 | නැගෙනහිර | 41 | | | 41 | 0.615 | 0.615 |
| 6 | මධ්‍යම | 184 | 0 | 0 | 184 | 2.76 | 2.325 |
| 7 | බස්නාහිර | 445 | 0 | 111 | 556 | 8.34 | 7.725 |
| 8 | වයඹ | 220 | 20 | 0 | 240 | 3.60 | 3.48 |
| | පරිපාලන වියදම් | | | | | | 2.066 |
| | **එකතුව** | **1724** | **252** | **231** | **2207** | **33.105** | **32.68** |

*මූලාශ්‍රය: සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය*







**ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සහතික පත් ප්‍රදානෝත්සවය 2018**







### 1.5.3.2. සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන

මෙම අමාත්‍යාංශය දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ සේවා සැපයුම්කරුවන්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා සංචාරක මානව ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන යටතේ තෙදින පුහුණුවක් පැවැත්වීම ආරම්භ කර ඇත.

සංචාරක සේවා සපයන්නන් සඳහාවන හැකියා වර්ධන වැඩසටහන විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් පළාත් සංචාරක ආයතන සමඟ එක්ව පවත්වනු ලැබේ. මෙම පුහුණු වැඩසටහන සඳහා රු.මි. 3.5ක් වෙන් කර ඇත. සේවා සපයන්නන් 1,500 ක් පුහුණු කිරීමට අපේක්ෂා කරන ලදි.

සංචාරක සේවා සපයන්නන්ගේ හැසිරීම් හා සේවා කුසලතාවෙන් වැඩිදියුණු කිරීමේ අරමුණු සපුරා ගැනීම සඳහා මෙම වැඩසටහන සකස් කරන ලදී.

**ඉලක්ක කණ්ඩායම:**

ප්‍රවාහන පහසුකම් සපයන්නන් (කුලී රථ රියදුරන්, පුද්ගලික ප්‍රවාහන සේවා සපයන්නන්); සංචාරක සාප්පු හිමිකරුවන්, කළමනාකරුවන්, වෙළඳුන්; කුඩා හා ක්ෂුද්‍ර නවාතැන් සපයන්නන් (ආගන්තුක නිවාස හිමියන්, සත්කාරක නිවාස හිමියන්, තරුණ නේවාසිකාගාර ක්‍රියාකරුවන්, සහ වීදි, නගර සහ විශේෂ ස්ථානවල සංචාරක වෙළෙන්දන්).

**අරමුණු**

1. සංචාරක කර්මාන්තය සඳහා බිම් මට්ටමේ සංචාරක පාර්ශවකරුවන් අතර ඇතිවන වෙනස්කම් ඉවත් කිරීම
2. සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම හා එමඟින් රටේ පවත්නා හා නැඟී එන ප්‍රදේශවල තරුණ තරුණියන් සඳහා ඇති අවස්ථා වර්ධනය කිරීම
3. සංචාරකයන්ගේ සංවේදනය හා තෘප්තිය ඉහළ නැංවීම සඳහා පහසුකම් හා සංචාරක සේවාවන්ගේ ගුණාත්මක භාවය හා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම

**සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන (තෙදින) - 2018** වගුව- 1.7

| පළාත | වෙන්කිරීම (රු.මි) | වියදම(රු.මි) | පුහුණු කරන ලද සංචාරක සේවා සපයන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර පළාත | 0.79 | 0.511 | 210 |
| දකුණු පළාත | 0.3 | 0.172 | 40 |
| උතුරු පළාත | 0.27 | 0.219 | 100 |
| උතුරු මැද පළාත | 0.53 | 0.147 | 70 |
| මධ්‍යම පළාත | 0.53 | 0.486 | 209 |
| වයඹ පළාත | 0.27 | 0.252 | 135 |
| **මුළු එකතුව** | **2.75** | **1.787** | **764** |

*මූලාශ්‍රය: සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය*





## 1.5.4. දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සහ ඒවා පුරාවිද්‍යාත්මක ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීම

ශ්‍රී ලංකාවේ දුම්රියෙන් සංචාරය කිරීම සංචාරකයන්ට ඉතා විනෝදජනක සංචාරක විකල්පයක් වන අතර එය රටේ ස්වාභාවික සෞන්දර්යය ගවේෂණය කිරීමේ හොඳම මාර්ගයයි. ශ්‍රී ලංකා දුම්රිය සේවය මෙරට සංචාරක කර්මාන්තයේ ශක්තිය වැඩි කිරීම සඳහා විශාල විභවතාවක් දරයි. දුම්රිය යටිතල පහසුකම් ඉතා පැරණි වන අතර සේවාව තරමක් මන්දගාමී වන නමුත් දුම්රිය බොහෝ විට ඉතා දර්ශනීය මාර්ගවල ගමන් කරයි. සමහර අවස්ථාවල දී ඉඩ ඇහිරුණු පටු මහා මාර්ගවල ගමනාගමනයට වඩා දුම්රිය ගමනාගමනය වේගවත්ය. ගරු මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2018 අයවැය කථාවේ සඳහන් වන්නේ දුම්රිය මගීන්ට වඩා හොඳ අත්දැකීමක් ලබාදීම සඳහා පුද්ගලික අංශය සමඟ එක්ව එහි මුල් වාස්තු විද්‍යාත්මක අනන්‍යතාව ද ආරක්ෂා කර ගනිමින් නානුඔය, කොළඹ කොටුව, ගාල්ල සහ ඇල්ල වැනි ජනප්‍රිය ගමනාන්ත වෙත පහසුවෙන් ප්‍රවේශවීම සඳහා දුම්රිය ස්ථාන නවීකරණය කිරීම තුළින් සංචාරකයින්ට පහසුකම් සලස්වනු ලබන බවත්ය.

මෙම පසුබිම තුළ, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 75ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ඇත. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය බවට පත්ව ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තාක්ෂණික උපදෙස් සපයයි.

**මෙම ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා** වගුව -1.8

| අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම | වෙන්කිරීම (රු.මි) | වියදම (රු.මි) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ඇල්ල දුම්රිය ස්ථානය වැඩි දියුණු කිරීම/ නවීකරණය කිරීම | 32.65 | 32.65 | 98% |
| 2 | ගාල්ල දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීම/ නවීකරණය කිරීම | 5.56 | 2.88 | 95% |
| 3 | කොළඹ කොටුව දුම්රිය ස්ථානය වැඩිදියුණු කිරීම/ නවීකරණය කිරීම | 10.65 | | |
| | **මුළු එකතුව** | **48.87** | **35.53** | |

*මූලාශ්‍රය: සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය*

**ඡායාරූප**











**අභියෝග**

01. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පුහුණු කම්කරුවන්ගේ / තාක්ෂණ ශිල්පීන්ගේ හිඟය.

02. මෙම වැඩපිළිවෙළ කෙරෙහි තනි හෝ හවුල් වගකීම් සහිත රජයේ ආයතනවල බහුලතාව ප්‍රගතිය මන්දගාමී කරයි.

03. ඉදිකිරීම් හා අනෙකුත් සංවර්ධන කටයුතු කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශයට තාක්ෂණික අංශයක් අවශ්‍යය.

### 1.5.5. බළකොටු 06 ක් සංවර්ධනය කිරීම

මීට වසර 1500 ක පමණ අතීතයකට දිවෙන වෙරළ තීරය පුරා විහිදුණු මූලෝපායික ස්ථානවල පිහිටි බළකොටු 30ක් ශ්‍රී ලංකාවේ ඇත. සංචාරක නිපැයුම් සංවර්ධනය පිළිබඳ වර්තමානයේ හොඳම පරිචයන් සමඟ ගැළපෙන පරිදි මන්නාරම, මඩකලපුව, යාපනය, ත්‍රිකුණාමලය, මාතර, පුත්තලම සහ හම්බන්තොට ආදී තෝරාගත් බළකොටු 06ක් සංරක්ෂණය හා නවීකරණය කරන ලදී. මෙම සෑම ස්ථානයක්ම නැරඹීම සඳහා කුඩා යාත්‍රා යොදාගැනීමේ අවස්ථාවක් පවතින හෙයින්, මෙය ශ්‍රී ලංකාවේ වැදගත් සංචාරක අත්දැකීම් වලින් එකක් බවට පත්කල හැක.

එබැවින් , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව ඉහළ වටිනාකමක් සහිත සංචාරක ආකර්ෂණ ස්ථාන ලෙස සංරක්ෂණය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය රුපියල් මිලියන 250 ක් වෙන් කර ඇත. යටත් විජිත යුගයේ ලන්දේසි බළකොටු හා ලන්දේසි පිය සටහන්, සංචාරක ආකර්ෂණීය ස්ථාන බවට පරිවර්තනය කිරීමේ ප්‍රථම පියවර ලෙස, මුදල් යහමින් වියදම්කරන සංචාරකයින්ගේ වෙළඳපල පවත්වාගැනීමටත්, ඔවුන් ආකර්ශණය කර ගැනීම සඳහාත් ගමනාන්ත සංවර්ධනය පිළිබඳ වර්තමානයේ හොඳම පරිචයන් සමඟ ගැළපෙන පරිදි මෙම ලන්දේසි බළකොටු සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. මෙම සංදර්භය තුළ, අමාත්‍යාංශය කල්පිටිය හා මන්නාරම බළකොටු සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත.

මෙම අමාත්‍යාංශය මන්නාරම බලකොටුව සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 25.63 ක මුදලක් වෙන් කරදී ඇත.

**එම ක්‍රියාකාරකම් පහත දැක්වේ.**

- කොටුව ප්‍රතිසංස්කරණය (කොටු පවුර, උපබද්ධ ගොඩනැගිල්ල, සීනු කුළුණ සහ බැවුම් මග)
- ඇතුල්වීමේ ගොඩනැගිල්ල, බන්ධනාගාර ගොඩනැගිල්ල හා බංගලාව සඳහා ගෘහ භාණ්ඩ අලුත්වැඩියා කිරීම සහ සැපයීම
- දිය අගළෙහි රොන්මඩ කැනීම

ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් දිය අගළෙහි රොන්මඩ කැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරන ලදි.

**කල්පිටිය බලකොටුව**








### 1.5.5.1. කල්පිටිය බළකොටුව

කල්පිටිය බළකොටුව වර්තමානයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන භාවිතා කරනු ලැබේ. ශ්‍රී ලංකා නාවික හමුදාව නැවත ස්ථානගත කිරීම හා කොටුව සංරක්ෂණය හා අලුත්වැඩියාව යන කාරණා සම්බන්ධ ක්‍රියාවලිය, මෙම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීමට සමගාමීව සිදු කරනු ලැබේ. ඒ අනුව බළකොටුව සංවර්ධනය කිරීම සඳහා වැඩ සැලැස්ම, ක්‍රියාකාරි සැලසුම් සහ කාල රාමුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අමාත්‍යාංශයට දැනුම් දිය යුතුය.

බළකොටුවේ සංරක්ෂණ කටයුතු මෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාව නැවත ස්ථානගත කිරීමේ කටයුතු ද ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලද අතර 2019 ජනවාරි මස දෙවන සතිය වන විටත් නාවික හමුදා කඳවුර බළකොටුව තුළ පිහිටා ඇත.

### 1.5.5.2. අභියෝග

1. මෙම වැඩපිළිවෙළ කෙරෙහි තනි හෝ හවුල් වගකීම් සහිත රජයේ ආයතනවල බහුලතාව ප්‍රගතිය මන්දගාමී කරයි.
2. සමහර බළකොටුවල වර්තමානයේ දී රජයේ සංවිධාන රැඳී සිටිති. උදා. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කල්පිටිය කොටුවද සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මඩකලපුව කොටුව ද අත්පත් කර ගෙන ඇත.
3. විවිධ වූ තේමා මූලික ක්‍රියාමාර්ග යටතේ රටෙහි වඩාත් ප්‍රචලිතව නොමැති සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීම සහ ජනප්‍රිය කිරීම.

## 1.5.6. සංචාරක හිතකාමී "ටුක් ටුක්" වැඩසටහන

### 1.5.6.1. හැදින්වීම:

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ යහපත වෙනුවෙන් පිළිගත් සංචාරක ප්‍රමිතීන්ට අනුව මීටර් සවිකරන ලද කුලී රථ සේවාව හඳුන්වා දීම සඳහා වූ ක්‍රමවේදය වන සංචාරක හිතකාමී ටුක් ටුක් සේවාවේ ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය රු.මි.50 ක මුදලක් වෙන්කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී.

### 1.5.6.2. ඉලක්ක කණ්ඩායම:

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ස්ථානවල විදේශීය සංචාරකයින්ට ප්‍රවාහන සේවාවන් සපයන ත්‍රිරෝද රථ රියදුරන්

### 1.5.6.3. ක්‍රියාකාරකම්:

- පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම
- ඇගයීම් පරීක්ෂණ ලෙස විභාග පැවැත්වීම
- සහතික, හැඳුනුම්පත් සහ ස්ටිකර් නිකුත් කිරීම

- ටුක්-ටුක්වෙළඳ නාමකරණය
- දත්ත පද්ධතිය සහ ජංගම යෙදුම සංවර්ධනය කිරීම
- සංචාරක හිතකාමී ටුක් ටුක් සේවාව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම

### 1.5.6.4 මෙම ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා:

2018 වසරේ ජාතික අයවැය යෝජනා අනුව, සංචාරකයින්ට ප්‍රවාහන සේවාවන් සපයන සියළුම ත්‍රිරෝද රථ රියදුරන් විධිමත් කිරීමට රජය තීරණය කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විධිමත් පුහුණු වැඩසටහනක් තුළින් ත්‍රිරෝද රථ රියදුරන් විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සැලසුම් කරයි. එබැවින්, බස්නාහිර පළාතේ ප්‍රතිලාභීන් 813 ක්, දකුණු පළාතේ ප්‍රතිලාභීන් 78ක් සහ සබරගමුව පළාතේ ප්‍රතිලාභීන් 125 ක් සඳහා පුහුණු වැඩසටහන් හතක් පවත්වන ලදී.

### 1.5.7.ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශවල සංචාරක පොලීසි ව්‍යාප්ත කිරීම

2018 වාර්ෂික අයවැය යෝජනා වලට අනුව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩ සටහන යටතේ දිවයින පුරා හඳුනාගෙන තිබුණු ප්‍රදේශ 17 ක් අතුරින් ඇල්ල, මිරිස්ස හා කල්පිටිය යන ප්‍රදේශ සඳහා ප්‍රමුඛත්වය ලබාදී නව සංචාරක පොලිස් ඒකක 03ක් 2018 වර්ෂයේදී ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා එක්ව කටයුතු ආරම්භ කරන ලදී.

නව සංචාරක පොලීසි ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩම් පවරාගැනීමේ හා නිරවුල් කරගැනීමේදී පවත්නා දුෂ්කරතාවන්ට විකල්පයක් වශයෙන් අවම ඉඩ ප්‍රමාණයක් සහිතව කන්ටේනර් පෙට්ටි භාවිත කර පොලිස් ස්ථාන ගොඩනැගීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස මිරිස්ස ප්‍රදේශයේ නව පොලිස් ඒකකයක් පිහිටුවීමේ කටයුතු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද අතර එම කටයුතු මේ වන විට නිමවෙමින් පවතී.

ඇල්ල ප්‍රදේශයේ හඳුනාගත් රජය සතු ඉඩමක නිත්‍ය සංචාරක පොලිස් ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි සැලසුම් හා වැය ඇස්තමේන්තු සකස්කර අවසන්ව ඇති අතර යතොක්ත ඉඩම නිරවුල් කරගැනීමේ කටයුතු අවසන් වූ වහාම වැඩ ආරම්භ කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරා ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් කල්පිටිය ප්‍රදේශයේ හඳුනාගත් රජය සතු ඉඩමක නිත්‍ය සංචාරක පොලිස් ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි සැලසුම් සකස්කර ඉඩම් නිරවුල් කරගැනීමේ කටයුතුද අවසන් කර ඇති අතර, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබේ.

### 1.5.8. මන්නාරම මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම

මෙම අමාත්‍යාංශය මන්නාරම මඩු දේවස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සහ වන්දනාකරුවන් සඳහා ඉන්දියානු රජයේ අනුග්‍රහයෙන් සංක්‍රමණ නිවාස ව්‍යාපෘතියක් එහි ඉදිකිරීම ආරම්භ කර ඇත.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා මෙම අමාත්‍යාංශය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් (MoU) දැනටමත් අත්සන් කර ඇත. තවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව උපදේශන සේවා සැපයීම සඳහා එකඟවී ඇති අතර එම දෙපාර්තමේන්තුව සමඟද අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මඩු දේවස්ථානය පිහිටි ප්‍රදේශය පූජා භූමියක් ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, පූජා භූමිය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPPD) විසින් පියවර ගෙන ඇත. ඒ අනුව, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPPD) මෙම ව්‍යාපෘතිය සඳහා අක්කර 6.5 - 7ක ඉඩමක් වෙන්කරදී ඇත. මෙම අමාත්‍යාංශය මිනින්දෝරු සැලැස්ම අනුව බිම් කට්ටි කරන ලෙස මඩු ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලා ඇති අතර ව්‍යාපෘති සැලසුම්, ලංසු ලේඛන සහ ප්‍රමාණ සමීක්ෂණ ආදිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත.

ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය 2019 ජනවාරි මස පළමු සතිය වන විට සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම පිණිස ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතව ඇත.

### 1.5.9 2018.12.31 දිනට සංචාරක අංශයේ මූල්‍ය ප්‍රගතිය

වගුව 1.9

| විස්තරය | ප්‍රතිපාදන වෙන්කිරීම් (රු) | වියදම (රු) 31.12.2018 |
|---|---|---|
| **පුනරාවර්තන** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 138,040,200.00 | 119,036,945.00 |
| සංවර්ධන ක්‍රියාකාරකම් | 300,000,000.00 | - |
| මුළු පුනරාවර්තන | **438,040,200.00** | **119,036,945.00** |
| **ප්‍රාග්ධන** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 10,619,800.00 | 8,982,163.00 |
| * * සංවර්ධන ක්‍රියාකාරකම් | 845,000,000.00 | 330,009,182.00 |
| මුළු ප්‍රාග්ධන | **855,619,800.00** | **338,991,345.00** |
| **මුළු එකතුව** | **1,293,660,000.00** | **458,028,290.00** |

*මූලාශ්‍රය: සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය*

### 1.5.10 අලෙවිකරණ සංවර්ධන පහසුකම්

අලෙවිකරණ සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය (MDF) යනු සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන, ඕස්ට්‍රේලියානු රජය විසින් ආධාර සපයනු ලබන පුද්ගලික අංශ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු මාසයේදී නිල වශයෙන් ආරම්භ කරන ලදී.

ප්‍රගතිය පහත පරිදි වේ.

MDF වෙළඳපළ සංවර්ධන පහසුකම්

Australian Aid

# සංචාරක හා ආශ්‍රිත අංශ

| 28,660 | 13% | USD 7.7m | 460 | 19 |
| --- | --- | --- | --- | --- |
| ප්‍රතිලාභීන් | කාන්තා සහභාගිත්වය | මුළු අතිරේක ආදායම | රැකියා | මැදිහත්වීම් |

* මෙම ප්‍රතිඵල ජනවාරි 2016 සිට දෙසැම්බර් 2018 දක්වා වූ සමුච්චිත අගයන් වේ (2016-2018)

## හඳුනාගත් ගැටළු

### සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීම

- සංචාරක නිෂ්පාදන සහ ගමනාන්ත විවිධාංගිකරණය කිරීම
- නැගී එන ගමනාන්ත ප්‍රවර්ධනය කිරීම
- සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම
- සංචාරක සහායක කාර්යන්හි ගැටළු හඳුනාගැනීම (ශ්‍රමය, සම්බන්ධතාවය, තොරතුරු)

### ශ්‍රී ලංකාවට අනන්‍ය වූ භාණ්ඩ වැඩි දියුණු කිරීම

- නිෂ්පාදන දැනුම පිළිබඳ තොරතුරු සඳහා ප්‍රවේශය
- යෙදවුම් සඳහා ප්‍රවේශය
- ප්‍රමුඛ වෙළඳපළවල් සඳහා ප්‍රවේශය
- පසු අස්වනු අලාභ

## මැදිහත්වීම්

### සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීම

- සංචාරක නිෂ්පාදන සංවර්ධනය
- නැගී එන ගමනාන්ත කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- නැගී එන ගමනාන්ත කළමනාකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම


### ශ්‍රී ලංකාවට අනන්‍ය වූ භාණ්ඩ වැඩි දියුණු කිරීම

පෞද්ගලික ව්‍යාප්ති සේවාවන් හරහා තොරතුරු වෙත වඩා හොඳ ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම

යෙදවුම් සඳහා ප්‍රවේශය වැඩිකිරීම
- මත්ස්‍ය ගොවිපලවල
- තවාන්

- ප්‍රමුඛ වෙළඳපළවල් සඳහා ප්‍රවේශය
  - සන්නාමකරණය
  - අගය එකතුකිරීම

පසු අස්වනු අලාභය අඩුකරන පරිචයන් හා තාක්ෂණය හඳුන්වාදීම



## හවුල් ව්‍යාපාර

- Divron Bioventures
- Coolman
- Prawn Ceylon Pvt Ltd
- Export Development Board
- Aruna Plant Nursery
- Pasanka
- Soul Coffee
- Selyn
- Good Market
- Rice and Carry
- Pepper
- Serendib Leisure
- Sanasa Internationa
- LDR Technologies
- Rainforest Ecolodge
- Edge Adventures
- Safari Panama
- Cinnamon
- SLTDA Night Market
- Hammock Studio

* MDF පාර්ශවකරුවන් ක්‍රියාකාරීව හෝ මෙහෙයුම් සිදු කරන ප්‍රදේශ පෙන්වයි

## ප්‍රධාන ප්‍රතිඵල

2017 සහ 2018 දී සංචාරකයින් 2369 ක් වෙළඳපළ සංවර්ධන පහසුකම් වැඩසටහන (MDF)සහය දක්වන ලද ක්‍රියාකාරකම් සහ අත්දැකීම්වලට සහභාගී වී ඇත.

2017 සිට උතුරේ blue swimmer කකුළු ගොවීන් සඳහා වෙළඳපළ පුළුල්කිරීම

2018 දී වෙළඳපළ සංවර්ධන පහසුකම් වැඩසටහන (MDF)සහය දක්වන ලද හවුල්කරුවන් හරහා ඩොලර් මිලියන 2.5 ක් වටිනා අපනයන සිදුකිරීම

උතුරු පළාතේ කාන්තාවන් සඳහා පූර්ණ කාලීන රැකියා 370 ක් (2016-2018).

# 2.

# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



## 2. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය


### 2.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය 2005 අංක 38 දරන සංචාරක පනතේ 02 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් ස්ථාපිත කරන ලදි. මෙම සංවිධානය (ලංකා සංචාරක මණ්ඩලය/ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය නමින් මුලින් හඳුන්වන ලදි.) ශ්‍රී ලංකාව ආසියාවේ ප්‍රමුඛතම සංචාරක ගමනාන්තය බවට පත් කිරීම උදෙසා කැපවී සිටී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ගෝලීයව ශ්‍රී ලංකාව සුවිශේෂී ගමනාන්තයක් බවට පත් කරනු ලබන විවිධ අද්විතීය හා ගුණාත්මක බවෙන් යුතු සංචාරක සේවා හා නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා මහත් පරිශ්‍රමයක් දරා ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සම්පත් ප්‍රශස්තීකරණය තහවුරු කරන අතරතුර කර්මාන්තය උදෙසා කාර්යක්ෂමව හා ඵලදායීව සේවය කිරීමට එහි සම්පත් නිර්මාණාත්මකව භාවිතා කරයි.ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ඇතැම් කාර්යයන් අතරට නිශ්චිත අද්විතීය නිෂ්පාදන සහ සේවා හඳුනාගෙන සංවර්ධනය කිරීම,සංචාරක සංවර්ධන මාර්ගෝපදේශ සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම හා නව නිෂ්පාදන හා සේවා සංවර්ධනය සඳහා නීතිමය හා පරිපාලනමය ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම අයත් වේ.

### 2.2 ගෝලීය සංචාරක දළ විශ්ලේෂණය

ප්‍රස්තාරය -2.1




Source: World Tourism Organization (UNWTO) ©

2018 වර්ෂයේදී ලොව පුරා ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 6% ක වර්ධනයක් සහිතව බිලියන 1.4ක් දක්වා වැඩි වී ඇත. 2017 (+7%) වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන අතර 2010 වර්ෂයට පසුව දෙවන හොඳම වර්ෂයයි. යහපත් ආර්ථික පරිසරයක් පැවතීම හා ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපළ වලින් ශක්තිමත් බාහිර ඉල්ලුමක් පැවතීම මගින් සමස්ත ප්‍රතිඵලය ජනිත විය.

### 2.3 2014 සිට 2018 දක්වා සංචාරක පැමිණීම්


ප්‍රස්තාරය - 2.2




2018 වර්ෂය තුල ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම් 2,333,796 ක් ලෙස ගණනය කර ඇත. මෙය 2017 වර්ෂය සඳහා ලියාපදිංචි වූ සංචාරක පැමිණීම් 2,116,407 ට සාපේක්ෂව බලන විට 10.3 % ක වර්ධනයකි.

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*


## 2.4. 2014 සිට 2018 දක්වා විදේශ විනිමය ඉපයීම් (ඇ. ඩො. මි) ප්‍රස්තාරය -2. 3




මුළු සංචාරක ලැබීම් පූර්ව වර්ෂයේ ඇ.ඩො.මි 3924.9 ට සාපේක්ෂව ඇ.ඩො.මි. 4380.60 ලෙස තක්සේරු කරන ලද අතර 11.6 % ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

## 2.5. ඉහළම වෙළඳපළ දහය 2018 ප්‍රස්තාරය - 2.4




ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපළ දහය පිළිබඳ විශ්ලේෂණය පෙන්නුම් කරන්නේ ඉන්දියාව තවදුරටත් මෙරටට සංචාරකයින් පැමිණෙන ප්‍රමුඛතම රට බවයි. 2018 දී 11.4% ක කොටස් ප්‍රමාණයක් සමඟ චීනය දෙවන ප්‍රධාන සංචාරක නිෂ්පාදකයා බවට පත් විය. 2018 දී එක්සත් රාජධානිය සංචාරක පැමිණීම්වල තුන්වැනි ප්‍රධාන ප්‍රභවය විය. ජර්මනිය හා ඕස්ට්‍රේලියාව සිව්වැනි හා පස්වැනි ප්‍රධාන වෙළඳපළ බවට පත් විය.ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපළ දහය පිළිබඳ වර්ෂ අනුව විශ්ලේෂණය පෙන්නුම් කරන්නේ ඕස්ට්‍රේලියාව, ඇමරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය 2018/17 වර්ෂ වල වැඩිම ප්‍රතිශත වෙනස් වීම් වාර්තා කිරීමය. 2018 වසරේ දී මෙරට මුළු සංචාරක පැමිණීම් වලින් 68.2% ක්ම පාහේ ප්‍රධාන වෙළඳපළ 10 නියෝජනය විය.

## 2.6 මූල්‍ය කාර්යසාධනය

### 2.6.1. සංචාරක සංවර්ධන අරමුදලට බැර කරන ලද මුදල්

වගුව - 2.1

| වර්ගය | 2016 (රු.මි) | 2017 (රු.මි) | 2018 (රු.මි) |
|---|---|---|---|
| විගමන බද්ද | 2,355.44 | 2,378.83 | 2,824.97 |
| සංචාරක සංවර්ධන බද්ද | 1,276.81 | 1,541.47 | 1,482.08 |
| වෙනත් ආදායම් | 11.90 | 12.34 | 11.08 |
| **එකතුව** | **3,644.15** | **3,932.64** | **4,318.13** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 2.6.2. සංචාරක සංවර්ධන අරමුදල

**අ. ආදායම්**

වගුව- 2.2

| වර්ගය | ඇස්තමේන්තුව 2019 (රු.මි) | ඇස්තමේන්තුව 2018 (රු.මි) | සත්‍ය 2018 (රු.මි) |
|---|---|---|---|
| විගමන බද්ද | 2,847.83 | 2,766.31 | 2,824.97 |
| සංචාරක සංවර්ධන බද්ද | 1,785.36 | 1,496.29 | 1,482.08 |
| **එකතුව** | **4,633.19** | **4,262.60** | **4,307.05** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

ආ. **2018.01.01 සිට 2018.12.31 දක්වා විගමන බද්ද හා සංචාරක සංවර්ධන බද්ද වියදම්කල ආකාරය**

වගුව - 2.3

| වර්ගය | මුළු මුදල | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය | වර්ගය |
|---|---|---|---|---|---|
| වියදම් කිරීම | 100 | 14 | 70 | 12 | 4 |
| සංචාරක සංවර්ධන බද්ද (රු.මි) | 1,516.30 | 212.28 | 1,061.41 | 181.96 | 60.65 |
| විගමන බද්ද(රු.මි) | 2,714.69 | 380.06 | 1,900.28 | 325.76 | 108.59 |
| **මුළු මුදල (රු.මි)** | **4,230.99** | **592.34** | **2,961.69** | **507.72** | **169.24** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

## 2.7 ජයග්‍රහණ

සංචාරක ක්ෂේත්‍රයට අදාළ ගුණාත්මක හා සංඛ්‍යාත්මක දත්ත පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශන, පර්යේෂණ හා ජාත්‍යන්තර සබඳතා අංශය මගින් ක්‍රමානුකූලව ප්‍රකාශයට පත් කරනු ලැබේ. මාසික සංඛ්‍යාත්මක වාර්තා, කාර්තුමය සංචාරක කර්මාන්තයේ වාර්තා හා වාර්ෂික සංඛ්‍යාත්මක වාර්තා හා සංචාරක පැමිණීම්, විදේශ විනිමය ඉපයීම්, රැකියා අවස්ථා නිර්මාණය, හෝටල්වල නතරවීමේ අනුපාතයන්, චාරිකා විධි හැසිරීම්, ආකර්ශනීය ස්ථාන හා භාවිතාකළ සේවා පහසුකම් හා ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ කාර්යසාධනය දක්වන ශ්‍රී ලංකාවෙන් පිටවී යන විදේශීය සංචාරකයින් පිළිබඳ සමීක්ෂණය, සංචාරකයින්ගේ වියදම්, සංචාරක වාසස්ථාන, සංචාරක වාසස්ථාන පිළිබඳ ආයෝජන, ගුවන් ගමන් හා ආසන ධාරිතාව මෙයට අයත් වේ.

සංචාරක කර්මාන්තයේ ජාතික ආයෝජන සඳහා ඒකකයක් ලෙස 2010 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ආයෝජක සබඳතා ඒකකය (IRU) විදේශීය හා දේශීය ආයෝජකයින්ට සංචාරක ව්‍යාපාරය පිළිබඳ මධ්‍යගත පහසුකම් සැපයීමේ සේවාව සපයයි. ආයෝජක සබඳතා ඒකකයේ (IRU) පහසුකම් සැපයීමේ සේවාවට ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා තොරතුරු සැපයීම, නිෂ්පාදනවල අවශ්‍ය ප්‍රමිති හා අනුකූල වීම, සම්බන්ධ මඟ පෙන්වීම සහ විවිධාකාර නියාමන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, නියෝජිත ආයතනවලින් සහ අදාළ කොටස්කරුවන්ගෙන් (මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන, උපයෝගිතා සේවා සපයන්නන් ආදිය) විවිධ අනුමතින් ලබාගැනීම ආදී විවිධ සේවා අයත් වේ.ආයෝජක සබඳතා ඒකකය (IRU) පිහිටුවීමෙහි අවසන් අරමුණ වන්නේ;

i. සංචාරක ව්‍යාපෘතිවල අනුමත කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම,

ii. මෙරට සංචාරක කර්මාන්තයේ ආයෝජන ක්‍රියාත්මක කිරීම සඳහා ගතවන කාලසීමාවන් කෙටි කිරීම.

යන කරුණු සම්බන්ධව ආයෝජකයින් මත බර අඩු කිරීමයි.

වඩාත් සරල 'ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලියක්' හඳුන්වා දීම මඟින් ආයෝජක සබඳතා ඒකකයේ (IRU) කාර්යසාධනය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් මෙම ඒකකය (IRU) නැවත ප්‍රතිනිර්මාණය කිරීමේ ක්‍රියාවලිය 2016 දී ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ ආයෝජන කඩිනම් කිරීම සඳහා සහාය (SAIL) ව්‍යාපෘතියද මෙම ඒකකයේ (IRU) ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ දී සහාය දැක්වීම සඳහා ඉදිරිපත් විය. ඉහත සඳහන් කාර්යය සාර්ථකව 2018 දී අඛණ්ඩව සිදු කරන ලද අතර නාගරික සංවර්ධන අධිකාරියේ පවතින අනුමත කිරීමේ ක්‍රියාවලියේ අනුරූපණය අවසන් කරන ලද අතර, අනුමතකිරීම් සඳහා අවශ්‍ය ලේඛන අඩුකිරීම මඟින් ක්‍රියාවලිය සරල කිරීමට හා සෑම අනුමත කිරීමේ ක්‍රියාවලියක් සඳහාම කාල සීමා නියම කිරීමට සාකච්ඡා වට ගණනාවකින් පසු දෙපාර්ශවය එකඟවිය. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක්ද අත්සන් කරන ලදි.

ඇ.ඩො.මි. 919.04 ක වටිනාකමින් යුත් නව සංචාරක ව්‍යාපෘති සඳහා වූ අයදුම්පත් 141ක් පහසුකම් සැපයීම සඳහා යොමු කරමින්, 2018 දී පුද්ගලික අංශයේ සංචාරක ආයෝජන ව්‍යාපෘති සඳහා මෙම ඒකකය (IRU) අඛණ්ඩව පහසුකම් සැපයීය.


2018 දී ලැබුණු ව්‍යාපෘති 141 අතුරින් ව්‍යාපෘති 20 ක් සඳහා අවසන් අනුමැතිය ලබා දෙන ලදි. මෙම ඒකකය (IRU) විසින් ලබා ඇති සංඛ්‍යානමය ප්‍රගතිය පහත වගුවේ හා ප්‍රස්තාරයෙහි දක්වා ඇත.

වගුව - 2.4


| | විස්තරය | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර | ආයෝජනය (ඇ.ඩො.මි) | අපේක්ෂිත ආයෝජනය (රු.මි) |
|---|---|---|---|---|---|
| අ | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | 141 | 4051 | 919.04 | 168,184.32 |
| ආ | සිදු කරන ලද පරික්ෂාකිරීම් | 86 | 3104 | 815.172 | 149,176.48 |
| ඇ | ක්‍රියාවලි යටතේ ඇති ව්‍යාපෘති-සාමාන්‍ය ක්‍රියාවලිය | 114 | 3171 | 840.14 | 153,745.62 |
| ඈ | ක්‍රියාවලි යටතේ ඇති ව්‍යාපෘති-පරිසර නිෂ්කාශන ක්‍රියාවලිය | 07 | 588 | 77.73 | 14,244.59 |
| ඉ | මූලික නිෂ්කාශන ලබා දුන් ව්‍යාපෘති සංඛ්‍යාව | 107 | 3896 | 913.334 | 162,140.12 |
| ඊ | *අවසන් අනුමතිය ලබා දුන් | 20 | 292 | 17.17 | 3,142.11 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

**අයදුම්පත් ලද ව්‍යාපෘති භූගෝලීය මට්ටමින් අනු බණ්ඩනය**




**අවසන් අනුමතිය ලද ව්‍යාපෘති භූගෝලීය මට්ටමින් අනු බණ්ඩනය**




### 2.7.1 2010 සැප්තැම්බර් සිට 2018 දෙසැම්බර් 31 දක්වා ආයෝජක සබඳතා ඒකකය (IRU) මඟින් ක්‍රියාකරන ලද ව්‍යාපෘතිවල සමස්ත ප්‍රගතිය

වගුව - 2.5


| | | විස්තරය | 2010 සිට 2018 දෙසැම්බර් දක්වා ක්‍රියාකරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර | ආයෝජනය ඇ.ඩො.මි |
|---|---|---|---|---|---|
| අ | ලැබුණු මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | 780 | 39580 | 7037.06 | 1,287,781.98 |
| ආ | පරික්ෂා කිරීම් සිදු කරන ලද ව්‍යාපෘති | 593 | 33140 | 6074.35 | 1,111,606.05 |
| ඇ | අවසන් අනුමතිය ලබා දුන් ව්‍යාපෘති | 350 | 18760 | 2999.62 | 548,930.46 |
| ඈ | ප්‍රතික්ෂේපිත ව්‍යාපෘති හා රඳවාතබා ගත් ව්‍යාපෘති | 103 | 6815 | 962.717 | 176,177.21 |
| ඉ | ක්‍රියාවලි යටතේ ඇති ව්‍යාපෘති-මූලික ක්‍රියාවලිය | 247 | 9383 | 1847.68 | 338,125.44 |
| ඊ | ක්‍රියාවලි යටතේ ඇති ව්‍යාපෘති-පරිසර නිෂ්කාශන ක්‍රියාවලිය | 72 | 5332 | 1281.71 | 234,552.93 |
| උ | පරික්ෂා කිරීම් සිදු කල යුතු | 08 | 275 | 32.72 | 5,987.76 |
| ඌ | පරික්ෂා කිරීම් අවශ්‍ය නොවන | 179 | 6339 | 906.68 | 165,922.44 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 2.7.2 අනුමැතිය ලබා දෙන ලද ව්‍යාපෘතිවල ඉදිකිරීම් තත්වය

වගුව- 2.6

| ඉදිකිරීම් තත්වය | ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ආයෝජනය ඇ.ඩො.මි | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ඉදිකිරීම් දැනට ක්‍රියාත්මක | 103 | 6815 | 962.717 | 29 |
| ඉදිකිරීම් දැනට ආරම්භ නොකරන ලද | 54 | 2042 | 237.523 | 15 |
| මෙහෙයුම් දැනට ක්‍රියාත්මක | 193 | 9903 | 1754.51 | 55 |
| එකතුව | 350 | 18760 | 2954.75 | 100% |




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 2.7.3. අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘති- දිස්ත්‍රික් මට්ටමින් වර්ගීකරණය


වගුව- 2.7

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති සංඛ්‍යාව | කාමර සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| අම්පාර | 7 | 95 | 0.51 |
| අනුරාධපුරය | 4 | 111 | 0.59 |
| මඩකලපුව | 16 | 439 | 2.34 |
| බදුල්ල | 10 | 300 | 1.60 |
| කොළඹ | 44 | 5357 | 28.56 |
| ගාල්ල | 61 | 3177 | 16.93 |
| ගම්පහ | 23 | 1245 | 6.64 |
| හම්බන්තොට | 31 | 1610 | 8.58 |
| යාපනය | 10 | 315 | 1.68 |
| කළුතර | 26 | 1650 | 8.80 |
| මහනුවර | 16 | 559 | 2.98 |
| කෑගල්ල | 2 | 60 | 0.32 |
| කුරුණෑගල | 1 | 16 | 0.09 |
| මාතලේ | 19 | 677 | 3.61 |
| මාතර | 25 | 897 | 4.78 |
| නුවරඑළිය | 9 | 714 | 3.81 |
| පුත්තලම | 15 | 685 | 3.65 |
| ත්‍රිකුණාමලය | 21 | 590 | 3.14 |
| මොණරාගල | 2 | 42 | 0.22 |
| මන්නාරම | 1 | 52 | 0.28 |
| පොලොන්නරුව | 2 | 54 | 0.29 |
| රත්නපුර | 3 | 66 | 0.35 |
| වව්නියාව | 2 | 49 | 0.26 |
|  | 350 | 18760 | 100.00 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 2.7.4. අයදුම්පත් ලද ව්‍යාපෘති හා අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල තත්ව දර්ශකය

**2010 සැප්තැම්බර් -2018 දෙසැම්බර්** ප්‍රස්තාරය : 2.5




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

### 2.7.8 අයදුම්පත් ලද ව්‍යාපෘති හා අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිවල තත්වය

වගුව - 2.8

| වර්ෂය | අයදුම්පත් ලද මුළු ව්‍යාපෘති | අවසන් අනුමතිය ප්‍රදානය කරන ලද ව්‍යාපෘති |
|---|---|---|
| 2010 | 54 | 3 |
| 2011 | 155* | 45* |
| 2012 | 72 | 56 |
| 2013 | 60 | 37 |
| 2014 | 68 | 42 |
| 2015 | 59 | 37 |
| 2016 | 76 | 41 |
| 2017 | 95 | 45 |
| 2018 | 141 | 44 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

* ආයෝජක සබඳතා ඒකකය (IRU) පිහිටුවීමට පෙර සංවර්ධන අංශය මගින් ඉටු කරන ලද සියලු ආයෝජන ව්‍යාපෘති 2011 මුළු වර්ෂයේ මුළු ව්‍යාපෘති සංඛ්‍යාවට එකතු කරන ලදි.

## 2.8 නිකේතන කළමනාකරණය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් වෙළඳ නිකේතන 04,වෙළඳ නොවන නිකේතන 02 ක් කල් බදු වශයෙන් ලබා දී පාලනය කරගෙන යනු ලබන අතර තානායම් 37 ක කළමනාකරණය (රාජ්‍ය පරිපාලනය) පුද්ගලික අංශයේ පුද්ගලයන් වෙත බදු කුලියට ලබා දී ඇත.

වෙළඳ නිකේතන 04 වන්නේ නුවරඑළිය, බණ්ඩාරවෙල, කතරගම හා අනුරාධපුරය යන ජාතික නිවාඩු නිකේතනය මූලික වශයෙන් දේශීය සංචාරකයින් සඳහා අවම ගාස්තු වලට නවාතැන් පහසුකම් සපයනු ලැබේ. මළඅපද්‍රව්‍ය බැහැර කිරීම, කාමර නවීකරණය, කළමනාකරුවන්ගේ නිළ නිවාස හා සේදුම් යන්ත්‍ර, රෙදි සෝදන යන්ත්‍ර, රෙදි වියලන යන්ත්‍ර, දොර ජනෙල් රෙදි මිළදී ගැනීම යනාදි මෙම නිකේතනවල පොදු නඩත්තු කිරීම් හා අලුත්වැඩියා කිරීම් වැඩිදියුණු කිරීමට සුවිශේෂී උත්සාහයන් ගන්නා ලදි. අනුරාධපුරයේ නව නවාතැන් ඒකකය ඉදිකිරීම ක්‍රියාත්මක වෙමින් පවතී.

සුලංකා ගොඩනැගිල්ලේ සහ සාප්පු සංකීර්ණයේ නවීකරණ කටයුතු ද සිදුකරමින් පවතී. පාසිකුඩා ජාතික නිවාඩු නිකේතන පරිශ්‍රයෙහි හෝටලයක් ඉදිකිරීම සඳහා ඉඩම් කැබලි 14 ක් පුද්ගලික අංශයට බදු දී ඇත. ඉඩම් කැබලි 14 අතරින් හෝටල් 12 ක් සම්පූර්ණයෙන් ඉදි කර, ක්‍රියාත්මක කර ඇත. පාසිකුඩා ජාතික නිවාඩු නිකේතනයෙහි මෙහෙයුම් කටයුතු පහසු කිරීම සඳහා විදුලි බලය, ජලය සහ අපජල පවිත්‍රාගාරය වැනි මූලික යටිතල පහසුකම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සපයන ලදි. හෝටල්වල මෙහෙයුම් ක්‍රියාත්මක වීමත් සමග සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ නැගෙනහිර වෙරළබඩ ප්‍රජාවට අත්වේ.

## 2.9 නිකේතන සංවර්ධනය

| | |
|---|---|
| **කල්පිටිය නිකේතනය** | පාරිසරික වශයෙන් සංවේදී "සාගරය ආශ්‍රිත දූපත් නිකේතනයක් " වශයෙන් ශ්‍රී ලංකාවේ නව නිෂ්පාදනයක් අරමුණු කළ ඒකාබද්ධ සංචාරක නිකේතනයක් ලෙස 2014 වර්ෂයේ දී කල්පිටිය නිකේතනය සංකල්ප ගත කරන ලදි. කෙසේ වෙතත්, කල්පිටිය නිපැයුම් සංවර්ධනය දැනට ඇනහිට ඇත. විභවතාවගෙන් යුත් ආයෝජකයින්ගේ පොදු නිරීක්ෂණයක් වන්නේ පොදු යටිතල පහසුකම් හිඟය හා අසීරු ප්‍රවේශයයි. දැනට යෝජනා 2 ක් ඉදිරිපත් වී ඇති අතර 2018 දී ප්‍රජාවෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබී ඇති නමුත් එය තවමත් ලිඛිතව අනුමතකර නොමැත. |
| **කුච්චවේලී නිකේතනය** | කුච්චවේලි සංවර්ධනය දැනට ඇනහිට ඇත. විභවතාවගෙන් යුත් ආයෝජකයින්ගේ පොදු පැමිණිල්ලක් වනුයේ, මුලින් කල්බදු ගෙවීමේ ඉහළ මිල වේ. කෙසේ වෙතත් ප්‍රතිවිරුද්ධ කරුණක් ලෙස පෙන්වාදිය හැක්කේ, මෙම ස්ථානයේ එකම සංචාරක හෝටල් මෙහෙයුම්කරු ලෙස උගා එස්කේප්ස් කළමනාකරණ පුද්ගලික සමාගම (Uga Escapes Management (Pvt) Ltd) විසින් ක්‍රියාත්මක කරන ඉහළ මට්ටමේ පහසුකම්වලින් යුත් මෙම වෙරළ නිකේතනයෙහි (Jungle Beach Resort) හි සියලු නවාතැන් මාස 3 කට කලින් සම්පූර්ණයෙන් සංචාරකයින් විසින් වෙන්කරවා ගැනීමය. ධීවර ගම්මානයක් ලෙස මෙන්ම අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ හැකියාව හඳුනා ගැනීම සඳහා දකුණු කොරියානු උපදේශක කණ්ඩායමක් කුච්චවේලි හා කලපු ප්‍රදේශයේ සංචාරයක නිරත වූ අතර කොරියානු රජය අරමුදල් ලබාදීම සඳහා ඔවුන්ගේ මූලික කැමැත්ත දන්වා ඇත. |
| **යාල වනජීවි නිකේතනය** | යාල වනජීවි නිකේතනයේ සුවිශේෂී සංවර්ධන ක්‍රියාවලියක් පවතී. නිකේතනයේ උතුරු කොටස වෙත නව ඉහළ පීඩනයක් සහිත විදුලි සැපයුමක් සමග පොදු ප්‍රවේශ මාර්ගයද නිම කරන ලදි. නිකේතන ප්‍රධාන සැලැස්ම සම්පූර්ණ කරන ලද අතර අවසාන වාර්තාව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ යාල වනජීවි නිකේතනයේ පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. අවසාන ප්‍රධාන සැලසුම් වාර්තාවට එම අදහස් අඩංගු කල යුතු ය. ඉහත සඳහන් ප්‍රධාන සැලැස්මේ නිර්දේශවලට අනුකූලව සියලු පොදු පහසුකම් සංවර්ධනය, යටිතල පහසුකම් සහ අගය එකතු කිරීම් අනාගතයේ දී සිදුකරනු ලැබේ. |

| | |
|---|---|
| **දේද්දුව නිකේතනය** | මෙම ව්‍යාපෘතිය තවමත් මුල් අදියරේ ක්‍රියාත්මක වන අතර ඉඩම් අත්පත් කරගැනීම් සිදු කෙරේ. සැලසුම්කළ ඉඩම් අක්කර 1800කින් අක්කර 1732.03ක් අත්පත් කරගෙන ඇත. ඒ අනුව ඉදිරියේදී මෙම ආකර්ෂණීය ඉඩම සඳහා ආයෝජනය කිරීමට ආයෝජනය අවස්ථාව පුද්ගලික අංශයට උදා වේ. |

සංචාරක සංවර්ධනය සඳහා පහත සඳහන් ඉඩම් හඳුනා ගෙන ඇති අතර අත්පත් කරගැනීමේ හා පැවරීමේ කටයුතු සිදුකිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවසරය ලබා දී ඇත.

| හඳුනා ගත් ඉඩම | ඉඩම් ප්‍රමාණය අක්කර (ආසන්න වශයෙන්) |
|---|---|
| අකුරල | 493.00 |
| බගවන්තලාව | 316.00 |
| වාළච්චේන | 265.00 |
| දෙනියාය | 350.00 |
| කොහිලවගුර | 27.60 |
| මුල්ලේරියාව. වැලිවිට (මාළබේ අධිවේගී පිටවුම) | 36.00 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

මුදල් අමාත්‍යාංශය විසින් අයවැය යෝජනා ක්‍රියාත්මක කරමින්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සත්කාරක නිවාස ඒකක පහසුකම් සංවර්ධනය කිරීම සඳහා "හරිත ණය යෝජනා ක්‍රමය" සඳහා ලැබුණු අයදුම්පත් 716 ක් සළකා බලා ඇති අතර ඉහත ණය යෝජනා ක්‍රමය සඳහා සත්කාරක නිවාස 264 ක් නිර්දේශ කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන නිර්දේශ ලිපිය මත පදනම්ව අදාළ බැංකු විසින් ණය මුදල මුදාහැරීමට නියමිතය. මීට අමතරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දිවයින පුරා සංචාරක කේන්ද්‍රස්ථානවල එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයේ (UNWTO) අනුමතිය සහිත සංඥා පුවරු ඉදිකිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදි. තවද,

වඩාත් ප්‍රචලිතව නොමැති ආකර්ෂණීය සංචාරක ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා පළාත් නවය සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. මෙම වැඩපිළිවෙලෙහි අරමුණ වන්නේ මෙරට සංචාරය කරන සංචාරකයින්ට වඩා පුළුල් විවිධත්වයක් සහිත නව සංචාරක ආකර්ෂණ ස්ථාන හඳුන්වා දීමයි.

## 2.10 ජාත්‍යන්තර හා දේශීය සංචාරකයින්

සංචාරක කර්මාන්තය යනු, ජාතික රජය හා පළාත් සභා අතර හුවමාරු කරගත් විෂයයකි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ප්‍රමුඛතම ජාතික සංචාරක සංවර්ධනය හා නියාමන අධිකාරිය වශයෙන් පළාත් සංචාරක යටිතල පහසුකම් ගොඩ නැංවීම සඳහා ක්‍රියාකාරීව අරමුදල් සපයනු ලබන අතර 2015 ජූලි මස ස්ථාපිත දේශීය සංචාරක හා ප්‍රජා සබඳතා අංශය තුළින් දේශීය සංචාරක සේවා සැපයුම් මට්ටම ඉහළ නැංවීමට කටයුතු කරනු ලබයි. එවැනි උත්සාහයන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබෙන සැලකිය යුතු මූල්‍ය දායකත්වයක් සහිතව දිස්ත්‍රික් ලේකම් හා පළාත් පාලන අධිකාරීන් සමග සහයෝගයෙන් යුතුව ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් 06 තුළ දේශීය සංචාරක හා ප්‍රජා සබඳතා අංශය මඟින් පාලනය කරනු ලබන ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති පහත පරිදි වේ.

| පිහිටීම | ව්‍යාපෘතිය |
|---|---|
| කජුගම | කජු වෙළෙඳුන් සඳහා වෙළෙඳ කරත්ත භාර දීම |
| තලෙයිමන්නාරම | නව වෙරළ කජු වෙළෙඳුන් සඳහා වෙළෙඳ වාහන (කරත්ත) භාර දීම |
| අම්පිටිගල | පාරිසරික සංචාරක ගම්මාන සංවර්ධනය |
| සඳතැන්න | කෘෂි සංචරණය |
| අනුරාධපුර | සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය |
| දූන්හිඳ | යටිතල පහසුකම් සංවර්ධනය |

| | |
|---|---|
| ඇල්ල | රාවණා ඇල්ල සංවර්ධනය |
| ආරුගම්බේ | කොට්ටුකාල් පාර සංවර්ධනය |
| තිස්සමහාරාමය, අළුත්නුවර, ගැටබරුව, මදුරන්කුළිය | පහසුකම් මධ්‍යස්ථාන |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

ඊට අමතරව, දේශීය සංචාරක අංශය විසින් බහුවිධ ක්‍රියාකාරකම් සාර්ථකව පවත්වන ලදි. මේ සඳහා කජුගම කජු වෙළෙඳුන් සඳහා වෙළෙඳ වාහන (කරත්ත) භාරදීම, සෆාරි රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහන, ජීවිත ආරක්ෂක පුහුණු වැඩසටහන හා වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන අන්තර්ගත විය.මීට අමතරව, ටුක් ටුක් වැඩසටහන ආරම්භ වූ අතර ජනප්‍රිය සංචාරක ප්‍රදේශ එනම් කොළඹ, බෙන්තොට, දෙනියාය, ඇල්ල, මීගමුව, තිස්සමහාරාම යන ප්‍රදේශවල ටුක් ටුක් ත්‍රීරෝද රථ රියදුරන් 2000ක් පුහුණු කරන ලදි. රට පුරා ත්‍රීරෝද රථ රියදුරන් 10,000ක් පුහුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව වෙරළබඩ ප්‍රදේශවල ජීවිත රක්ෂක ඒකක 25ක් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. මෙහි පළමු පියවර ලෙස බෙන්තොට, හික්කඩුව හා මිරිස්සේ ජීවිත ආරක්ෂක ඒකක වැඩිදියුණු කිරීම සඳහා පියවර ගෙන තිබේ. තවද, හඳුනාගත් සංචාරක ගමනාන්තවල සංචාරක පොලිස් ස්ථාන 25 ක් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.




**ටුක් ටුක් රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහන**



**ජීවිත-ආරක්ෂණ ඒකක**

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ තවත් මූලික කාර්යයක් වනුයේ, නවාතැන් සපයන හා අනෙක් සංචාරක සේවා සැපයීමේ ආයතන ලියාපදිංචි කිරීම, නියාමනය කිරීම හා ප්‍රමිතින් සහතික කිරීමයි. 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සංචාරක ආයතන ලියාපදිංචි වීම් පහත පරිදි වේ.

### 2.10.1. නවාතැන් සපයන අංශය

වගුව- 2.9

| වර්ගීකරණය | 2018.01.01- 2018.12.31 | | 2018.12.31 සිට | |
|---|---|---|---|---|
| | ඒකක | කාමර | ඒකක | කාමර |
| වර්ගීකරණය කළ හෝටල් | 8 | 1,213 | 134 | 12,943 |
| තරු 5 | 2 | 733 | 23 | 5,150 |
| තරු 4 | 4 | 410 | 20 | 2,169 |
| තරු 3 | - | - | 23 | 2,364 |
| තරු 2 | 2 | 70 | 33 | 1,612 |
| තරු 1 | - | - | 35 | 1,648 |
| වර්ගීකරණය නොකළ හෝටල් | 17 | 899 | 223 | 9,737 |

| | | | | |
|---|---|---|---|---|
| බුටික් හෝටල් | 5 | 120 | 30 | 618 |
| බුටික් විලා | 3 | 27 | 36 | 239 |
| තානායම් | 46 | 590 | 782 | 8,629 |
| සත්කාරක නිවාස ඒකක | 81 | 255 | 445 | 1,352 |
| බංගලා | 52 | 190 | 390 | 1,613 |
| උරුමයන් පිළිබඳ බංගලා | - | - | 4 | 19 |
| උරුමයන් පිළිබඳ නිවාස | 1 | 1 | 3 | 9 |
| කුළී බද්ධ නිවාස | 8 | 46 | 68 | 219 |
| කුළී නිවාස | - | - | 6 | 19 |
| **එකතුව** | **221** | **3,341** | **2,121** | **35,397** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

**විශේෂිත සංචාරක සේවා** වගුව- 2.10

| වර්ගීකරණය | 2018.01.01- 2018.12.31 | 2018.12.31 සිට |
|---|---|---|
| ජාතික සංචාරක මාර්ගෝපදේශක | 24 | 1,425 |
| සංචාරක රියදුරු මාර්ගෝපදේශක | 41 | 1,185 |
| ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශක | 01 | 537 |
| ස්ථානීය සංචාරක මාර්ගෝපදේශක | - | 92 |
| **එකතුව** | **66** | **3,239** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

**මාර්ගෝපදේශ සේවා** වගුව- 2.11

| වර්ගීකරණය | 2018.01.01- 2018.12.31 | 2018.12.31 සිට |
|---|---|---|
| ආපනශාලා | 26 | 439 |
| චාරිකා නියෝජිත ආයතන | 69 | 901 |
| ස්පා හා සුවතා මධ්‍යස්ථාන | 22 | 80 |
| සංචාරක කඩ | 5 | 78 |
| ජල ක්‍රීඩා මධ්‍යස්ථාන | 2 | 27 |
| කුළුබඩු උද්‍යාන | 3 | 37 |
| **එකතුව** | **127** | **1,562** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

**2018 වර්ෂය සඳහා මත්පැන් බලපත්‍ර නිර්දේශ නිකුත් කිරීම**

| | |
|---|---|
| වර්ගීකරණය කළ හෝටල් | - 101 |
| වර්ගීකරණය නොකළ හෝටල් | - 132 |
| බුටික් හෝටල් | - 17 |
| බුටික් විලා | - 21 |
| තානායම් | - 461 |
| ආපනශාලා | - 285 |
| **එකතුව** | **- 1017** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

සංචාරක හෝටල් වර්ගීකරණය කිරීම සම්බන්ධව 2016 අප්‍රේල් 20 දිනැති අංක 1693/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව සියලුම ලියාපදිංචි සංචාරක හෝටල් වර්ගීකරණය කිරීමට පියවර ගන්නා ලදි. හෝටල් වර්ගීකරණය කමිටුවක් වසර දෙකක කාලයක් සඳහා පත් කර ඇති අතර, සංචාරක අමාත්‍යවරයා විසින් සංචාරක හෝටල් 27 කට නිල වශයෙන් සමරු පුවරු ප්‍රදානය කරන ලදි. පහත දැක්වෙන්නේ එම වර්ගීකරණයේ ප්‍රගතියයි.

වගුව- 2.12

| තත්වය | සංඛ්‍යාව |
|---|---|
| පරීක්ෂාකිරීම් සංඛ්‍යාව | **118** |
| තරු5 | 10 |
| තරු4 | 05 |
| තරු3 | 10 |
| තරු2 | 11 |
| තරු1 | 09 |
| නිවැරදි කල යුතු අඩුපාඩු | 66 |
| තත්වය පහත හෙළන ලද | 07 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*

මීට අමතරව, මහනුවර, සීගිරිය හා දඹුල්ල යන ප්‍රදේශවල අනවසර මාර්ගෝපදේශකයින් පිළිබඳව අහඹු පිරික්සුම් සිදු කරන ලදි. 2018 වසර තුළ දී වීසා නිර්දේශ 411 ක් නිකුත් කරන ලදි. ගාල්ල, පොලොන්නරුව, යාපනය, මුලතිව්, කිලිනොච්චිය, මිරිස්ස, ඇල්ල, දෙනියාය, සීගිරිය, දඹුල්ල, කිතුල්ගල, දික්වැල්ල, තංගල්ල සහ පාදුක්ක යන ප්‍රදේශවල දැනුවත් කිරීම්, පුහුණු වැඩසටහන් සහ ජංගම සේවා පවත්වන ලදි. තවද, කොළඹ සහ දෙහිවල / ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක හෝටල් අවම කාමර ගාස්තුව පිළිපදින වග නිරීක්ෂණය කිරීම සඳහා ගජ්මා සහ සමාගම (වරලත් ගණකාධිකාරී) මඟින් විගණනයක් සිදු කරන ලදි.

සංචාරකයින් සඳහා පිරිනමන සේවාවන්ගේ ගුණාත්මක භාවය දිරිගැන්වීම හා උසස් කිරීම සඳහාත් හොඳම ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව පිළිබඳ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහාත් 2018 වසරේ දී සංචාරක සම්මාන ප්‍රදානය නැවත හඳුන්වාදුන් අතර ආරාධිත අමුත්තන් 400 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවති උත්සවයකදී ජයග්‍රාහකයින් 36 දෙනෙකු තෝරා සම්මාන ප්‍රදානය කරන ලදි.

වර්ගීකරණය කළ හෝටල් 26 ක් විගණනය කරන ලද අතර 2009 වසරේ ඔක්තෝබර් මස 05 වන දිනැති අංක 1622/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා 2011 මාර්තු මස 17 දිනැති අංක 1697/24 දරණ සංශෝධිත ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති සියලු අවශ්‍යතාවයන්ට අනුකූලව සියළුම හෝටල් කටයුතු නො කරන බව සොයා ගන්නා ලදි. අන්තර්ජාතික මූල්‍ය සමාගම (IFC) විසින් අරමුදල් සපයන ලද ජංගම සේවා වලින් උතුරු හා නැගෙනහිර පළාත්වල පවත්වන ලද ජංගම සේවා 06න් අවසන් ජංගම සේවාව කල්පිටියේදි පවත්වන ලදි. තවත් ජංගම සේවා 03 ක් අනුරාධපුර, සීගිරිය සහ මිරිස්ස පැවැත්වීමට නියමිත ය. අනුරාධපුර, මිරිස්ස සහ මීගමුව වැනි ප්‍රධාන සංචාරක නගරවල දැනුවත් කිරීමේ වැඩසටහන් හා පරීක්ෂණ සිදු කරන ලදි. වර්ෂයේ පළමු භාගය තුළ නව සංචාරක ආයතන 160 ක් අවශෝෂණය කර ගන්නා ලදි. සනීපාරක්ෂක හා ගුණාත්මක ආහාර ගැනීමේ ස්ථාන හඳුනා ගැනීම සඳහා සංචාරකයින්ට හිතකාමී ආහාර ස්ථාන ක්‍රමය හඳුන්වා දෙන ලද අතර කොළඹ, ගාල්ල සහ මහනුවර ප්‍රදේශවල ආහාර ස්ථාන 110 ක් ලියාපදිංචි කරන ලදි.

## 2.11 අනෙකුත් මෙහෙයුම් තොරතුරු

අපගේ සේවාදායකයින් අතින් සිදු කරන වැඩ ප්‍රමාණය අඩු කර ගැනීමට, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මාර්ගගත චාරිකා විමසුම් කළමනාකරණ පද්ධතිය හා සංචාරක ප්‍රතිපෝෂණ පද්ධතියක් දියත් කරන ලදි. තොරතුරු තාක්ෂණ අංශය (ICT) මගින් පිරිවැය අඩු කර ගැනීම හා සමස්ත ඵලදායිතාව වැඩි කර ගැනීමට හා සම්පත් හුවමාරු කර ගැනීමට ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ විද්‍යුත් ලිපිනය වැනි යෙදවුම් උපාංගයේ සිට (G Suite) ගුගල් යෙදවුම් මෘදුකාංගය වෙත ප්‍රවේශ වීම, පරිපාලන කටයුතු කළමනාකරණ පද්ධතිය හා ව්‍යාපෘති කළමනාකරණ මෘදුකාංග විසඳුම ඒවායින් සමහරක් වේ. ඊට අමතරව, ගුගල් සමඟ ඩිජිටල් අලෙවිකරණ ව්‍යාපාරය මෙහි තවත් ප්‍රධාන ව්‍යාපෘතියකි. ආයතනික කාර්යක්ෂමතාව, පාරිභෝගික අත්දැකීම ඉහළ නැංවීම හා අලෙවිකරණය/ ප්‍රවර්ධන හා අපගේ පාර්ශවකරුවන් වෙත බෙදා හැරීමේ සේවාවන් වලට අදාළ තාක්ෂණයෙන් පුළුල්ව ආවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හොඳම මූල්‍යය හා මෙහෙයුම් භාවිතයන් සමග එකඟවන බව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කරනු ලබයි. නීති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කාර්යයන් සඳහා දිනෙන් දින උපදෙස් ලබා දෙන අතර නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කරනු ලබන අතර අවශ්‍ය විටක දී නඩු ගොනු කරයි. ඊට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන අතර පරිපාලනය අංශය වශයෙන්ද ක්‍රියාත්මක වේ.

මානව සම්පත් හා භූමි කළමනාකරණ අංශය මගින් සංවිධානයේ පුද්ගලයින් බඳවා ගැනීම, කළමනාකරණය හා සංවිධානයේ ජනතාව මෙහෙයවීම මෙන්ම භූමි කළමනාකරණය කිරීම සඳහා වගකියනු ලැබේ. නව බඳවා ගැනීම් 35 ක් සිදුකර ඇති අතර දේශීය හා විදේශීය පුහුණුව සඳහා නිලධාරීන් 110 ක් යොමු කර ඇත. පුහුණුව සඳහා වැය වූ මුළු වියදම රු.මි 5.5 කි.

## 2.12 විශේෂ සිදුවීම් සහ ව්‍යාපෘති

### 2.12.1. ලෝක සංචාරක දිනය (WTD) 2018

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් මේ වසරේ ලෝක සංචාරක දිනය "සංචාරක ව්‍යාපාරය හා ඩිජිටල් පරිවර්තනය" යන තේමාව යටතේ 2018 සැප්තැම්බර් 26 සිට 28 දක්වා යාපනයේදී සමරන ලදි. යාපනයේදී ජාතික උත්සවයක් පවත්වන ලද ප්‍රථම අවස්ථාව මෙය විය.

**ලෝක සංචාරක දිනය (WTD) 2018 යටතේ ක්‍රියාකාරකම් පහත පරිදි විය.**

- සැප්තැම්බර් 26 සිට 28 දක්වා ප්‍රදර්ශනය: පළාත් සභා 9 ක්, හෝටල්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 9 ක් නියෝජනය කරමින් සංචාරක සංවිධාන, ප්‍රදර්ශනය සඳහා සහභාගී වූහ. එයට ආහාර අලෙවිකුටි, රෙදිපිළි වෙළඳ කුටි, සමරු වෙළඳ කුටි, අත්කම් වෙළඳ කුටි ආදිය ඇතුළත් විය.
- සැප්තැම්බර් 27 වන දින ලෝක සංචාරක දිනය 2018 නිල සැමරුම් උත්සවය: සංචාරක කර්මාන්තයේ පාර්ශවකරුවන්, ප්‍රභූන්, රජයේ ආයතන සහ මාධ්‍ය ආයතන නියෝජනය කරන නිලධාරීන්, නිල උත්සවයට සහභාගි වූහ.
- සැප්තැම්බර් 27 වන දින මණ්ඩල සාකච්ඡා: සැප්තැම්බර් 27 වෙනි දින පස්වරුවේ පැවති " සංචාරක ව්‍යාපාරය හා ඩිජිටල් පරිවර්තනය" යන තේමාව යටතේ රැස්වීමක් පවත්වන ලදි.
- සැප්තැම්බර් 26 සිට 28 දක්වා සංස්කෘතික සංදර්ශනය: යාපනයේ අද්විතීය සංස්කෘතිය ප්‍රදර්ශනය කිරීම සඳහා සංස්කෘතික සංදර්ශනයක් පැවැත්විණි.

**ලෝක සංචාරක දිනය (WTD) 2018 ජාතික උත්සවය,**

- සංචාරක හා සංචාරක කටයුතු සඳහා උතුරු කලාපයට පුළුල් ප්‍රචාරයක් ලබාදුණි.
- උතුරු පළාතේ සංචාරක සේවා සපයන්නන් සඳහා නිරාවරණය ලබාදුණි.
- විවිධ සංස්කෘතීන් අතර වර්ධනය වූ අන්‍යොන්‍ය අවබෝධය ලබාදුණි.
- යාපනයේ ප්‍රාදේශීය සේවා සැපයුම්කරුවන් සමග සංචාරක කර්මාන්තය සම්බන්ධ වුණි.

### 2.12.2. ජාතික තිරසාර සංචාරක සහතිකකරණ වැඩසටහන (NSTCS)

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ජෛව විවිධත්ව මූල්‍ය ක්‍රියාමාර්ග (BIOFIN) සමඟ එක්ව "ජාතික තිරසාර සංචාරක සහතිකකරණ වැඩසටහන (NSTCS)" නමැති ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. NSTCS යනු, ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දේශීය හා විදේශීය වශයෙන් වඩාත් තරගකාරී කිරීම සඳහාත් තිරසාර සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ධනාත්මකව ශක්තිමත් කිරීම සඳහාත් වන තීරණාත්මක පියවරකි. සහතික කිරීමේ වැඩසටහන නියැදියක් තෝරා ගනිමින් මුලින්ම නවාතැන් අංශය සඳහා වැඩසටහන පවත්වනු ලබන අතර ඊළඟ අදියරේ දී සමස්ත නවාතැන් අංශයටත් අවසානයේ සියලුම සංචාරක සැපයුම්කරුවන් වෙතටත් ගමන් කරනු ඇත.

## 2.13 ප්‍රධාන අභියෝග

- ආයෝජන සම්බන්ධයෙන් යෙදවුම් ක්‍රියාවේ යෙදවීමේ දී ඇතැම් ආයතනවල සිදුවන ප්‍රමාදයන්
- අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා කාලය පිළිබඳ සාධක
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කාලය පිළිබඳ සාධක
- මානව සම්පත් හිඟය
- බහුතරයක් සංචාරක තානායම් හා ආපනශාලා ස්ථිර ගුණත්වයෙන් යුතුව සේවා ප්‍රමිති පවත්වා ගෙන යාම
- වේගයෙන් වර්ධනය වන “සත්කාරක නිවාස “ ආයතන ලියාපදිංචි කිරීම

SO SRI LANKA

# 3.
# ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය



## 03. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

### 3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 2005 අංක 38 දරණ සංචාරක පනත යටතේ පිහිටුවා ඇත. කාර්යාංශය දැනට අමාත්‍ය ගරු ජෝන් අමරතුංග මැතිතුමා විසින් පාලනය වන සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.මෙම කාර්යාංශය ශ්‍රී ලංකාව සංචාරක හා සංචාරක ගමනාන්තයක් ලෙස දේශීය හා ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ හා අලෙවිකරණය කිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටු කරයි. නැරඹීමට සහ නැවත නැවතත් නැරඹීමට සිත් ඇදගන්නා ආකාරයට මෙම අද්විතීය දිවයිනේ ස්වාභාවික සම්පත්, සංස්කෘතිය සහ වික්‍රමාන්විත ක්‍රියා සංචාරකයන් අතර ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වෙළඳපළ 20 ක් ඔස්සේ කාර්යාංශය ක්‍රියාත්මකය.ජාතියේ සංචාරක ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රධාන වශයෙන් ප්‍රචාරක කටයුතු, මහජන සම්බන්ධතා සහ මාධ්‍ය වැඩසටහන්, වෙළඳ ප්‍රදර්ශන සහ කර්මාන්ත වැඩසටහන්, පාරිභෝගික ප්‍රවර්ධන, මාර්ගගත සන්නිවේදනය සහ පාරිභෝගික පහසුකම් සැපයීම යන ක්‍රියාකාරකම් සිදු කරයි.

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය බටහිර යුරෝපය ( එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය,නෙදර්ලන්තය, ස්වීඩනය, ඉතාලිය, ඩෙන්මාර්කය, ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රියාව, ස්පාඤ්ඤය, බෙල්ජියම හා නෝර්වේ) දකුණු ආසියාව (ඉන්දියාව), නැගෙනහිර ආසියාව (චීනය, ජපානය, මලයාසියාව, සිංගප්පූරුව, කොරියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, වියට්නාමය, පිලිපීනය) මැද පෙරදිග (සවුදි අරාබිය, ඕමානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඊශ්‍රාලය, කුවේට්) බටහිර යුරෝපය( රුසියාව, චෙක් ජනරජය, යුක්රේනය, පෝලන්තය) උතුරු ඇමෙරිකාව (ඇමෙරිකා එක්සත් ජනපදය,කැනඩාව) සහ ඕස්ට්‍රලේෂියා ( ඕස්ට්‍රේලියාව) වැනි ලෝකයේ තෝරාගත් කලාපවල වෙළඳ හා පාරිභෝගික ප්‍රවර්ධන පිළිබඳව අවධානය යොමුකර ඇත.

### 3.2 2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය

#### 3.2.1. වැඩසටහන් හා ව්‍යාපාතිවල භෞතික ප්‍රගතිය

##### 3.2.1.1. ප්‍රධාන ජයග්‍රහණ

2018 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ සංචාරය කල සංචාරකයින් ප්‍රමාණය 2,333,796කි. එය පසුගිය වසරට සාපේක්ෂව 10.3% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කරයි. 2018 අගෝස්තු මාසයේ පැමිණි මුළු සංචාරක සංඛ්‍යාවෙන් 47% ක් සමඟම, ආසියා හා පැසිපික් කලාපය ශ්‍රී ලංකාව වෙත සංචාරකයින් පැමිණීමේ විශාලතම මූලාශ්‍රය බවට අඛණ්ඩව පත්වී ඇත.මුළු සංචාරක පැමිණීම්වලින් 41% ක් යුරෝපයෙන්ද, 6% ක් මැද පෙරදිගින්ද, 5% ක් ඇමරිකාවෙන්ද සහ 0.5 % ක් අප්‍රිකාවෙන්ද විය.ඉන්දියාව,චීනය එක්සත් රාජධානිය,ප්‍රංශය සහ ජර්මනිය යන රටවල් ශ්‍රී ලංකාවේ ඉහලම ජාත්‍යන්තර සංචාරකයින් උත්පාදනය කිරීමේ වෙළඳපලවල් 05 බවට පත්වුණි.

ශ්‍රී ලංකාව ලෝක චාරිකා සම්මාන උළෙලේදී "ආසියාවේ ප්‍රමුඛතම වික්‍රාමාන්විත සංචාරක ගමනාන්තය 2018 සම්මානයෙන් පිදුම් ලැබීය. එමෙන්ම,ලෝන්ලි ප්ලැනට් සඟරාව විසින් ශ්‍රී ලංකාව"2018 අංක 01 ගමනාන්තය" ලෙස හඳුනා ගන්නා ලදී.

ලොව පිළිගත් ගෝලීය සංචාරක ආයතන මඟින් 2018 වර්ෂයේ සංචාරය කිරීම සඳහා හොඳම ගමනාන්තය ලෙස ශ්‍රී ලංකා සංචරණ පිළිගෙන, සම්මානයට පාත්‍රකරන ලදී.

- නැෂනල් ජියොග්‍රැපික් ට්‍රැවලර් - 2018 විශිෂ්ට ලැයිස්තුව
- චීනයේ පීපල්ස් ඩේලි පුවත්පත - කාන්තා සංචාරකයින් සඳහා ඉහළම ගෝලීය ආරක්ෂිත ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව තෝරා ගෙන ඇත.
- නැෂනල් ජියොග්‍රැපික් - 2018 හොඳම වසන්ත සෘතු චාරිකා, ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය

### 3.2.1.2. බෙදා හැරීම්

#### අ) අළෙවිකරණය- වෙළඳපොළ/ මාර්ග සංදර්ශන

- චාරිකා හා සංචාරක වෙළඳ ප්‍රදර්ශන 56 ක් සඳහා සහභාගී වීම (Vakantibeurs-නෙදර්ලන්තය, Ferein-ඔස්ට්‍රියාව, Norwegian වෙළඳ ප්‍රදර්ශනය-නෝර්වේ, IITT චාරිකා වෙළඳ ප්‍රදර්ශනය - ඉන්දියාව,Vakan වෙළඳ ප්‍රදර්ශනය-ලක්සම්බර්ග්,MATKA-පින්ලන්තය,New York Times වෙළඳ දැක්ම-ඇමෙරිකාව, FESPO-ස්විට්සර්ලන්තය,SATTE -ඉන්දියාව,Brussels වෙළඳ ප්‍රදර්ශනය-බෙල්ජියම,IMTM - ඊශ්‍රායලය, Tourist - එස්තෝනියා, BIT- මිලාන්, Danish චාරිකා වෙළඳ ප්‍රදර්ශනය- ඩෙන්මාර්ක්, BIT - ඉතාලිය, Holiday World - චෙක් ජනරජය, JTTX වෙළඳ ප්‍රදර්ශනය-සවුදි අරාබිය, TITF- තායිලන්තය, GITF- චීනය, ASTINDO- ඉන්දුනීසියාව, ITB- ජර්මනිය, MITT-රුසියාව, NATAS- සිංගප්පූරුව, UITT- යුක්‍රේනය, සමුද්‍ර කිමිදුම් වෙළඳ ප්‍රදර්ශනය -ජපානය, RTF-සවුදි අරාබිය, ATM - එක්සත් අරාබි එමීර් රාජ්‍යය, SWTF- චීනය, KOTFA - කොරියාව, TTF-ඉන්දියාව, IITM- ඉන්දියාව, MATTA - මැලේසියාව, TTF - තායිලන්තය, Leisure- රුසියාව, IFTM-ප්‍රංශය, JATA- ජපානය,ILTM -චීනය,CITE-චීනය, CITM- චීනය, ITE-ඕස්ට්‍රේලියාව, WTM-එක්සත් රාජධානිය, TTF-තුර්කිය,TTG-ඉතාලිය, TT-වෝර්සෝ, පෝලන්තය).




- මාර්ග සංදර්ශන 28 ක් සඳහා සහභාගී වීම (Barcelona-ස්පාඤ්ඤය,Guangzhou- චීනය, Jeddah - සවුදිඅරාබිය, Riyadh - සවුදිඅරාබිය, Dammam - සවුදිඅරාබිය, Sharjah - එක්සත් අරාබි එමීර් රාජ්‍යය, Abu Dhabi- එක්සත් අරාබි එමීර් රාජ්‍යය, Dubai - එක්සත් අරාබි එමීර් රාජ්‍යය, Warsaw - පෝලන්තය, Krakow- පෝලන්තය, Budapest- හංගේරියාව,Hangzhou - චීනය, Wisakhapatnam-ඉන්දියාව, Coimbatore- ඉන්දියාව, Pune- ඉන්දියාව, Surat- ඉන්දියාව, Rajkot- ඉන්දියාව, Tokyo- ජපානය, Sapporo- ජපානය,Brussels-බෙල්ජියම,Chandigarh-ඉන්දියාව) ශ්‍රී ලාංකීය මෙන්ම විදේශීය චාරිකා ඒජන්තවරුන් සඳහා ඵලදායි ව්‍යාපාරික සංවර්ධන

අවස්ථා සලසා දෙමින් සංචාරක චාරිකා මෙහෙයවන්නන් සමඟ ව්‍යාපාරික ද්විපාර්ශවීය රැස්වීම් පවත්වන ලදී.






- ලන්ඩන් නගරයේ භොදම උමං මාර්ග ස්ථාන 10 ක ප්‍රචාරණය සිදුකිරීම - ප්‍රස්තර 48 කින් සමන්විත තිර 18 ක් සවිකිරීම. ප්ලැටිනම් ස්ථාන මධ්‍යම ලන්ඩනයේ ප්‍රධාන ස්ථානවල පිහිටා ඇති අතර, මෙම ස්ථාන ලන්ඩන් නගරයේ පදිකයින් වැඩිම පිරිසක් ගැවසෙන ස්ථාන වේ.






**ආ ) මහජන සම්බන්ධතා - ප්‍රචාරණය, ජාත්‍යන්තර චාරිකා බ්ලොග්කරුවන් හා සමාජ මාධ්‍යය**

- **CNN ජාත්‍යන්තර ප්‍රචාරණය**

  යුරෝපය, මැදපෙරදිග සහ අප්‍රිකාව, ආසියා පැසිෆික් කලාපය, දකුණු ආසියාව ආවරණය කරමින් ස්ථාන 1541 ක හා ඇමෙරිකාවේ ගුවන්තොටුපළ 40 ක CNN දර්ශන තිරවල මාස තුනක කාලයක් (03) සඳහා CNN හි ප්‍රචාරණය සිදුකිරීම. ප්‍රේක්ෂකයින් 800,000 ක් සඳහා තත්පර 15 වෙළඳ දැන්වීම් තුනක් විකාශනය කරන ලදී.









- ජාත්‍යන්තර මුද්‍රිත සඟරා ප්‍රචාරණය එනම්, ඉන්දියාව - Lonely Planet, ජර්මනිය - Abenteuer und Reisen und Reiseand Presie,එක්සත් රාජධානිය - Food and Travel සඟරාව, Escapism සඟරාව සහ Oxford Business Group සඟරාව,නෙදර්ලන්තය - Travelution සඟරාව, Azie and Down, බෙල්ජියම - Good Bye සඟරාව, ප්‍රංශය - Desire de Voyages, Grand Reportages,

එක්සත් අරාබි එමීර් රාජ්‍යය - Gulf පුවත්පත, ඕස්ට්‍රේලියාව - Holiday with Kids, ඉතාලිය – Guidavaige.




- දේශීය සඟරාවල ප්‍රචාරණය- Explore Sri Lanka සහ Time Out Sri Lanka සඟරාවල නොවැම්බර් සහ දෙසැම්බර් කලාප
- ඕස්ට්‍රේලියාව, ප්‍රංශය, යුක්‍රේනය, අයර්ලන්තය, ජර්මනිය, සයිප්‍රස්, තුර්කිය, කැනඩාව, පිලිපීනය, ඇමරිකා එක්සත් ජනපදය ,සිංගප්පූරුව, ඉන්දියාව, චෙක් ජනරජය, හා චීනය යන රටවල්වල ජාත්‍යන්තර බ්ලොග්කරුවන් 48 දෙනෙක් සඳහා සත්කාරකත්වය සපයන ලදි. රු.මි 35 ක මුළු වියදමකින් ශ්‍රී ලංකාව පිළිබඳ පලකිරීම් 750 ක් සිදුකර ඇත.උතුරු අර්ධද්වීපයේ ප්‍රදේශ (යාපනය, අනුරාධපුරය, නැගෙනහිර වෙරළ, ත්‍රිකුණාමලය, පාසිකුඩා, ආරුගම් බොක්ක ) මෙන්ම විවේකය ගතකිරීම සඳහා ආකර්ශනීය බඩල්කුඹුර, පොතුවිල්, මොණරාගල, යනාදි ස්ථානද ප්‍රසිද්ධ කරන ලදී. බ්ලොග්කරුවන්ගේ අවදානයට ලක්වූ ක්ෂේත්‍ර වූයේ, ස්වභාව ධර්මය, සංස්කෘතිය, වනජීවී, උරුමය, ඉවුම්පිහුම්, ජීවනක්‍රම, ස්වාභාවික දර්ශන යනාදියය.



- එක්සත් රාජධානිය, ඉන්දියාව, බහරේන්, හංගේරියාව, නෝර්වේ, ප්‍රංශය, කැනඩාව, දකුණු අප්‍රිකාව, බ්‍රසීලය, නෙදර්ලන්තය, කොරියාව, චෙක් ජනරජය, ජපානය යන රටවල් ආවරණය කරමින් මාධ්‍ය හුරුකරවීමේ චාරිකා සඳහා ජනමාධ්‍යවේදීන් 65 ක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේදී සත්කාරකත්වය සපයන ලදී. චාරිකා සඟරා, රූපවාහිනී වාර්තා වැඩසටහන්,මාර්ගගත නව වෙබ් පිටු හරහා මිලියන 185 ක පමණ මුළු ග්‍රාහක සංඛ්‍යාවක් කරා ළඟාවූ අතර රුපියල් මිලියන 213 ක ප්‍රචාරණ වටිනාකමක් අත්කරගන්නා ලදී.










- තවද, චෙක් ජනරජයේ පැවති TBEX යුරෝපා බ්ලොග්කරුවන්ගේ හා සමාජ මාධ්‍යකරුවන්ගේ රැස්වීමටද ඇමෙරිකාවේ පැවති TBEX අන්තර්ජාතික රචකයින්ගේ රැස්වීමටද ශ්‍රී ලංකා ප්‍රවර්ධන කාර්යාංශය සහභාගි විය.

- ශ්‍රී ලංකා සංචරණය මුහුණු පොතෙහි මුළු අනුගාමිකයන් සංඛ්‍යාව 47,125 ක් වන අතර My Eyes මුහුණු පොතෙහි මුළු අනුගාමිකයන් සංඛ්‍යාව 44,162 ක් වේ. ශ්‍රී ලංකා සංචරණ වෙබ් අඩවිය භාවිතා කරන්නන්ගේ සංඛ්‍යාව මිලියන 02ට වඩා අධිකය. ඉන්ස්ටග්‍රෑම් අනුගාමිකයන් සංඛ්‍යාව 31,300 ක් වන අතර ඡායාරූප 856ක් පළ කරන ලදී. ශ්‍රී ලංකා සංචරණ ටුවිටර් පිටුවෙහි මුළු අනුගාමිකයන් සංඛ්‍යාව 3636 ක් වන අතර පණිවුඩ 2,244 ක් පළකරන ලදී.





- වසර 20 ක් පැරණි කටුනායක පිහිටි ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය නවීකරණය කර 2018 ඔක්තෝබර් මාසයේදී විවෘත කරන ලද අතර සංචාරකයින්ට නව පෙනුමක් ලබාදීම සඳහා මහනුවර හා වැලිපැන්න සංචාරක තොරතුරු මධ්‍යස්ථාන ද ඉදි කෙරෙමින් පවතී.







- මගී ප්‍රවාහන නෞකාවල ජංගම සංචාරක තොරතුරු මධ්‍යස්ථාන 47 ක්ද ස්ථාපිත කරන ලදී.



- ප්‍රධාන සිදුවීම් ආවරණය කරමින් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මාධ්‍ය ඒකකය විසින් 2018 වර්ෂයේදී මාධ්‍ය නිවේදන 47 ක් නිකුත්කරන ලද අතර මාධ්‍ය සාකච්ඡා 07 ක් ද පවත්වන ලදී. සංචාරක දින දර්ශනයේ වැදගත් සිදුවීම් හා ජයග්‍රහණ කිහිපයක් පිළිබඳව තොරතුරු “Message in a Bottle 2018” යන ප්‍රවර්ධන වැඩසටහන යටතේ බෙදාහරින ලදි.

**ඇ) දේශීය සිදුවීම්**

- ප්‍රධාන ජාත්‍යන්තර ඉසව් හතරක් ශ්‍රී ලංකාවේ පවත්වන ලදී. විදේශීය මලල ක්‍රීඩකයින් 840 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව යකඩ මිනිසා සඳහා අනුග්‍රහය දරන ලද අතර මුළු මාධ්‍යය වටිනාකම ඇ.ඩො.මි. 4කි. විදේශීය ශිල්පීන් 40 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව සවුන්ඩ් ඔෆ් මියුසික් සංගීත උත්සවය සඳහා අනුග්‍රහය දරන ලද අතර මුළු මාධ්‍යය වටිනාකම ඇ.ඩො.මි 2කි. විදේශීය මලල ක්‍රීඩකයින් 300 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව රීඩ් ඇමසොන් ඉසව්වට ද විදේශිකයින් 750 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව ගාල්ල සාහිත්‍යය උත්සවයට ද අනුග්‍රහය දරන ලදී. එමෙන්ම, නවම් පෙරහැර, දුරුතු පෙරහැර, මහනුවර පෙරහැර, බුද්ධ රශ්මි වෙසක් සැමරුම, ආයුර්වේද ප්‍රදර්ශනය, ලෝක පාපන්දු කුසලානය ශ්‍රී ලංකාවට රැගෙන ඒම, සංචාරක උදාව, මම්මා මියා, ටුක් ටුක් 2018, ෆැසෙට් 2018 ආදිය වෙනුවෙන් ද අනුග්‍රහය දරන ලදී.






**ඈ) ගමනාන්ත සමාජ වගකීම (DSR)**

- නැව් තට්ටු මත පැවැත්වූ සංස්කෘතිකාංගද, සහිතව මගී යාත්‍රා ලෙස සන්නාමකරණය ලත් නෞකා 50ක් විසින් රැගෙන ආ මගීන් 74,500ක් සාදරයෙන් පිළිගන්නා ලදි. එමෙන්ම, ඩර්බන් නගරයේ පැවති IORA තෙවැනි වැඩමුළුවට ද සහභාගි විය. රාමායන වෙබ් අඩවිය දියත් කරන ලද අතර රාමායනය විද්‍යුත් අත්පොත රාමායන වෙබ් අඩවියට උඩුගත (upload) කරන ලදී. රාමායන වාර්තා වැඩසටහන

හා QR කේතය නිර්මාණය කරන ලදී. රාමායන වෙබ් අඩවිය ප්‍රවර්ධනය කිරීමට සමගාමීව, ඉන්දියාවේ පැවති ගෝලීය ආගමික සංචාරක සංවාදයට සහ නව දිල්ලි අගනුවර පැවති හතරවන රාමායන උත්සවය සඳහා ද සහභාගි විය.





### 3.3. මූල්‍යය කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

වගුව - 3.1

| යෝජිත ව්‍යාපෘති ක්‍රියාකාරකම් | 2018 වර්ෂය සඳහා අයවැය වෙන් කිරීම (රු. මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|
| අළෙවි හා ප්‍රවර්ධන | 1975.00 | 975.00 |
| ගෝලීය සන්නිවේදනය | 1864.00 | 383.00 |
| ගෝලීය මාර්ගගත ඩිජිටල් අලෙවිකරණය | 714.00 | 11.00 |
| දකුණු ආසියාවට දොරටුවක් | 40.00 | 4.00 |
| මාධ්‍යය හුරුකරවීමේ චාරිකා | 46.00 | 14.00 |
| අමුත්තන් සදහා පහසුකම් හා සංචාරක තොරතුරු මධ්‍යස්ථාන | 36.00 | 12.00 |
| බ්ලොග්කරුවන් හුරුකරවීමේ චාරිකා | 52.00 | 19.00 |
| දේශීය මාධ්‍යය වැඩසටහන | 12.00 | 1.00 |
| ප්‍රවර්ධනාත්මක ද්‍රව්‍ය නිෂ්පාදනය | 96.00 | 38.00 |
| නව නිෂ්පාදනය / නිෂේ ඒකක සංවර්ධනය කිරීම හා අළෙවිකරණය | 47.00 | 5.00 |
| දේශීය සිදුවීම් | 387.00 | 103.00 |
| ගමනාන්ත හා සමාජ වගකීම | 64.00 | 11.00 |
| එයාර්ලයින් සමාගම සමඟ වැඩ කිරීම | 25.00 | |
| සහය දැක්වීමේ මෙහෙයුම් | 401.00 | 180.00 |
| ප්‍රාග්ධනය | 8.00 | 4.00 |
| අතිරික්ත අරමුදල | - | 1000.00 |
| **එකතුව** | **5768.00** | **2760.00** |

*මූලාශ්‍රය: සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය*

## 3.4 අනුමත වාර්ෂික අයවැය, 2018.12.31 දිනට වියදම .

වගුව - 3.2

| විස්තරය | 2018 සඳහා මුළු අයවැය (රු. මි) | 2018.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|
| මුළු පුනරාවර්තන වියදම | 5760.00 | 2756.00 |
| මුළු ප්‍රාග්ධන වියදම | 8.00 | 4.00 |
| මුළු වියදම | **5768.00** | **2760.00** |

*මූලාශ්‍රය: සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය*

## 3.5 ප්‍රධාන අභියෝග

- **සෘජු ගුවන් සබඳතාවලින් තොරව ජර්මනිය, ප්‍රංශය හා ඉතාලියේ දී ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම**

  ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම 2016 ඔක්තෝබර් සිට බල පවත්වන පරිදි ෆැන්ක්පර්ට්,පැරිස් හා රෝමය දක්වා සෘජු ගුවන් සබඳතා නතර කරන ලද අතර එය ඉහත රටවල හා අසල්වාසි රටවල් වල සංචාරකයින්ගේ පැමිණීම සඳහා ප්‍රබල ලෙස බලපා ඇත්තේ ඔවුන් මැදපෙරදිග ස්ථාන හරහා පියාසර කිරීමට වඩා සෘජු ගුවන් සබඳතා කෙරෙහි ප්‍රියතාවයක් දක්වන හෙයිනි. මෙම ප්‍රධාන නගරවල සිට ශ්‍රී ලංකාවට වෙනත් සමාගම්වල ගුවන් යානා මෙහෙයුම් ආරම්භ කිරීමට හෝ කුලී ගුවන් මෙහෙයුම් ආරම්භ කිරීමට උත්සාහ දරමින් සිටී.

- **චීන භාෂාව කථා කරන මාර්ගෝපදේශකයන්ගේ හිඟය**

  චීන වෙළඳපළ වර්ධනය වෙමින් පවතින හෙයින්, ඉදිරි වර්ෂවල චීන භාෂාව සඳහා පවතින මෙම ඉල්ලුම සපුරාලීම සඳහා චීනයේ අධ්‍යාපන කටයුතුවල නියැලීමට ශිෂ්‍යත්ව පිරිනැමීම මඟින් මැන්ඩරින් භාෂා මාර්ගෝපදේශකයන් වැඩි වශයෙන් පුහුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

- **යටිතල පහසුකම් ගැටළු**

  වර්තමානයේ සංචාරකයින් විසින් සිදු කරන එක් ප්‍රධාන පැමිණිල්ලක් වන සංචාරකයින්ට මාර්ගවල වැඩි කාලයක් ගත කිරීමට සිදුවීම අවම කිරීම පිණිස කොළඹ මහනුවර අධිවේගී මාර්ගය ඉදිකිරීම කඩිනම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

- **දේශීය ගුවන් සබඳතා**

  උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා පිරිමැසුම්දායී/අඩු පිරිවැය සහිත දේශීය යානා මගින් සඳහා සංචාරකයින් ආකර්ෂණය කරගැනීමේ දී පවතින අවස්ථා ගවේෂණය කිරීම අවශ්‍ය වේ. ප්‍රබල ලෙස ප්‍රවර්ධනය කල යුතු අනෙකුත් නගරවලට සාපේක්ෂව කොළඹ නගරය ජනගහණය අතින් අධික වනු ඇති බව සඳහන් කළයුතු වේ.

## 3.6. ඉදිරි ගමන්මග

- **ඩිජිටල් ප්‍රචාරණ ව්‍යාපාරයක් දියත් කිරීම**

  2018 ඔක්තෝබර් 15 දින සිට ආරම්භ වී මාස 06 ක කාලයක් මෙම ඩිජිටල් ප්‍රචාරණ වැඩසටහන දියත් කිරීම සඳහා එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව හා චීනය වැනි මූලාශ්‍ර වෙළඳපළවල් 05 තුළ අදාල ප්‍රචාරණ සමාගම් පත් කර ඇත.

- **ශ්‍රී ලංකා සංචරණය සඳහා නව වෙළඳ නාමයක් දියත් කිරීම**

  2018 නොවැම්බර් 05 දින පැවති ලන්ඩනයේ ලෝක චාරිකා වෙළඳපොළේදී (WTM) නව වෙළඳ නාමයක් දියත් කරන ලදි.

- **ප්‍රධාන වෙළඳපළවල් අටක ගමනාන්ත නියෝජනය කිරීමේ සමාගම් පත් කිරීම**

  මහජන සබඳතා හා සමාජ මාධ්‍ය තුළින් අඛණ්ඩව ගෝලීය වශයෙන් පෙනී සිටීම සඳහා එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව, චීනය, මැදපෙරදිග, ජපානය හා ඕස්ට්‍රේලියාව යන ප්‍රධාන වෙළඳපළ අටෙහි ගමනාන්ත නියෝජනය කිරීමේ සමාගම්2 019 වර්ෂයේ දී පත් කරනු ලැබේ.

- **ගෝලීය සන්නිවේදන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම**

  2019දී ජර්මනියේ බර්ලින්වල පැවැත්වීමට නියමිත ITB චාරිකා පොළ ආරම්භ කරමින් නව වෙළඳ නාමකරණ අනන්‍යතාවල ලොව පුරා ඉදිරියට ගෙනයාම සඳහා ගෝලීය සන්නිවේදන වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙය ශ්‍රී ලංකාව ලෝකයට ඉදිරිපත් කිරීමේ දී සියලු ඵලදායී මාධ්‍ය ආවරණය කරමින් සිදු කරන විස්තීර්ණ වැඩසටහනකි.

# 4.

# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය



## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

### 4.1 ආයතනයේ දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ අධ්‍යාපන සේවා ආයතනයක් වන ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය 1964 දී ලංකා හෝටල් පාසල ලෙස ආරම්භ කරන ලදී. එය රටේ සංචාරක කර්මාන්තය සහ ආගන්තුක සත්කාරය තුළ පුරෝගාමී හා ප්‍රමුඛ අධ්‍යාපන ආයතනයයි. මෙම ආයතනය සංචාරක සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ස්වාධීන ආයතනයක් බවට පත් වෙමින් 2007 වසරේදී, ශ්‍රීලංකා සංචාරක මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීම සමග ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) ලෙස නම වෙනස් කරන ලදී. සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තයේ සංවර්ධනය සමග රටේ පුළුල් ලෙස ව්‍යාප්ත වෙමින් පවතින සංචාරක අංශය අනුව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මගින් මනා පුහුණුව ලත් ඇප කැප වූ කළමනාකරණ විශේෂඥ කළමනාකාරීත්වයක් සමඟ දේශීය හා විදේශීය හෝටල් හා සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර සංවර්ධන අවශ්‍යතා සපුරාලීමට ඉතා අගනා වෘත්තීය පුහුණුවක් ලබාදේ.




රූප සටහන 4.1: කොළඹ හා ප්‍රාදේශීය වශයෙන් පාසැල් පිහිටුවා ඇති ස්ථාන

### 4.2 අධ්‍යයන වැඩසටහනේ ප්‍රගතිය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් සංචාරක කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන් සඳහා ඔවුන්ගේ දැනුම වැඩිකිරීමට සහය දක්වන අතර ඔවුන්ගේ වෘත්තිය මට්ටමද ඉහළ නංවයි. අපගේ පළාත් විද්‍යාල මගින් රට පුරා පවතින බොහෝමයක් පළාත් නියෝජනය කරනු ලබයි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මගින් පවත්වනු ලැබූ පාඨමාලා හා 2018 වර්ෂයේ ආයතනයට ඇතුළත් වූ සිසුන් පහත වගුව මගින් දැක්වේ.

**2018 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සිසුන්ගේ සාරාංශය** වගුව- 4.1

| පාඨමාලාව | 2018 | 2018 |
|---|---|---|
| | පුරෝකථනය | සත්‍යය |
| ශිල්පීය මට්ටම | 1,125 | 1,055 |
| සහතික පත්‍ර මට්ටම | 2.025 | 1,750 |
| අන්තර් මධ්‍ය මට්ටම | 90 | 63 |
| උසස් මට්ටම | 90 | 58 |
| තුන් අවුරුදු කළමනාකරණ මට්ටම | 180 | 213 |

| | | |
|---|---|---|
| ප්‍රේස්ට් හා බේකරි (මාස 03) | 250 | 68 |
| ආධුනිකත්ව වැඩසටහන | 1200 | 375 |
| ජාතික සංචාරක මාර්ගෝපදේශක | 80 | 63 |
| සංචාරක රියදුරු මාර්ගෝපදේශක | 80 | 101 |
| ප්‍රාදේශීය මාර්ගෝපදේශක | 130 | 49 |
| සංග්‍රහ කටයුතු මාර්ගෝපදේශක | 50 | 18 |
| වෙනත් ආයතන සඳහා විශේෂ වැඩසටහන් | 1200 | 1030 |
| අමාත්‍යාංශ වැඩසටහන් | - | 2207 |
| ලොන්ඩරි මෙහෙයුම් | 60 | - |
| සූපවේදී සහායක | 70 | - |
| සහතික ලත් සත්කාරක මූල්‍ය හා කළමනාකරණය | 140 | 109 |
| **එකතුව** | **6,770** | **7,159** |

*මූලාශ්‍රය:ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ශිෂ්‍යපාදක තොරතුරු*

**පාඨමාලා අනුව නිමැවුමේ වර්ධනය 2015-2018** **වගුව 4.2**

| පාඨමාලාවේ නම | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| ශිල්පීය මට්ටම | 609 | 858 | 823 | 1,055 |
| සහතිකපත්‍ර මට්ටම | 1618 | 1,303 | 1,557 | 1,750 |
| අන්තර් මධ්‍ය මට්ටම | 73 | 43 | 65 | 63 |
| උසස් මට්ටම | 70 | 45 | 65 | 58 |
| තෙවසර කළමනාකරණ ඩිප්ලෝමා | 55 | 162 | 183 | 213 |
| ප්‍රේස්ට් හා බේකරි පාඨමාලාව | 51 | 53 | 162 | 68 |
| ආධුනිකත්ව පුහුණු වැඩසටහන | 170 | 369 | 565 | 375 |
| ජාතික සංචාරක මාර්ගෝපදේශක වැඩසටහන | 62 | 93 | 56 | 63 |
| සංචාරක රියදුරු මාර්ගෝපදේශක වැඩසටහන | - | 62 | 38 | 101 |
| අනෙකුත් පාඨමාලා | 87 | 1,243 | 1,814 | 3,413 |
| **එකතුව** | **2,795** | **4,231** | **5,328** | **7,159** |

*මූලාශ්‍රය:ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ශිෂ්‍යපාදක තොරතුරු*

## 4.3 4.3. වැඩසටහන්/ ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය 2018

2018 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පහත ව්‍යාපෘති සාර්ථකව පවත්වන ලදි.

- **පළාත් හෝටල් පාසල් ජාලය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම (යාපනය)**

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට යාපනයේ සිසුන් 110 දෙනෙකු සඳහා ආධුනිකත්ව පුහුණු කිරීමේ වැඩසටහන පැවැත්වීමට හැකි වූ අතර එම වැඩසටහනින් අනතුරුව, යාපනය විශ්ව විද්‍යාලයේ හා උතුරු පළාත් සභාවේ සහය ඇතිව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ යාපනය මණ්ඩපය ස්ථාපිත කරන ලදි. 2018 නොවැම්බර් කණ්ඩායම වෙනුවෙන් සහතික පත්‍ර වැඩසටහන සඳහා අයදුම්පත්‍ර කැඳවන ලදි. යාපනයේ යෝජිත සරසවිය මඟින් වාර්ෂිකව සිසුන් 400 දෙනෙකුගේ අවශ්‍යතා සපුරාලන බව පුරෝකථනය කර ඇත.

- **අධ්‍යයන සහයෝගිත්වය /නව පුහුණු නිපැයුම් ප්‍රවර්ධනය.**

වික්‍රමාන්විත සංචරණය සඳහා අගමැතිතුමාගේ කාර්ය සාධක බලකායේ හා තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිසමේ සහයෝගිත්වය ඇතිව, වික්‍රාමාන්විත සංචරණය සඳහා NVQ සහතිකපත්‍ර මට්ටමේ නව වැඩසටහන් 04 ක් දියත් කරන ලදි. මෙමඟින්, භූමිය,අහස සහ ජල මූලාශ්‍ර කරගත් වික්‍රමාන්විත ක්‍රියා සහිත සංචාරක අංශයේ වෘත්තිය පුහුණුව සඳහා වැඩිවන ඉල්ලුම පිළිබඳ අවධානය යොමු කළ හැකිය.

එමෙන්ම,කර්මාන්තයේ වෘත්තියවේදීන්ගේ සහයෝගිත්වය ඇතිව සෞඛ්‍යය හා ශරීර සුවතා සංචරණය පිළිබඳ හා සංචාරක සිද්ධි සිදු කෙරෙන ක්ෂේත්‍රවල විෂයමාලා සකස් කරන ලදි.

එකම ජාලයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, පළාත් පුහුණුව සඳහා සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ,පළාත් සංචාරක අධිකාරීන් හා පළාත් සංචාරක පාර්ශවකරුවන් සමඟ ජාලගත වැඩමුළුවක් පවත්වන ලදි. මෙම වැඩසටහන යටතේ, පුහුණු සම්පත් හා විශේෂඥතාව හුවමාරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් සබරගමුව විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පසුගිය දශකයේදි ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ගේ අවශ්‍යතාව දැඩිව මතුවූ හෙයින් ආයුර්වේද ශරීර සුවතා සංචරණය පාඨමාලාවක්ද ආරම්භ කලේය.

එමෙන්ම, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය හා තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිසමේ සහයෝගිත්වය ඇතිව, සිදුවීම් කළමනාකරණය පිළිබඳව විධායක ඩිප්ලෝමා පාඨමාලාවක් ද ආරම්භ කළේය.

- **පීඨයේ ධාරිතා සංවර්ධනය**

ජාත්‍යන්තර මට්ටමේ පුහුණුකරුවන් සංවර්ධනය කිරීමේ පියවරක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සියළුම පුහුණුකරුවන්, සත්කාරක අධ්‍යාපන ක්ෂේත්‍රයේ වඩාත්ම පිළිගත් ජාත්‍යන්තර සුදුසුකම වන ඇමරිකානු හෝටල් හා නවාතැන් සංගමයේ සහතිකලත් සත්කාරක අධ්‍යාපන වැඩසටහන සඳහා සහභාගී වූහ.

- **දේශීය හා විදේශීය අධ්‍යයන සබඳතා.**

  ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සිසුන්ගේ හා ඔවුන්ගේ වෘත්තීය රැකියාවේ මට්ටම වැඩිදියුණුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් සූප වේදීන්ගේ සංසදය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

- **අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධනය**

  අනධ්‍යන කාර්ය මණ්ඩලයේ සේවකයින් මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුවකට සහභාගීකර වූ අතර සේවකයින් තිදෙනෙක් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ වැඩමුළුවකට සහභාගීකර විය. එමෙන්ම, සේවකයින් 50 දෙනෙක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ වැඩමුළුවකටද සහභාගී විය. 2018 අංක 19 දරන ජාතික විගනණ පනත පිළිබඳව පුහුණුවක්ද ලබාදෙන ලදී.

  කාර්යසාධන කළමනාකරණය සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක සකස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- **ජාතික සංචාරක මානව සම්පත් මූලෝපාය සංවර්ධනයට දායකවීම.**

  ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මඩකලපුව, අම්පාර හා මන්නාරම යන ප්‍රදේශවල දැනුවත් කිරීමේ වැඩසටහන්, වෘත්තීය මාර්ගෝපදේශ, පුහුණු හා ජාල ඉසව් පැවැත්වීම ආරම්භකරන ලදි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය අලුතින් ඇතුලත් වන්නන් වෙනුවෙන් ඇති සත්කාරක අධ්‍යාපනය පිළිබඳ තොරතුරු මෙම වැඩසටහන් වලදී සපයයි. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව මෙම වැඩසටහන් සඳහා මූල්‍ය සහය සපයයි.

- **සිදුවීම් කළමනාකරණ ඒකකය ස්ථාපිත කිරීම.**

  වර්ධනය වන සංචාරක කර්මාන්තය හා හෝටල් කළමනාකරණ ක්ෂේත්‍ර සඳහා වැඩමුළු පැවැත්වීමට හා පුහුණු විසඳුම් හඳුනාගැනීම සඳහා සිදුවීම් කළමනාකරණ ඒකකය ස්ථාපිත කරන ලදි. මෙම ඒකකය මඟින්, සෞඛ්‍යය හා ශරීර සුවතා සංචරණය හා වික්‍රමාන්විත ක්‍රියා ඇතුලත් සංචරණය පිළිබඳ පුහුණු සැසි 02 ක් පවත්වන ලදි.මෙම වැඩමුළුවලින් අනතුරුව, ඉහත ක්ෂේත්‍ර දෙක සඳහා වැඩසටහන් සංවර්ධනය කරන ලදි.

- **මාධ්‍යය හා සන්නිවේදන ඒකකය ස්ථාපිත කිරීම.**

  සංචාරක හා හෝටල් කළමනාකරණය සඳහා ආකර්ෂණය ඇති කර ගැනීමට වැඩිවෙමින් පවතින ඉල්ලුම සැලකිල්ලට ගනිමින් සංචාරක හෝ සියළුම ප්‍රවර්ධන හා සන්නාම ගොඩනැංවීමේ උත්සාහයන් ඒකාබද්ධ කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මඟින් මාධ්‍යය හා සන්නිවේදන ඒකකය ස්ථාපිත කරන ලදි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වෙබ් අඩවිය අලුත්වැඩියා කිරීම, මුද්‍රිත සහ මාධ්‍ය ආවරණය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා සමාජ මාධ්‍ය වේදිකාවන් දියත් කිරීම සඳහා මෙම ඒකකය සම්බන්ධ විය. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අලුතින් ස්ථාපිත ෆේස්බුක් පිටුව සඳහා දැනටමත් 2018 වර්ෂය තුළ අනුගාමිකයන් 60,000 ක් ආකර්ෂණය වී ඇත.

- **සාක් ශිෂ්‍යත්ව.**

  2017 වසරේදී, සාර්ක් සංවිධානය හරහා භූතාන සහ නේපාලයේ සිසු සිසුවියන්ට ශිෂ්‍යත්ව දෙකක් පිරිනමනු ලැබීය.මෙමගින්,සාක් කලාපය තුළ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ප්‍රතිරූපය ඉහල නංවන අතර 2018 වර්ෂයේදී, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සිසුන් සඳහා සාක් හුවමාරු වැඩසටහනක් ආරම්භ කිරීමට සැළසුම් කරයි.

- **ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සිසුන් සඳහා සැල්ස්බර්ග් (SALZBURG) හෝටල් පාසැලෙන් ද්විත්ව ශිෂ්‍යත්ව වැඩසටහන.**

  ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාධාරින් 10 දෙනකු සඳහා ඕස්ට්‍රියාවේ කීර්තිමත් සැල්ස්බර්ග් හෝටල් පාසලෙන් ශිෂ්‍යත්ව පිරිනමන ලදි. සැල්ස්බර්ග් පාසැල සෑම වසරක් සඳහාම ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩි ප්‍රමාණයක් පිරිනැමීමට අපේක්ෂාවෙන් සිටී.

- **අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සඳහා සංචාරක සත්කාරකත්වය සඳහා විෂය නිර්දේශය වැඩි දියුණු කිරීම.**

  ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය 13 වසර පාසැල් විෂය නිර්දේශයේ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන දායකයා ලෙස සම්බන්ධ වූ අතර වර්තමානයේ පාසැල්වල උපයෝගි කොට ගනු ලබන අ.පො.ස (උ.පෙළ) සංචාරක විෂයේ විෂය නිර්දේශය වැඩි දියුණු කළේය. මෙම විෂය නිර්දේශය සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සරසවි ජාලය මගින් මේ වනවිටත් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා සම්බන්ධ වන අතර දිවයින පුරා ගුරුවරුන් 1000 ක් පමණ පුහුණු කරනු ලැබේ.

- **පවත්නා/දියුණුකල හැකි පුහුණු මධ්‍යස්ථාන තුළින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පුහුණුව පුළුල් කිරීම සඳහා උපාය මාර්ගයක්/ආදර්ශයක් සංවර්ධනය කිරීම.**

  සංචාරක අධ්‍යාපනික ආයතන ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ලියාපදිංචි වීම.සත්කාරක හා සංචාරක මානව සම්පත් සංවර්ධනයේ වර්ධනය වන ඉල්ලුම පිළිබඳ සළකා බැලීමේ එක් අංශයක් වශයෙන් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය පුමුඛතම ආයතනයක් වශයෙන් පෞද්ගලික සංචාරක හා සත්කාරක ආයතනය වෙත ලියාපදිංචිය සඳහා ආරාධනා කරයි. දැනටමත් ආයතන 20ක් සිය කැමැත්ත පළ කරන ලද අතර යෝජනා ද ලබා දී ඇත. වර්ෂ 2019 සිට ඉන් ඉදිරියට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මෙම ආයතනය සඳහා සහයෝගය දක්වනු ලබන අතර, වැඩසටහන් වැඩි ප්‍රමාණයක් පිරිනැමීම සඳහා බලගන්වනු ලබන අතර මෙම වැඩසටහන් තුළින් ඉහළ ගුණත්වයක් ළගා කර ගනු ලැබේ.

- **පාසැල් සංගම් ජාලය.**

  පාසැල් මට්ටමින් සංචාරක හා සත්කාරක කර්මාන්තය පිළිබඳ කැමැත්ත ඇතිකිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව පාසැල් සංචාරක සංගම් ආරම්භ කළේය. දිවයින පුරා පාසැල් සංගම් 100 ක් පමණ ස්ථාපිත කරන ලද අතර වර්ෂය අවසානය වනවිට තවත් සංගම් 300 ක් ආරම්භ කර ඇත.මෙම සංගම් ජාලය මගින්, පාසැල් සිසුන් සඳහා සංචාරක ආකර්ෂණය ඇතිකිරීම සඳහා මෙන්ම ඔවුන් ක්‍රියාකාරීව සංචාරක කර්මාන්තයේ නියැලීම සඳහාද කටයුතු කරනු ලබයි.

- **ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සන්නම් නාමය නිර්මාණය කිරීම.**

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ගීය හා වීඩියෝව නිර්මාණය කිරීම අවසන් කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සිසුන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පැවති 2018 ආහාර ප්‍රදර්ශනයේ ඉවුම් පිහුම් කලා අංශයෙන් පදක්කම් 09 ක් දිනාගෙන ඇත. 2018 ශ්‍රී ලංකා සංචාරක සම්මාන ප්‍රදානෝත්සවයේදී විශිෂ්ටතම සංචාරක අධ්‍යාපන හා පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සම්මානයෙන් පිදුම් ලැබීය.

## 4.4 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ දළ විශ්ලේෂණය

වගුව- 4. 3

| යෝජිත ක්‍රියාකාරකම | වෙන්කිරීම (රු.මි) | සත්‍ය වියදම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| පසුගිය වර්ෂයට සාපේක්ෂව සිසු පුහුණු නිමවුම්වල අවම වශයෙන් 30% ක වර්ධනයක් ළඟා කර ගැනීම | 453 | 443 | 98% |
| අධ්‍යයන කටයුතු මණ්ඩල හා විෂය මාලාව සමාලෝචන කමිටු පිහිටුවීම | 6 | 0.28 | 5% |
| තත්ව කළමනාකරණ පද්ධති පිහිටුවීම | 2.5 | 0.48 | 19% |
| සංවිධානයක් ලෙස හා පුහුණු වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් (NVQ) තත්ව මට්ටම අත්කරගැනීම | 0.95 | 0.48 | 50% |
| අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ සංවර්ධනය | 10 | 7.23 | 72 |
| දේශීය හා විදේශීය අධ්‍යයන සබඳතා | 1 | - | - |
| කර්මාන්ත-අධ්‍යයන සහයෝගීතාව/නව පුහුණු නිෂ්පාදන සංවර්ධනය | 9 | 1.6 | 18% |
| කර්මාන්ත වලින් යුත් පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් සංවර්ධනය කිරීම | 2 | - | - |
| පළාත් හෝටල් පාසල් ජාලය වැඩිදියුණු කිරීම හා පුළුල්කිරීම | 202 | 55 | 27% |
| පවත්නා/දියුණුකල හැකි පුහුණු මධ්‍යස්ථාන තුළින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පුහුණුව පුළුල් කිරීම සඳහා ක්‍රමෝපායක්/ආදර්ශයක් සංවර්ධනය කිරීම | 3 | 0.8 | 27% |
| තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය | 6 | 0.11 | 1.83% |
| අවශ්‍ය මානව සම්පත් ලබාගැනීම | 8.16 | 4.8 | 59% |
| අනධ්‍යයන කාර්ය මංඩලය සඳහා ධාරිතා වර්ධනය | 5.7 | 3.17 | 56% |
| ජාතික සංචාරක මානව සම්පත් මූලෝපාය සංවර්ධනයට දායකවීම | 13.5 | 13.5 | 100% |
| මාධ්‍ය හා සන්නිවේදන ඒකක තුළින් කාර්යයන් ස්ථාපිත කිරීම හා ඵලදායිව ක්‍රියාත්මක කිරීම | 28.8 | 7.4 | 26% |
| සමාජ මාධ්‍ය හා ඩිජිටල් අලෙවිකරණය | 2.4 | 2.28 | 95% |

| | | | |
|---|---|---|---|
| පාසැල් සංචාරක සංගම් ජාලය ස්ථාපිත කිරීම | 5 | 0.4 | 8% |
| වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන ඒකක/රැකියා බැංකුව හෝ වෘත්තීය කළමනාකරණ පද්ධතිය | 1 | - | - |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ සන්නම් නාමය නිර්මාණය කිරීම | 1.4 | 0.71 | 51% |
| සිදුවීම් සඳහා සහභාගිවීම (චාරිකා හා සංචාරක ක්ෂේත්‍රයේ විවිධ අංශ කේන්ද්‍ර කරගත් වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම) | 2 | 0.83 | 42% |
| දේශීය හා විදේශීය කොටස්කරුවන් සමඟ හවුල් සබඳතා | 1 | - | - |
| **එකතුව** | **764** | **543** | **71%** |

*මූලාශ්‍රය:* මූල්‍ය අංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.

## 4.5 ප්‍රධාන අභියෝග

- **ඊළඟ පරම්පරාව සංචාරක කර්මාන්තය සඳහා ඇති අඩු ආකර්ශනය.**

  ඊළඟ පරපුර/ සහශ්‍රකය ආකර්ශනය ඉතා අඩුවේ. විශේෂයෙන්, කර්මාන්තය මගින් සංචාරක කර්මාන්තයේ සේවා යෝජකයා ලෙස වෙළඳ නාමකරණ කිරීම තොරතුරු තාක්ෂණය, බැංකුකරණය, සෞඛ්‍යය, ආරක්ෂාව යනාදි ක්ෂේත්‍ර සංසන්දනාත්මකව බැලීමේදී සැලකිය යුතු ලෙස අඩු අගයක් ගනී.බොහෝ සාධක එක්ව ගත් කල අඩු වැටුප් මට්ටම හා සංස්කෘතික වශයෙන් සිදුවන බාධා වීම් යනාදීය කර්මාන්තය පිළිබඳ අශුභවාදී ප්‍රතිරූපය හා අඩු ආකර්ශනය ඇතිවීම සඳහා හේතු විය. මෙම තත්වය අනුව, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා වර්තමානයේ අඩු ඉල්ලුමක් පවතින අතර එය ආයතනයේ ධාරිතාවට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය අනෙක් කර්මාන්තයන් සමඟ බලන විට බොහෝ අංශ වලදී ආකර්ෂණය ඇති කිරීම හා කර්මාන්තයේ වෙළඳ නාමය ගොඩ නැංවීමේදී ක්‍රියාකාරීව සම්බන්ධ විය. එහෙත් දිවයින පුරා ගත් ඒකාබද්ධ උත්සාහය නිසා දැඩිව ආකර්ශනය වැඩි කිරීමේ අවශ්‍යතාවක් පවතී.

- **ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා සම්පත් දායක පුද්ගලයන් හා කථිකාචාර්යවරුන් ආකර්ශනය කර ගැනීම.**

  කර්මාන්තයේ ඉල්ලුම වැඩිවීම හේතු කොටගෙන සංචාරක කර්මාන්තයෙන් උත්පාදනය වූ ආදායම අධ්‍යයන ආයතනයකට වඩා ඉහළ වන බැවින්, කර්මාන්තයේ වැඩිවන ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වෙත සම්පත්දායක පුද්ගලයන් හා කථිකාචාර්යවරුන් ආකර්ශනය කර ගැනීම අභියෝගයක් ව ඇත.

- **ප්‍රජාව අතර කර්මාන්තය පිළිබද පවතින අශුභවාදී ආකල්පය.**

  සංචාරක කර්මාන්තය අනෙකුත් කර්මාන්තවලින් වෙනස්වීම හේතුවෙන් සංචාරක කර්මාන්තය සඳහා ප්‍රජාව අතර පවතින සංකල්පය වෙළඳ නාමකරණයේදී හා සංවර්ධනය කිරීමේදී ඉතා වැදගත් වේ. මත්පැන් භාවිතය, විවිධ අරමුණු සඳහා නවාතැන්,නවාතැන් පහසුකම් යනාදිය භාවිතා කරන බැවින් ප්‍රජාව අතර සංකල්පය අශුභවාදී වේ. කර්මාන්තයේ වර්ධනය පිළිබද පවතින මතය ද අශුභවාදී වේ.

එබැවින් සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ප්‍රජා සහයෝගය ලබා ගැනීම අභියෝගාත්මක වේ.

- **සිසුන් හා ප්‍රජාව අතර සන්නිවේදන බාධක.**

  භාෂාව විදේශිකයන් සමග ඍජුව සම්බන්ධ වන බැවින් සංචාරක අංශය සඳහා භාෂාව යොදා ගැනීම ඉතා වැදගත් වේ.හොඳ සේවයක් සැලසීම සඳහා අමුත්තාගේ සංස්කෘතිය හා පසුබිම අවබෝධකර ගැනීම විධිමත් සන්නිවේදනය සඳහා අවශ්‍ය වේ. සන්නිවේදන හා භාෂා බාධක පවතින සිසුන් හා කර්මාන්තයේ දැනටමත් නියැලී සිටින සේවා දායකයන් හේතුවෙන් ආදායමේ ගුණාත්මකභාවයේ අඩුවක් සිදුවේ.

## 4.5. ඉදිරි ගමන්මග

- ජනමාධ්‍ය තුළින් (විද්‍යුත්/මුද්‍රිත) වෙළඳ නාමකරණය ගොඩ නැංවීම හා සංචාරක හා සත්කාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.
- සංචාරක හා කලාපීය මට්ටමේ වෘත්තීය මාර්ගෝපදේශනය හා දැනුවත්භාවය.
- පුද්ගලික සත්කාරක අංශයේ පුහුණු ආයතන සමග ජාලකරණය තුලින් සංචාරක කර්මාන්තයේ ඉල්ලුම සමඟ සසඳා බැලීමට පුහුණු වන්නන් සංඛ්‍යාව වැඩි කිරීම.
- සංචාරක අංශයේ සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය වර්ධනය සඳහා සහය දක්වමින් සංචාරක පුහුණු විකල්පයන් උසස් කිරීම.
- නව සංචාරක ඉල්ලුම් සමඟ ගැළපෙන පරිදි අඛණ්ඩ හා ගතික විෂය මාලාව සංවර්ධනය කිරීම.
- ඉගැනුම් කළමනාකරණය සහ ඉ- ඉගැනුම් සඳහා සහය දැක්වීම සඳහා තොරතුරු තාක්ෂණය යටිතල පහසුකම් සංවර්ධනය .
- අධ්‍යයන හා පළාත් පුහුණු ජාලය ශක්තිමත් කරමින් ජාතික සංචාරක මානව සම්පත් ක්‍රමෝපාය සංවර්ධනය උදෙසා දායක වීම.

## 4.6 වැඩසටහන් /ඇතැම් ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය.






උපාධි ප්‍රදානෝත්සවය -2018















ශිෂ්‍යත්ව වැඩසටහන -2018



වෙරළ පිරිසිදු කිරීමේ ක්‍රියාකාරකම්



SLITHM පුවත් හසුන එළිදැක්වීම



2018 Food Expo ආහාර ප්‍රදර්ශනයේ ඉවුම් පිහුම් කලා අංශයේ තරඟ වලට SLITHM සිසුන් සහභාගී වීම



සිදුවීම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව ආරම්භ කිරීම



**ආපනශාලා හා බිමහල් සේවා සැකසීම් කාර්යය - 2018**



**සංචාරක උදාව ප්‍රදර්ශනය**



**2018 ශ්‍රී ලංකා සංචාරක සම්මාන ප්‍රදානෝත්සවයේදී විශිෂ්ටතම සංචාරක අධ්‍යාපන හා පුහුණු ආයතනය ලෙස SLITHM සම්මානයෙන් පිදුම් ලැබීම.**



**බහිර්ගාමී පුහුණු වැඩසටහන - 2018 කුකුළේ ගඟ**

## 4.7 අමතර ක්‍රියාකාරකම් 2018

වගුව - 4.4

| වැඩසටහන | සංවිධානය | කාල සීමාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - යාපනය- ආධුනිකත්ව පුහුණු- වැඩසටහන | SLITHM | මාස 03 | 110 |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අවසන් වසර සිසුන් සඳහා සරල දක්ෂතා වර්ධන වැඩසටහන | SLITHM | දින 01 | |
| තිරසර සංචාරක දැනුවත් භාවය පිළිබඳ වැඩසටහන - මන්නාරම දිස්ත්‍රික්කය-පාසැල් සිසුන් -ගුරුවරුන් / දෙමව්පියන්/ගොවීන් | SLITHM+IFC ලෝක බැංකුව | මාස 01 (දින 15) | 800 ට වැඩි |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ප්‍රසිද්ධ හෝටල් සමග සංඛ්‍යාංක පරිණාමනය | SLITHM | | |
| යාපනයේ සිසුන් සඳහා හුරු කරවීමේ චාරිකාව යාපනයට සිදුකිරීම -සංචාරක අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලදි. | SLITHM | දින 02 | 15 |
| වෘත්තිය මාර්ගෝපදේශන දිනය-යාපනය | SLITHM + ශක්ති එෆ්.එම්. | දින 01 | 60 |
| පුද්ගල හැඩගැන්වීමේ වැඩසටහන- කොළඹ ටෙලිකොම් කාන්තා කාර්යමණ්ඩලය ( කාන්තා දිනයේදී) | ටෙලිකොම් | දින 1/2 | 600 |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - යාපනය ආධුනිකත්ව පුහුණු වැඩසටහන | SLITHM | මාස 01/ සති අන්තය | 110 |
| නිවාඩු නිකේතන භාරකරුවන් සඳහා වෘත්තීය පරීක්ෂණය | ලංකා විදුලිබල මණ්ඩලය (LECO) | දින 01 | |
| NAITA - විෂය නිර්දේශය වැඩි දියුණු කිරීම | NAITA - රාජගිරිය | දින 4-5 | |
| NIE ජාතික අධ්‍යාපන ආයතනය ( ගුරු පුහුණුව) | ජාතික අධ්‍යාපන ආයතනය.මහරගම | දින 6 | |
| ගුරු පුහුණු වැඩසටහන, හොරණ (ප්‍රායෝගික) | හොරණ කලාපය - ගුරුවරුන් | දින 01 | |
| ප්‍රංශ අනුබද්ධ වැඩසටහන පිළිබඳව සාකච්ඡාව | ප්‍රංශ තානාපති කාර්යාලය හා සන්ධානය | පැය 02 | |
| ප්‍රසම්පාදන කටයුතුවලට සම්බන්ධ වීම හා මුළුතැන්ගෙය නිර්මාණය කිරීම | බන්ධනාගාරය (අගුණකොළපැලැස්ස) | දින 2 | |
| කෙටිකාලින පාඨමාලා සඳහා සම්බන්ධවීම | කෙටි කාලීන පාඨමාලා (සෙන/ඉරිදා SLITHM) | මාස 1 | |
| Future Minds අධ්‍යාපනික ප්‍රදර්ශනය | නාලන්දා විද්‍යාලය (NJOBA) | දින 3 | |
| සුපවේදීන්ගේ සංගමය | ආහාර ප්‍රදර්ශනය 2018 | දින 1 | |
| Ed-excelප්‍රදර්ශනය | රාජකීය විද්‍යාලය, ආදි ශිෂ්‍ය සංගමය | දින 3 | |
| හෝටල් දැක්ම | CHSGA | දින 3 | |
| සංචාරක උදාව | SLAITO/SLTPB | දින 2 | |
| ජාතික යොවුන් දින සැමරුම | තරුණ මධ්‍යස්ථානය ( මහරගම) | දින 1 | |
| SLIDA මඟින් සංවිධානය කරන ලද අන්තර්ජාතික ප්‍රජා කාන්තා දිනය සැමරුම පෙබරවාරි 28 | SLITHM/SLIDA | පැය 2 | |
| ප්‍රායෝගික දැනුවත්වීමේ සැසිය | අධ්‍යාපන අමාත්‍යාංශය හා මරීනා ප්‍රධාන සූපවේදී වැඩසටහන | දින 1 | |

*මූලාශ්‍රය: මූල්‍ය අංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය.*

SRI LANKA
CONVENTION BUREAU

# 5.
# ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය



# 5. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

## 5.1 හැඳින්වීම

- ශ්‍රී ලංකාවේ විශේෂ අවස්ථා සැලසුම් කිරීමේදී සහ සංවිධානය කිරීමේදී සැලසුම් ශිල්පීන් හමුවීමට, ධෛර්යමත් කිරීමට, තොරතුරු එක්රැස් කිරීමට හා සංවිධානය කිරීමට, උපදෙස් සහ විශේෂඥ ඥානය ලබාදීමට සාකච්ඡා පැවැත්වීමට ඉතා අගනා ස්ථානය වන්නේ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයයි. මෙම කාර්යාංශය MICE අවස්ථා සඳහා ස්ථානයක් පමණක් නොව සියලු අමුත්තන් සහ නියෝජිත කණ්ඩායම් හට සෑහීමකට පත්වන පරිදි මෙම අවස්ථාවන්හිදි විශිෂ්ට ආකාරයට කර්මාන්තය සහ ජාතික ගුවන් ගමන් සමඟ ඉතා සමීපව කටයුතු කරයි.
- සේවා අවශ්‍යතා විමසා බැලීමේ සිට අලෙවි කටයුතු දක්වා පුලුල් පරාසයක සේවා කාර්යාංශය විසින් සපයනු ලබයි. පර්යේෂණවල යෙදීම, විශේෂ අවස්ථා සඳහා ලංසු කැඳවීම, සැලසුම් කිරීම, සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම මෙම කටයුතු හා බැඳේ. PCO තේරීම, අවශ්‍ය සියලු රජයේ නිෂ්කාශන සම්බන්ධීකරණය කිරීම, ගුවන් ගමන් සහ ගුවන් තොටුපල බලධාරීන් සමඟ සම්බන්ධීකරණය, අවස්ථා සඳහා සහභාගිත්වය ඉහළ නැංවීමට ප්‍රවර්ධන සහාය සහ සියලු අවශ්‍ය සම්මේලන සහායක සේවා කාර්යාංශය මගින් සිදුකරනු ලබයි.

## 5.2 සපුරාගත් ඉලක්ක

වගුව : 5.1

| මාසය | සමස්ත සංචාරක පැමිණීම් | MICE පැමිණීම් | |
|---|---|---|---|
| ජනවාරි | 238,924 | 9% | 21,503 |
| පෙබරවාරි | 235,618 | 8.5% | 20,027 |
| මාර්තු | 233,382 | 8.5% | 19,837 |
| අප්‍රේල් | 180,429 | 8.3% | 14,975 |
| මැයි | 129,466 | 8.2% | 10,616 |
| ජුනි | 146,828 | 8% | 11,746 |
| ජූලි | 217,829 | 9.0% | 19,604 |
| අගෝස්තු | 200,359 | 8.3% | 16,629 |
| සැප්තැම්බර් | 149,087 | 8% | 11,926 |
| ඔක්තෝබර් | 153,123 | 9% | 13,781 |
| නොවැම්බර් | 195,582 | 10% | 19,558 |
| දෙසැම්බර් | 253,169 | 10% | 25,316 |
| එකතුව 2018 | **2,333,796** | | **205,518** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය*

## 5.3 උපායමාර්ග

1. MICE සංචරණය ප්‍රවර්ධනය කිරීම -රැස්වීම්,දිරිදීමනා,සම්මුති හා ප්‍රදර්ශන
2. නැගී එන නව ප්‍රවණතාවලට සමගාමීව MICE සංචරණය විවිධාංගීකරණය
3. MICE කර්මාන්තයේ පුහුණුව,පර්යේෂණ සහ සංවර්ධනය
4. ලංසු තැබීම හා සම්මේලනය සඳහා සහය

## 5.4 අපේක්ෂිත නිමවුම

- MICE පැමිණීම් වැඩි කිරීම
- MICE වෙළඳපළ හා මාර්ග දැක්ම සඳහා සහභාගිත්වය වැඩි කිරීම
- සහයෝගය ලබා දුන් සිද්ධි සංඛ්‍යාව
- MICE කුඩා අත් පොත් සහ මුද්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
- දේශීයව හා විදේශියව ප්‍රකාශයට පත් කරන ලද MICE පුවත්පත් දැන්වීම් සහ ලිපි සංඛ්‍යාව
- හුරුකරවීමේ චාරිකා
- ලංසු තැබීම හා සම්මේලන සඳහා සහය
- පුහුණුව,පර්යේෂණ සහ පවත්වාගෙන යනු ලැබූ සංවර්ධන වැඩසටහන්

## 5.5 අපේක්ෂිත ප්‍රතිඵල:

- වර්ෂය තුළදී MICE සංචාරක පැමිණීම් සංඛ්‍යාව වැඩි කිරීම
- වර්ෂය තුළදී MICE වෙළඳපොළවල් සහ මාර්ග දැක්ම සංඛ්‍යාව වැඩි කිරීම හා සම්බන්ධතා සංඛ්‍යාව වැඩි කිරීම
- MICE ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සහය දෙන ලද සිද්ධි සංඛ්‍යාව
- වර්ෂය තුළදී මුද්‍රණය කර බෙදා හරින ලද කුඩා අත් පොත්,අත් පත්‍රිකා තෑගි භාණ්ඩ
- වර්ෂය සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම හා ලංසු තැබීම
- ප්‍රාදේශීය වැඩසටහන්ද ඇතුලත්ව වර්ෂය සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව

## 5.6 ක්‍රියාත්මක කිරීමේදී මුහණ දුන් අභියෝග :

- සම්මේලන පැවැත්වීම සඳහා ස්ථාන නොමැතිකම
- ප්‍රදර්ශනය සඳහා ඉඩකඩ නොමැතිකම
- සංචාරක කර්මාන්තයේ වෘත්තිය සම්මේලන සංවිධායකයින්ගේ හිඟය
- මලයාසියාව,ඉන්දුනීසියාව වැනි අනෙකුත් තරගකාරී ආසියානු ගමනාන්තයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ මිල තරගකාරී නොවීම
- තරගකාරී රටවල්වලට පැමිණීමේදී වීසා ගාස්තු අය නොකරන අතර ශ්‍රී ලංකාවේ වීසා බලපත්‍ර අවශ්‍යතා MICE සංචාරකයින් සඳහා බාධාවක් වේ.

## 5.7 ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය 2018

### 5.7.1. ක්ෂේත්‍ර පරීක්ෂාව

**අ) චාරිකා නියෝජිත ආයතනවල ස්පාඤ්ඤ සම්මේලනය (CEAV) චාරිකා මෙහෙයවන්නන් පිළිබඳ ඉන්දීය සම්මේලනය (IATO)**

CEAV යනු, ස්පාඤ්ඤ බහිර්ගාමී චාරිකා මෙහෙයවන්නන් වන අතර, IATO යනු, ඉන්දියානු බහිර්ගාමී චාරිකා මෙහෙයවන්නන් වේ. මෙම රටවල් දෙකම වර්ෂය ආරම්භයේදීම ශ්‍රී ලංකාවේදී ඔවුන්ගේ වාර්ෂික සම්මේලනය පැවැත්වීමට කැමැත්ත පලකරන ලදී. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මෙම ආයතන දෙක සඳහාම ශ්‍රී ලංකාවේ MICE හැකියාවන් පෙන්නුම් කිරීමට හුරුකරවීමේ චාරිකාවක් සඳහා පහසුකම් සැලසීය.මෙම සාමාජික

සංවිධාන දෙකම බහිර්ගාමී චාරිකා නියෝජිතවරුන්ගෙන් සමන්විත වන අතර සම්මේලනය සඳහා සිය අනුග්‍රාහකත්වය සඳහා මෙම සංවිධානවල ප්‍රධාන තීරණ ගන්නන් විසින් ඉදිරියේදී ශ්‍රී ලංකාවේ ප්‍රවර්ධනය කළ හැකි පරිදි ශ්‍රී ලංකාවට මෙම සම්මේලන ගෙන ඒමට පහසුකම් සැලසීම හා සහය ලබා දීම අමතර වාසියකි. හුරුකරවීමේ චාරිකාවෙන් අනතුරුව, ශ්‍රී ලංකාවේ අනෙකුත් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ දින 08 ක පශ්චාත් චාරිකාවක්ද ඇතුලත්ව CEAV බහිර්ගාමී ස්පාඤ්ඤ චාරිකා නියෝජිතයන් 110 දෙනෙක් සිය සම්මේලනය නොවැම්බර් 29 සිට නොවැම්බර් 30 දක්වා පැවැත්වීමට සැලසුම් සකස් කර ඇත. ඉන්දියාවේ චාරිකා නියෝජිතයන්ගේ  වාර්ෂික සම්මේලනය 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවේදී පැවැත්වීම අවාසනාවන්ත ලෙස වෙනස් කිරීමට සිදු වූ අතර 2019 වර්ෂයේදී  එම  සම්මේලනය ශ්‍රී ලංකාවේදී පැවැත්වීම පිළිබඳ සැලකිල්ලට යොමු කිරීමේ හැකියාවක් පවතී.

**ආ) දියේ ගිලීයාම වැළැක්වීම සඳහා ලෝක සම්මේලනය**

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය දියේ ගිලීම වළක්වා ගැනීම පිළිබඳ ලෝක සම්මේලනයේ සංවිධායක වන ජාත්‍යන්තර ජීවිත ආරක්ෂක සම්මේලනය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා කිරීමේ චාරිකාවක් සංවිධානය කළේය. ශ්‍රී ලංකාව 2021 දී හෝ 2023 දී  එම සම්මේලනය  පැවැත්වීම සඳහා ලංසු තබන ලදී. මෙහි දේශීය සත්කාරක වන්නේ "ශ්‍රී ලංකා ජීවිත ආරක්ෂක සේවාව"ය.මෙම චාරිකාව 2018 සැප්තැම්බර්  24  සිට 26 දක්වා දින 03 ක් තිස්සේ සිදුකරන ලදී. ජාත්‍යන්තර ජීවිත ආරක්ෂක සම්මේලනයේ කාර්යමණ්ඩලය ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සේවය හා අදාළ නිලධාරීන් මඟින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්, සුදුසු ස්ථාන, නවාතැන් ආදිය නැරඹීය. සම්මේලනය සඳහා සාමාජිකයන් 800 ක් සහභාගි වූහ. ශ්‍රී ලංකාව මෙම විශේෂ අවස්ථාව සඳහා මිල විමසීම් ඉදිරිපත්කළ අනෙකුත් රටවල් 06  අතර වේ.

### 5.7.2. IMEX Frankfurt (ජර්මනිය) සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගි වීම


ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ කර්මාන්තවල සාමාජිකයන් 05 දෙනෙක් සමඟ වර්ග මීටර් 35 ක වේදිකාවකින් ද යුතුව රැස්වීම්, දිරිගැන්වීම්, සිද්ධි හා ප්‍රදර්ශන සඳහා IMEX Frankfurt ජාත්‍යන්තර වෙළඳ සැණකෙළියට 2018 මැයි 15 සිට 17 දක්වා සහභාගි විය. සහභාගි වූ සමාගම් හට MICE ගැනුම්කරුවන් සමඟ පූර්වයෙන් සැළසුම්කළ හමුවීම් 86 ක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

තුර්කිය, ලතින් ඇමෙරිකාව, පෘතුගාලය, ආසියාව, යුරෝපය යන කණ්ඩායම් 05 සඳහා ශ්‍රී ලංකාව MICE සංචාරක ගමනාන්තයක් වශයෙන් ඉදිරිපත් කළේය. සිදුවීම් සඳහා වන ජාත්‍යන්තර පරතර තීරු ගණනාවක් මෙයින් අත්පත් කර ගන්නා ලදි. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මඟින් පූර්වයෙන් සැලසුම් කල පුද්ගල හමුවීම් 30 ක් පමණ පැවැත්වූ අතර ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමයේ  (ICCA ) හා මාධ්‍යය ඇතුලත්





තොරතුරු ලබා ගැනීමට පැමිණි අනෙකුත් අමුත්තන් සමඟ රැස්වීම් පවත්වන ලදි.




ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය 2018 මාර්තු සිට ඉදිරියට පින්තූර සහිත බැනර් 03 ක් ඇතුලත්ව වෙබ් ප්‍රචාරණය තුළින් සන්නාමකරණය සිදු කිරීම සඳහා පිළියෙල කිරීම් සිදු කරන ලදි. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ වෙබ් බැනර්වලට ප්‍රතිචාර වශයෙන් සංඛ්‍යා ලේඛන වාර්තාව අනුව IMEX 2018 සඳහා නැරඹීම් 156,773 ක් හා ඉටුකරගැනීම් 65 ක් පෙන්වන ලදි.

### 5.7.3. IBTM බීජිං (චීනය) සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගි වීම

මෙය 2018 සැප්තැම්බර් 12 සිට 14 දක්වා චීනයේ බීජිංහිදී පවත්වන ලදි. IBTM චීනය යනු කෙටි යෙදුම් වශයෙන් දිරි දීමනා, ව්‍යාපාර චාරිකා හා රැස්වීම් සැලකෙන IBTM Expo හි චීන සංස්කරණය වන අතර MICE ( රැස්වීම්, දිරි දීමනා, සම්මුති හා ප්‍රදර්ශන) පාර්ශවකරුවන් එක්ව ආසියාවේ පවත්වනු ලබන විශාලතම එකම සංචාරක සිදුවීම වේ. IBTM ප්‍රදර්ශන කර්මාන්තයේ ගෝලීය සංවිධානය මඟින් අනුමත කරන ලදි.

IBTM චීනයට සමගාමීව, ශ්‍රී ලංකාව MICE ගමනාන්තයක් වශයෙන් ඉදිරිපත් කිරීම මූලික අරමුණ වූ අතර තානාපති කාර්යාලයේ කාර්යයක් සඳහා 25 කට අධික කර්මාන්තයේ සාමාජික පිරිසක් සහභාගි කරවීම සඳහා පූර්ව ප්‍රචාරණ සිදුවීමක් වශයෙන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය CITIS සමඟ සහයෝගිතාවෙන් යුතුව සංවිධානය කරන ලදි.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ පූර්ව ප්‍රචාරණ කටයුත්තක් ලෙස බැනරයක් ප්‍රදර්ශනය කරන ලදි. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරීතුමා ශ්‍රී ලංකාව ඊළඟ MICE ගමනාන්තයක් වශයෙන් සැලකීමට හේතුව ගැණුම්කරුවන් වෙත දක්වමින් ගමනාන්ත අළෙවිකරණය පිළිබඳ ඉදිරිපත් කිරීමක් කළේය.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහයෝගිත්වය ඇතිව 2018 සැප්තැම්බර් 12 වන දින දිවා ආහාරය අතරතුර අනුග්‍රාහක ගැණුම්කරුවන් වෙනුවෙන් Ceylonese තේ රස බැලීමේ සැසියක් සංවිධානය කළේය.






වෙළඳපළ අතරතුරදී, පෙර සූදානම් කළ හමුවීම්, පෙර සූදානම් වූ ගැණුම්කරුවන් සමඟ රැස්වීම්, අන්තර් ක්‍රියාකාරිත්වයෙන් යුතු සැසි හා ගමනාන්ත ඉදිරිපත් කිරීම් හා මාධ්‍ය දැනුවත්වීම් සිදු කර ඇත. ඉලක්ක කණ්ඩායම වූයේ සංස්ථා, දිරි දීමනා, නිවාස හා චීනය මූලාශ්‍ර කරගත් චාරිකා නියෝජිත ආයතන වේ.

සිදුවීම තුලදී, ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරීතුමා සහභාගි වූ මාධ්‍ය හා පුවත්පත් සාකච්ඡා 05ක් පවත්වන ලදී.

### 5.7.4. ඉන්දියා-දිල්ලි, චෙන්නායි, හයිද්‍රාබාද්, කෝචින්-බංගලාදේශය, ඩකා සහ මලයාසියාව සඳහා ද්විපාර්ශ්වික රැස්වීම්

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති හා සාමාන්‍යාධිකාරී කොන්සල් කාර්යාල පරිශ්‍රයේදී ශ්‍රී ලංකා එයාර්ලයින්ස් සමාගමේ සහයෝගයෙන් යුතුව රැස්වීම් පැවැත්වූ අතර රැස්වීම් සඳහා අදාළ MICE විශේෂඥයා නියමිත පරිදි හමුවීමට කටයුතු සලස්වන ලදී. මෙම කාර්යයට පසුව ඊළඟ පියවර වන කර්මාන්තයේ සහභාගිත්වය සිදුවේ.

ඉහත නගරවලදී සිදු කරනු ලැබූ රැස්වීම් සංඛ්‍යාව පහත පරිදි වේ.

චෙන්නායි : රැස්වීම් 19

දිල්ලි : රැස්වීම් 8

ඩකා : රැස්වීම් 12

මැලේසියාව : රැස්වීම් 10

2018 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වල හයිද්‍රාබාද්, කරච්චි හා කෝචින්වල දෙපාර්ශවයක් අතර සිදු කරනු ලබන රැස්වීම් පැවැත්වීමට නියමිතය.

### 5.7.5. ඔක්තෝබර් 16 සිංගප්පූරුවේ දී සහ 2018 ඔක්තෝබර් 11 බංගලාදේශයේ දී MICE ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය MICE ප්‍රවර්ධන සිද්ධි 02ක් 2018 ඔක්තෝබර් මස සිංගප්පූරුවේ හා බංගලාදේශයේදී පැවැත්විය. සිංගප්පූරු MICE ප්‍රවර්ධන සිදුවීම සඳහා සහභාගී වු කර්මාන්තයේ නියැලෙන්නන් සංඛ්‍යාව 11ක් වූ අතර බංගලාදේශ සිදුවීම සඳහා කර්මාන්තයේ වෘත්තියවේදීහු 09ක් සහභාගි වූහ.

### 5.7.6. මීගමුවේ පැවති MICE ප්‍රාදේශීය පුහුණු වැඩමුළුව -

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය මීගමුව ප්‍රදේශයේ හෝටල්කරුවන් පුහුණු කිරීම සඳහා MICE ප්‍රාදේශීය පුහුණු වැඩමුළුව සංවිධානය කළේය. සහභාගිවන්නන් 40 ක් වැඩමුළුව සඳහා සහභාගි විය.

### 5.7.7. ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමයේ (ICCA) රැස්වීම් කර්මාන්ත සංවර්ධන සමුළුව-2018 ඔක්තෝබර් 09

MICE කර්මාන්තයේ පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභය සඳහා සමුළුව සංවිධානය කරනු ලැබේ.මෙය පුහුණුකරුවන් දෙදෙනෙකු විසින් පවත්වන ලදි. ඔවුන් වන්නේ නූර් අහමඩ් හමීඩ්, කලාපීය අධ්‍යක්ෂ (ආසියා පැසිපික්) ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලනය සංගමයේ සෙන්තිල් ගෝපිනාත් මහතා, කලාපීය අධ්‍යක්ෂ (මැද පෙරදිග) ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමය.

මෙම සම්මේලනය සඳහා හෝටල්කරුවන්, වෘත්තීය සිද්ධි සංවිධායකයින්, ගමනාන්ත කළමනාකරණ සමාගම් සහ MICE (රැස්වීම්, දිරිදීමනා, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන) සංචාරක කර්මාන්තයේ නියැලෙන රජයේ නිළධාරින් ඇතුළුව කර්මාන්තයේ සහභාගිවන්නන් 50 කට අධික පිරිසක් සහභාගි වූහ.

සම්මේලනය සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සභාපති,කුමාර ද සිල්වා මහතා, ICCA අධ්‍යක්ෂ නූරු හමීඩ් මහතා, සාමාන්‍යාධිකාරී ඉනෝෂණී පෙරේරා මහත්මිය හා ශ්‍රී ලංකා වෘත්තීය සම්මේලන සංසදය ප්‍රදර්ශන හා රැස්වීම් සංවිධායකයින්ගේ (SLAPCEO) අන්තර් ක්‍රියාකාරී ඉදිරිපත්කිරීම් වලින් සම්මේලනය සමන්විත විය.

ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර රැස්වීම් හා සම්මේලන වැඩි වශයෙන් ලබා ගැනීමට ජාත්‍යන්තර මිල විමසීම සඳහා කර්මාන්තය සකස් විය යුතු ආකාරය පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් සම්මේලනය මඟින් සිදුකල අතර, කණ්ඩායම් වැඩ සැසිය සමඟ අන්තර් ක්‍රියාකාරීත්වයෙන් යුතුව කටයුතු කිරීමට හා ලංසු තැබීම ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට සහභාගිවන්නන් හට අවස්ථාව ලැබිණි.

ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමය ("ICCA" - https://www.iccaworld.org/abouticca/) ජාත්‍යන්තර සංගම් රැස්වීම් පිළිබඳ විශේෂීකරණය වූ සංගමයක් වන අතර එය MICE කර්මාන්තයේ ප්‍රමුඛතම සංවිධානයකි.

ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමයේ (ICCA) සාමාජිකයෙකි.



ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ, සභාපති, කුමාර ද සිල්වා මහතා සහ ජාත්‍යන්තර ප්‍රදර්ශන හා සම්මේලන සංගමයේ (ICCA) සාමාජිකයන්, නූර් අහමඩ් හමීඩ් මහතා සහ සෙන්තිල් ගෝපිනාත් මහතා

### 5.7.8. ස්පාඤ්ඤයේ බාර්සිලෝනා IBTM World සඳහා ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහභාගිවීම

IBTM වර්ල්ඩ් යනු, රැස්වීම් හා සිද්ධි කර්මාන්තය සඳහා ප්‍රමුඛතම ගෝලීය සමුළුවයි. මෙම තුන් දින සමුළුව 2018 නොවැම්බර් 27 සිට 29 දක්වා පිරා බාර්සිලෝනාහි දී පවත්වන ලදී. ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය විසින් මෙම දින තුන තුළ ශ්‍රී ලාංකීය කර්මාන්තයේ සාමාජිකයින් 07 දෙනෙකු සඳහා වර්ග මීටර් 46 ක වේදිකාවක ඉඩ සලසා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ MICE කර්මාන්තය , යුරෝපීය දිරිදීමනා සහ රැස්වීම් වෙළඳපොළට සමග සම්බන්ධ කිරීම සඳහා සහයවීම කාර්යාංශයේ අරමුණ විය. IBTM යනු, සැපයුම්කරුවන් සහ ගැණුම්කරුවන් සඳහා ප්‍රදර්ශන මහලක මෙන්ම ඉන් පිටතදීත් ව්‍යාපාරික ජාල අවස්ථා ගණනාවක් හරහා මුණගැසීමට හා ව්‍යාපාර පවත්වාගෙනයාම සඳහා කදිම වේදිකාවක් විය.

සත්කාරක ගැනුම්කරුවන් 60 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූ ශ්‍රී ලංකා ගමනාන්ත ඉදිරිපත් කිරීම සඳහා වාර 9 ක් ලබා ගැනීමටද ශ්‍රී ලංකාවට අවස්ථාව ලැබුණි.

මේ වසරේ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය IBTM World සත්කාරකත්වය දරන ගැණුම්කාර කලාපයේ පිවිසුම් පිටුවට සති දෙකක් හා මුළු දින තුන පුරාම මාධ්‍ය මධ්‍යස්ථානය සඳහාද

අනුග්‍රාහකත්වය ලබා දීමෙන් සන්නාම දැනුවත්භාවය අත්පත්කර ගනිමින් ශ්‍රී ලංකාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කළේය. සියළුම ගැනුම්කරුවන්ට හා ප්‍රදර්ශකයන්ට මුළු දින තුන පුරාම බෙදා දුන් ප්‍රදර්ශනයේ දිනපතා සඟරාව මඟින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සන්නාමය සඳහා නිසි ප්‍රචාරයක් ලබා දෙන ලදී.



**ගමනාන්ත ඉදිරිපත් කිරීම සිදුකරමින්**

### 5.7.9. ස්පාඤ්ඤ චාරිකා නියෝජිතයින්ගේ පශ්චාත් සංචාර සම්මේලනය (CEAV)

ස්පාඤ්ඤ චාරිකා නියෝජිතයින්ගේ පශ්චාත් සම්මේලන("CEAV") සංචාරය 2018 නොවැම්බර් මස 30 වන දින සිට දෙසැම්බර් 7 වනදා දක්වා ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. ශ්‍රී ලංකාවට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රධාන වෙළෙඳපොළක් ලෙස හඳුනාගෙන ඇති ස්පාඤ්ඤ සංචාරක වෙළෙඳපොළ 22% ක වේගයකින් වර්ධනය වන බව පැවසෙන අතර වසරක් පාසාම 12% ක පමණ වේගයකින් වර්ධනය වේ. සුවිශේෂී චාරිකා නියෝජිත සමාගම් 40 කින්ද යුතුව සමස්ත CEAV දූත පිරිස නියෝජිතයින් 110 දෙනෙකුගෙන් සමන්විත විය. ශ්‍රී ලංකා සංචාරක සහ විශ්‍රාන්ති කර්මාන්තයේ විවිධ පාර්ශවකරුවන් ඔවුන්ගේ

ශ්‍රී ලංකා සංචාරයට පහසුකම් සැලසීමත් සමඟම ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය ස්පාඤ්ඤයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනය වේගවත් කිරීමට අපේක්ෂා කරයි.

ස්පාඤ්ඤයේ වෙළෙඳපොළ පිළිබඳව අවධානය යොමු කරන සුවිශේෂී දේශීය චාරිකා නියෝජිත සමාගම් 38ක් සමඟ ස්පාඤ්ඤ චාරිකා නියෝජිතායතන 40ක් සහභාගී වූ ද්විපාර්ශික ව්‍යාපාරික සැසිවාරයක් මෙම සම්මන්ත්‍රණයට ඇතුලත් විය. මෙම ද්විපාර්ශික ව්‍යාපාරික සැසිවාරය CEAB හි සභාපති, රෆායෙල් ගාලෝග් නඩාල් මහතා, CEAV කළමනාකරු, මර්සිස් ටෙජෙරෝ අල්ගුසිල් මහතා සහ ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී ඉනෝෂිනී පෙරේරා මහත්මිය විසින් විවෘත කරන ලදී.



බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති CEAV ද්විපාර්ශික ව්‍යාපාරික සැසිවාරය



බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති දේශීය අත්කම් ප්‍රදර්ශනයේ CEAV දූත පිරිස

## 5.8 සිද්ධි සඳහා සහය

කර්මාන්තය විසින් සංවිධානය කරන ලද මුළු සිද්ධි වලින් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සහය දැක්වූ සිද්ධි 41 ක් පහත වගුවෙන් දැක්වේ.

වගුව 5.2

| දිනය | සිද්ධියේ නම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| ජන26-28 | යාපනය ජාත්‍යන්තර වෙළෙඳපොළ 2018 | 100 |
| ජන26-27 | 34 වන වාර්ෂික නිර්වින්දකවරුන්ගේ අධ්‍යයන සමුළුව | 70 |
| ජන23 | Auto Mobile Corporate Company | 230 |
| ජන 20-21 | ශ්‍රී ලංකාවේ දන්ත වෘත්තිකයන්ගේ සම්මේලනය 2018 | 20 |
| ජන16-20 | Roche 2018 | 410 |
| ජන21-25 | Shree Rathi X | 120 |
| ජන22-24 | EDAC Educational group Wave 4 | 53 |
| පෙබ7-10 | Avery Dennission | 120 |
| පෙබ4 – 7 | ඉන්දියානු බීජ සමුළුව | 500 |
| පෙබ25 | Ramasar Secretariat ,ජිනීවා සමුළුව | 100 |
| පෙබ12-14 | Interface Sales kickoff 2018 | 50 |

| | | |
|---|---|---|
| පෙබ14-18 | Aaryan Group | 50 |
| පෙබ15-16 | 02 වන ජාත්‍යන්තර දේශගුණික විපර්යාස පිළිබඳ සම්මේලනය | 100 |
| පෙබ26-28 | AGFA | 100 |
| පෙබ20-22 | ජාත්‍යන්තර ස්වාධීන විගණක නියාමකවරුන්ගේ වැඩමුළුව 2018 | 100 |
| පෙබ23 | බෝ නොවන රෝග පිළිබඳ දෙවන ජාත්‍යන්තර සම්මේලනය | 80 |
| පෙබ17-19 | Purple Chariot - Destination Wedding | 700 |
| පෙබ27මාර්11 | ඉන්දියානු MICE කණ්ඩායම - Chettinad cements | 270 |
| මාර් 6-7 | SAMN කලාපීය සම්මේලනය- 2018 | 300 |
| මාර් 8-9 | ජීව විද්‍යාව හා ජීව තාක්ෂණය පිළිබඳ තෙවන ජාත්‍යන්තර සම්මේලනය-2018 | 65 |
| මාර්16 | Kasthiran | 100 |
| මාර් 9-11 | කොළඹදී තායිලන්ත සතිය | 60 |
| මාර් 26-31 | ඉන්දුනීසියානු නාරිවේද විශේෂඥ වෛද්‍යවරුන් | 40 |
| මාර්28 – 30 | දකුණු ආසියානු ජීව තාක්ෂණ සම්මේලනය 2018 | 50 |
| මාර්7-14 | Pini Group | 100 |
| මාර්තු | Medicare Exhibition 2018 | 150 |
| මාර්23-26 | Purple Chariot -Destination Wedding | 400 |
| 21-24 | Kolkata විවාහ | 450 |
| අප්‍රේල් | Hyundai Auto Mobile | 270 |
| අප්‍රේල් | Saudi air Regional Meeting – 50 pax | 50 |
| අප්‍රේල් | Hannover ReMalesiyan Branch – 50 pax | 50 |
| අප්‍රේල් | HELANKA VACATIONS | 45 |
| අප්‍රේල් | රසායන හා ආහාර ඉංජිනේරු 5 වන ජාත්‍යන්තර සම්මේලනය 2018 (ICCFE ) | 40 |
| අප්‍රේල් | ද්‍රව්‍ය නිර්මාණකරණය හා යෙදවුම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (ICMDA 2018) | 50 |
| අප්‍රේ 20-27 | සම්මේලනය-Cambridge Planners | 62 |
| අප්‍රේ 29 | අධ්‍යාපන හා දුරස්ථ ඉගැනුම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය | 25 |
| අප්‍රේ 16-20 | Incentive Group | |
| අප්‍රේ 22-23 | ඉන්දියානු සම්මේලන කණ්ඩායම | 45 |
| අප්‍රේ 24-25 | MICE කණ්ඩායම - Auto Mobile Group | 170 |
| අප්‍රේ 19-20 | Indian Corporate Conference | 150 |
| අප්‍රේ- මැයි1 | Singapore Incentive group | 90 |
| අප්‍රේ 23-28 | DELL Logistics සම්මේලනය | 100 |
| මැයි | Dilmah Group ( Walkers) | 180 |
| මැයි 17-18 | ජනමාධ්‍යවේදීන් පිළිබඳ දෙවන ජාත්‍යන්තර සම්මේලනය | 30 |
| මැයි 25-27 | ඉන්දියානු/බල්ගේරියානු විවාහ | 100 |
| මැයි 17-18 | ඩිජිටල් අළෙවිකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය | 20 |
| මැයි 18 | GariSummerResearch සමුළුව | 52 |
| මැයි 17-18 | භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනය පිළිබඳ දෙවන ජාත්‍යන්තර සම්මේලනය | 40 |

| | | |
|---|---|---|
| මැයි 7 | World Rubber Summit | 100 |
| මැයි3-5 | 4 වන ලෝක කාන්තා අධ්‍යයන සම්මේලනය | 150 |
| මැයි11-13 | Toastmasters Conference | 300 |
| ජූනි | KPMG –35pax | 35 |
| ජූනි 20 | ආර්ථිකය හා සංවර්ධනය පිළිබඳ දෙවන ජාත්‍යන්තර සම්මේලනය -2018 | 80 |
| ජූනි 20 | කෘෂි ව්‍යාපාර අළෙවිකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය | 65 |
| ජූනි 10-15 | ශ්‍රී ලංකාවේ දැඩි සත්කාර වෛද්‍ය වෘත්තිය සැමරීමේ 50 වන සංවත්සරය | 250 |
| ජූනි19-21 | Sri Lanka Investment and Conclave 2018 | 160 |
| ජූනි | Sri Lanka Investment and Conclave 2018 – Business 200 | 200 |
| ජූනි 8-10 | ශ්‍රී ලංකාවේ මනෝ චිකිත්සකවරුන්ගේ විද්‍යාලයේ 15 වන වාර්ෂික සැසිය | 15 |
| ජූනි 18-19 | 15 වනආසියාවේ/පැසිපික් සාගරයේ කලාපීය අන්තර් රාජ්‍ය අමාත්‍යංශ රැස්වීම | 50 |
| ජූනි 27-30 | 18 වන හෝටල් හා ආපන ශාලා සංගමයේ කලාපීය සම්මේලනය | |
| ජූනි29 -ජූලි1 | 7 වන ඉදිකිරීම්සමුළුව | 100 |
| ජූලි29 - 1 | 7 වන ඉදිකිරීම් ප්‍රදර්ශනය 2018 | 50 |
| ජූනි24-27 | FIDIC – ASPAC සම්මේලනය | 200 |
| ජූනි14 -17 | HLBI ආසියා පැසිපික් කලාපීය සම්මේලනය 2018 | 75 |
| ජූලි28 -3 | MICE Group–Brila | 160 |
| ජූලි 12-13 | Max Life රක්ෂණය | 1000 |
| ජූලි 11-15 | Criticon 2018 වෛද්‍ය සම්මන්ත්‍රණය | 50 |
| ජූලි 03 | ජාත්‍යන්තර ගෘහපාලන සමුළුව | 150 |
| ජූලි 19 - 23 | අම්බුජා සිමෙන්ති-කාර්ය මංඩලය | 90 |
| ජූලි 20-22 | Strangers 2018 | 60 |
| ජූලි 26-29 | 2018 ශ්‍රි ලංකා වෛද්‍ය සංගමයේ 131 වැනි සංවත්සර ජාත්‍යන්තර වෛද්‍ය සම්මන්ත්‍රණය | 100 |
| අගෝ 3-5 | 17 වැනි Pro Food- Pro Pack and Agbiz ප්‍රදර්ශනය | 100 |
| අගෝ8-11 | Tata Chemicals- සම්මන්ත්‍රණය | 110 |
| අගෝ 17 | ශල්‍ය වෛද්‍ය විද්‍යායතනයේ වාර්ෂික අධ්‍යයන සැසිවාරය | 100 |
| අගෝ 15-18 | වර්ණ සෛල පර්යේෂණ සඳහා ආසියානු සමාජය හා ශ්‍රී ලංකා චර්ම රෝග විද්‍යායතනයේ 9 වන ඒකාබද්ධ රැස්වීම | 100 |
| සැප්14-15 | සත්කාරක සංචාරක කළමනාකරණය පිළිබඳ 6 වැනි ජාත්‍යන්තර සම්මේලනය | 50 |
| සැප් 4-7 | Titan ශ්‍රී ලංකා කණ්ඩායම | 125 |
| සැප් 4 | Reach the Peak ව්‍යාපෘතිය | 55 |
| සැප් 5-9 | පළමු වට මේස ලෝක රැස්වීම 2018 | 500 |
| සැප්19-21 | ශ්‍රී ලංකා ළමාරෝග විශේෂඥවරුන්ගේ විද්‍යායතනයේ අධ්‍යාපන ක්‍රියාකාරකම් | 50 |
| සැප් 8-9 | IEEE SS12 -ජාත්‍යන්තර ව්‍යාපෘති තරඟාවලිය හා වෙළඳපොළ | 200 |
| සැප්12-15 | වාර්ෂික අධ්‍යාපන සැසිය | 35 |

| | | |
|---|---|---|
| සැප්27-28 | JUICE 2018 ලෝක සංචාරක දිනය සැමරුම | 1000 |
| සැප් 22 | EDAC අධ්‍යාපන කණ්ඩායම | 45 |
| සැප් 26-27 | OPA හි 31 වැනි වාර්ෂික සමුළුව | 250 |
| ඔක් 5-9 | MICE ඉන්දියානු කණ්ඩායම Ashok Leyland | 850 |
| ඔක් 10-13 | Axix බැංකු සංචාරය | 150 |
| ඔක් 25-27 | ශ්‍රී ලංකා වෘද්ධ චිකිත්සා හා ස්නායු පුනරුත්තාපන සංගමයේ හා 4 වන විද්‍යාත්මක සම්මේලනය | 10 |
| ඔක්30-නොවැ02 | Navitas ව්‍යාපාර හවුල්කරුවන්ගේ සම්මන්ත්‍රණය | 200 |
| ඔක්30-නොවැ 11 | Raid Amazons | 560 |
| ඔක් 7-12 | ඩිජිටල් සෞඛ්‍ය සතිය | 700 |
| නොවැ 1-12 | Herbal Life Indian MICE | 800 |
| නොවැ13-17 | Intex 2018 | 150 |
| නොවැ26-27 | IRIDOLOGY ආසියානු සම්මේලනය | 100 |
| නොවැ 8 | ADI APRO සමාරම්භක උත්සවය | 50 |
| දෙසැ14-16 | POMS 2018 | 175 |
| දෙසැ 11 | දකුණු ආසියානු ACEF සංසදය | 75 |
| දෙසැ 2 | FOSS4G-Asia 2018 | 125 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය*

## 5.9 මූල්‍ය කාර්යසාධනය:

වගුව: 5.3

| අනුමත වාර්ෂික අයවැය 2018 (රු.මි.) | සත්‍ය වියදම 2018.12.31 දිනට (රු.මි.) | මුළු ආදායම 2018.12.31 දක්වා (රු.මි.) |
|---|---|---|
| **370.00** | 93.00 | 186 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය*

# 6.
# වනජීවී අංශය



# 6. වනජීවී අංශය

## 6.1 හැඳින්වීම

පැවති තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය අංක 2070/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2018 මැයි මස 12 වන දින තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලද අතර 2096/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2018 නොවැම්බර් මස 05 වන දින සංචාරක හා වනජීවී අමාත්‍යාංශය ලෙස පිහිටුවන ලදී. නැවත අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2018 දෙසැම්බර් මස 28 වන දින සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය නමින් පිහිටුවන ලදී.

### 6.1.1 අමාත්‍යාංශයේ වනජීවී අංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ආයතන

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා වනජීවී භාරය

වනජීවී අංශය විසින් වනජීවී සංරක්ෂණ, ජාතික උද්භිද උද්‍යාන, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු ත්‍රිත්වයේ හා වනජීවී භාරයට අදාළව ප්‍රතිපත්ති සැකසීම,සංවර්ධන කටයුතු වලට අදාල මග පෙන්වීම ලබාදෙමින් එම සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම හා ඇගයීම් සිදු කරමින් පරිපාලනමය කටයුතු සම්බන්ධීකරණ හා අධීක්ෂණය කිරීමත් සිදුකෙරේ. එසේම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත, උද්භිත උද්‍යාන ආඥා පනත හා ජාතික සත්ත්ව උද්‍යාන පනත ක්‍රියාත්මක කරවීම තවදුරටත් සිදුකරනු ලැබේ.

### 6.1.2 පාලන අංශය

මානව සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම තුළින් වනජීවී අංශයේ අරමුණු ඉටු කරවා ගැනීම සඳහා අවශ්‍ය සහය ලබා දීම, නිලධාරීන්ගේ පත් කිරීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා විනය කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය හා වනජීවී අංශයේ හා ඒ යටතේ වන ආයතන වල කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනාගැනීම, කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරවා ගැනීම, බඳවා ගැනීමේ පරිපාටි අනුමත කරවා ගැනීම, බඳවා ගැනීම හා පුරප්පාඩු පිරවීමට අදාළ කටයුතු ඉටු කිරීම සිදුකරනු ලබන අතර දෙපාර්තමේන්තු ත්‍රිත්වයට අදාළ පරිපාලන කටයුතු හා වනජීවී භාරයේ පරිපාලන කටයුතු ඉටු කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය වේ.

### 6.1.3 සැලසුම් අංශය

දෙපාර්තමේන්තුවල සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම, සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදීම ප්‍රධාන වශයෙන් මෙම අංශයෙන් සිදුකරනු ලැබේ. ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනා ගනිමින්

සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ,වනජීවී අංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල ප්‍රගතිය ලබා ගැනීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රගති වාර්තා සැකසීම, අය වැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික කාර්ය සාධන වාර්තාව සැකසීම, ජනාධිපති කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශය වල අවශ්‍යතාවය මත තොරතුරු ලබාදීම මෙම අංශය මගින් සිදුවේ. තව ද මෙම අංශය මඟින් අමාත්‍යාංශයට අයත් ආයතනවල ප්‍රතිඵල, කාර්යක්ෂමතාව සහ සඵලතාව පිළිබඳ තොරතුරු ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, මෙහෙයවීම හා ඇගයීම සිදු කරනු ලැබේ.

### 6.1.4 සංවර්ධන අංශය

වනජීවී සංරක්ෂණ , ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

### 6.1.5 ගිණුම් අංශය

වනජීවී අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය ඍජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයයි. ඒ අනුව වනජීවී අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ඊට අදාල පාලන කටයුතු ගිණුම් අංශය මඟින් ඉටුකරනු ලබයි.

### 6.1.6 තාක්ෂණ අංශය

වනජීවී , ජාතික උද්භිද සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධව ඇති විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු සඳහා සහාය වීම සහ එම කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සම්බන්ධීකරණය හා අධීක්ෂණය මෙම අංශය මගින් සිදුවේ.

### 6.1.7 අභ්‍යන්තර විගණන අංශය

වනජීවී අංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඇගයීම සඳහා නිරන්තර සෝදිසිය පරීක්ෂණ සිදු කිරීම ,දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙයවීමද සිදුකරනු ලබයි.

### 6.1.8 නීති අංශය

වනජීවී අංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සම්බන්ධව ඉටුකල යුතු නීති කටයුතු ඉටු කිරීම සිදුකරන අතර පනත් සඳහා අවශ්‍ය වන්නාවූ සංශෝධන හා රෙගුලාසි සකස් කිරීම, වනජීවී අංශයයේ හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පවත්නා නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි.

### 6.2 මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018

වගුව 6.1

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) | (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 852.00 | *844.94 | 99 |
| පුනරාවර්තන වියදම් | 192.25 | 151.08 | 78 |
| මුළු ප්‍රතිපාදන හා වියදම | 1044.25 | 996.02 | 95 |

* අතැති බිල් සමග

### 6.3 2018 වසරේ සිදුකල ප්‍රධාන කාර්යයන්

#### 6.3.1 වඳ වී ගෙනයාමේ තර්ජනයට මුහුණපා ඇති සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) වැඩසටහන

2019 වර්ෂයේ ජුනි මස පැවැත්වීමට නියමිත වඳ වී ගෙනයාමේ තර්ජනයට මුහුණපා ඇති සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතියේ (CITES) පාර්ශවකරුවන්ගේ 18 වන සමුළුවේ කටයුතු සම්බන්ධීකරණ හා අධීක්ෂණය මේ යටතේ සිදුවේ.

ප්‍රතිපාදන - රු.මි. 555.07

වියදම - රු.මි. 144.00

(මෙම ව්‍යාපෘතියේ මුල් ප්‍රතිපාදන රු.මි.250.00ක් වුවද සම්පූර්ණ ඇස්තමේන්තු මුදල රු.මි 1272.0 ඉක්මවන නිසා මු.රෙ. 66 මගින් රු.මි. 555.07 දක්වා ප්‍රතිපාදන සලසා ගත්තද අක්මුදල් නොලැබීම හා අපේක්ෂා කල බැදීම් ඇති නොවීම නිසා 2018 වසරේදී ඉතිරියක් ඇති විය.)

**භෞතික ප්‍රගතිය**

- CITES ලේකම් කාර්යාලයේ පරිපාලන කටයුතු පවත්වා ගැනීම සහ ඊට අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් කටයුතු සිදුකර ඇත.
- CITES සමුළුවේ සත්කාරක රට වශයෙන් (ජිනීවා නුවර ප්‍රධාන කාර්යාලයට) ගෙවිය යුතු මුදල ගෙවා ඇත.

#### 6.3.2 තිරසර සංවර්ධන වැඩසටහන -

2030 න්‍යාය පත්‍රය හෙවත් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදු කරනු ලබන්නේ තිරසර සංවර්ධන අංශයයි. තිරසර සංවර්ධන ප්‍රතිපත්ති, ක්‍රමෝපායන්, වැඩසටහන් යාන්ත්‍රණයන් සහ ක්‍රම ශිල්පයන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම ,තිරසර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ප්‍රමුඛතා හඳුනාගැනීම හා යාන්ත්‍රණය ගොඩනැඟීම පිණිස ජාතික මට්ටමේ සහ ඉන් පහළ මට්ටමේ අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම හා ඒ සඳහා සහාය දැක්වීම යන කාර්යයන් මෙහිදී ඉටුකරනු ලබයි.

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු.මි. 40.00 |
| සංශෝධිත ප්‍රතිපාදන | - රු.මි. 18.24 |
| **වියදම** | **- රු.මි.17.08** |

**භෞතික ප්‍රගතිය**

තිරසර සංවර්ධන උපාය මාර්ගය සකස් කිරීම, තිරසර අරමුණු අමාත්‍යාංශ සැලසුම් වලට ප්‍රවාහගත කිරීමට අදාල වැඩමුළු සිදු කිරීම, තිරසර සංවර්ධන සැලසුම් සකස් කිරීම, පළාත් සභා මට්ටමින් තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීමට අදාල සියළු පාර්ශවකරුවන් දැනුවත් කිරීම, තිරසර සංවර්ධන පර්යේෂණ සඳහා අනුග්‍රහය දැක්වීම, තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අනෙකුත් රටවල් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීම, ජාතික තිරසර සංවර්ධන තොරතුරු ද්වාරය නිර්මාණය කිරීම යන කාර්යයන් මෙම වැඩසටහන යටතේ සිදුකරනු ලැබ ඇත.

### 6.3.3 වාහන මිලදී ගැනීම

සංවර්ධන හා පරිපාලන කාර්යයන් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා වනජීවී අංශයේ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු ත්‍රිත්වය සවිබල ගැන්වීම.

| | |
|---|---|
| වෙන් කල ප්‍රතිපාදන | - රු.මි. 500.00 |
| සංශෝධිත ප්‍රතිපාදන | - රු.මි. 262.00 |
| **වියදම** | **- රු.මි. 261.91** |

**භෞතික ප්‍රගතිය**

- **මිලදී ගන්නා ලද වාහන ප්‍රමාණය**

| | |
|---|---|
| ඩබල් කැබ් | 20 |
| සිංගල් කැබ් රථ | 07 |
| වෑන් රථ | 02 |
| කෘකැබ් රථ | 03 |
| **මුළු වාහන ගණන** | **32** |

# 7.

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව



## 7. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### දැක්ම

වර්තමාන හා ඉදිරි පරම්පරාවන් උදෙසා වනජීවී සම්පත් දිගුකාලීනව සංරක්ෂණය කිරීම

### මෙහෙවර

සියල්ලන් හා එක්ව වෘත්තීමය කළමනාකරණයක් මගින් වනජීවී සම්පත්වල සංරක්ෂණය සහතික කිරීම

### කාර්යභාරය

- සියලුම භූගෝලීය, දේශගුණික හා ජෛව කලාප තුළ වනජීවී සම්පත්වල ප්‍රමාණවත් නියැදි ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ජාලය ස්ථාපිත කිරීම මගින් ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම.
- කෘෂිකර්මාන්තය හා ජල විදුලිය නිපදවීම සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන්ගේ ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම, ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කරගැනීම, ආවේණික හා දුලබ වනජීවී විශේෂයන් ආරක්ෂාකර ගැනීම, සුවිශේෂී පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීම වැනි විශේෂිත අරමුණු ඇති වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කර වනජීවී රක්ෂිත ජාලය තුළ නිසි ලෙස කළමනාකරණය කිරීම.
- අලින් වැනි වඳවීමේ තර්ජනයට ලක්ව සිටින දේශීය වනජීවී විශේෂයන් සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මගින් එම විශේෂයන් ගේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.
- වනජීවී රක්ෂිතවලින් බැහැර ප්‍රදේශවල ආරක්ෂිත වනජීවී විශේෂයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- තත්කාලීනව බලපවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති වනජීවී සංරක්ෂණය හා අදාල වඳවීමේ තර්ජනයට ලක් වූ විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES)" ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් පිළිබඳ සම්මුතිය (Ramsar) හා සංක්‍රමණික වන සත්ත්ව විශේෂයන්ගේ සංරක්ෂණය පිළිබඳ සම්මුතිය (CMS - Bonn) යන ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලත් අධිකාරි බලය අනුව කටයුතු කිරීම.
- වනජීවී රක්ෂිත ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය පරවර්ධනය මගින් ජාතික ආර්ථිකයට එයින් ලබාදෙන දායකත්වය ප්‍රශස්ථ තලයක පවත්වා ගැනීම.
- වනජීවී සම්පත්වල සංරක්ෂණය හා විද්‍යාත්මක කළමනාකරණයක් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය.
- ස්වභාව සම්පත් සංරක්ෂණය පරමාර්ථය කොටගත් වෙනත් ආයතන සමඟ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගය වර්ධනය කර ගනිමින් සංරක්ෂණ ක්‍රියාදාමය ශක්තිමත් කර ගැනීම.
- සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් කණ්ඩායම් අතර වනජීවී සංරක්ෂණය ව්‍යාප්ත කිරීමෙන් ඔවුන්ගේ දායකත්වය ඊට නොඅඩුව ලබා ගැනීම ඉලක්ක කර ගත් වනජීවී සංරක්ෂණ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.
- වනජීවී රක්ෂිත තුළ ස්වභාව සම්පත් මත ඒ අවට පදිංචි ජනතාවගේ යැපීම අවම කර ගැනිම ඉලක්ක කොටගත් සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

## 7.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුල ඉතා විශාල ජෛව විවිධත්වයක් උරුම වී තිබෙන අතර ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. 1949 වර්ෂයේ දී ආරම්භ කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි සියලුම ප්‍රධාන ගංගාවන්ගේ මූලාශ්‍රයන් මෙන්ම කෘෂිකර්මාන්තය හා විදුලිය ජනනය සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන් ඇතුළු ජලාශ 40 ක පෝෂක ප්‍රදේශයන් ආරක්ෂාව ලබන්නේ වනජීවී රක්ෂිත ජාලය තුළ ය. දිවයිනෙහි මුලු බිම් පරමාණයෙන් 1 %ක් ඉක්මවන එම වනජීවී රක්ෂිත ජාලය කළමනාකරණය කිරීමෙහි වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි.

## 7.2 මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018

වගුව 7.1

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) | (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 946.3 | 549.81 | 58 |
| පුනරාවර්තන වියදම් | 1,100.00 | 1,097.65 | 100 |
| **මුළු ප්‍රතිපාදන හා වියදම** | **2,046.3** | **1,647.46** | **81** |

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) | (%) |
|---|---|---|---|
| වනජීවී සංරක්ෂණ අරමුදල | 1,509.5 | 967.97 | 64 |
| පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP) | 379.0 | 371.67 | 98 |

*මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

### 7.2.1 සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය 2018

වගුව 7.2

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි) | % |
| 1 | පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය | 7.0 | 5.12 | 73 |
| 2 | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය | 33.00 | 26.08 | 79 |
| 3 | ගොඩනැගිලි ඉදි කිරීම | 25.00 | 20.85 | 83 |
| 4 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | ***9.10 | 8.88 | 98 |
| 5 | යන්ත්‍රොපකරණ මිලදී ගැනීම | 1.0 | 0.99 | 99 |
| 6 | යන්ත්‍රොපකරණ අළුත්වැඩියා කිරීම | 3.0 | 1.79 | 60 |
| 7 | වාහන අළුත්වැඩියාව | 12.0 | 11.86 | 99 |
| 8 | රක්ෂිත ප්‍රදේශවල මායිම් සළකුණු කිරීම | 10.0 | 9.3 | 93 |
| 9 | මානව සම්පත් සංවර්ධනය කිරීම | 20.3 | 20.24 | 100 |
| 10 | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 10.0 | 5.93 | 59 |

| | | | | |
|---|---|---|---|---|
| 11 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය පරතිසංස්කරණය හා සංවර්ධනය කිරිම | 40.0 | 17.38 | 43 |
| 12 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | 35.0 | 20.67 | 59 |
| 13 | විදුලි වැට ඉදිකිරිම | 300.0 | 141.5 | 47 |
| 14 | වනඅලි මිනිස් ගැටුම අවම කිරීම | ***284.4 | 206.79 | 73 |
| 15 | වනඅලි මිනිස් ගැටුම අවම කිරීම—රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | 38.0 | 31.49 | 83 |
| 16 | වනඅලි මිනිස් ගැටුම අවම කිරීම—ජනවිහිදුම්කරණ කටයුතු | 2.0 | 1.88 | 94 |
| 17 | මාදුරුඔය සහ ගල්ඔය ජාතික උද්‍යාන සංවර්ධනය කිරීම | 75.0 | 11.7 | 16 |
| 18 | *පුත්තලම් දිස්ත්‍රික් ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන | 11.5 | 3.21 | 28 |
| 19 | *උතුරු පළාත් ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන | 10.0 | 0 | 0 |
| 20 | **වඳවීමේ තර්ජනයට ලක්වී ඇති වනජීවීන් සංරක්ෂණය | 20.0 | 4.15 | 21 |
| **එකතුව** | | **946.3** | **549.81** | **58** |

**වනජීවී අංශයෙන් ලැබුණ ප්‍රතිපාදන* *මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

***මෙම ප්‍රතිපාදන සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මගින් වියදම් දරන ලදී.*

**** මුල් ඇස්තමේන්තුව වෙනස් කර ඇත. (මූ.රෙ. 66 යටතේ මාරු කර ඇත.)*

### 7.2.2 වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති (සාරාංශය) - 2018

වගුව 7.3

| වැය විෂය | විස්තරය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 3028 | ජාතික උද්‍යානවල පහසුකම් වැඩිදියුණු කිරීම හා වනජීවීන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම | 200.00 | 46.26 | 55 |
| 3029 | බෝට්ටු, වාහන සහ යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 50.00 | 7.26 | 20 |
| 3040 | ජනවිහිදුම්කරණ කටයුතු | 3.08 | 2.96 | 100 |
| 3041 | සමුද්‍ර සංරක්ෂණය | 25.0 | 3.73 | 20 |
| **එකතුව** | | **278.08** | **60.21** | |

*මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

## 7.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

### 7.3.1 විදුලි වැට ඉදි කිරීම



ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධනය වීම හා සංවර්ධන ව්‍යාපෘති සඳහා කැලෑ එළි කිරීම සීඝ්‍රයෙන් සිදුවන බැවින් වන අලින්ගේ නිජබිම් අහිමි වීම හේතුවෙන් වනඅලි ගම්වැදීම වසර ගණනක් තිස්සේ නොකඩවා ඉහල යමින් පවතී. මෙම ගැටුම අවම කිරීම සඳහා ප්‍රධාන භෞතික බාධකයක් ලෙස විදුලි වැට ඉදිකිරීම දැක්විය හැකිය. මෙම වැඩසටහන සඳහා 2018 වසරේදී ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 300.00 |
| වියදම | - රු. මි. 141.50 |

**භෞතික ප්‍රගතිය**

- කි.මී. 90.75ක් දිග විදුලි වැටවල් ඉදි කිරීම අවසන් කර ඇත.
- හොරොව්පතාන ජාතික උද්‍යානයේ ඉදිකර ඇති වනඅලි සංරක්ෂණ උද්‍යානයේ හෙක්ටයාර් 26ක් වාසස්ථාන සුපෝෂණය ඇතුළු විදුලිවැට සහ මාර්ග නඩත්තු කටයුතු සිදුකරන ලදී.
- විදුලි වැට කණු 27,492ක් මිලදී ගෙන ඇත.
- විදුලි වැට පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් පවත්වා ඇත.

### 7.3.2 වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම

විශේෂ වනඅලි සංරක්ෂිත කලාප ස්ථාපිත කිරීම , වනඅලි සංචරණය සඳහා පිවිසුම් මාර්ග ජාලයක් ස්ථාපිත කිරීම, වනඅලි වාසස්ථාන හඳුනාගැනීම හා සංවර්ධනය, වනඅලි රක්ෂිත තත්වය වර්ධනය කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම, විදුලි වැටවල් සැකසීම හා නඩත්තුව, මහජනතාව දැනුවත් කිරීම හා සවිබල ගැන්වීම, වනඅලි රඳවුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, වනඅලි පිළිබඳ විද්‍යාත්මක තොරතුරු ජාලයක් ස්ථාපිත කිරීම, අලි මිනිස් ගැටුම වලක්වාලීම සඳහා වනජීවී පාලන ඒකක පිහිටවීම, වනඅලි සංරක්ෂණය සඳහා අරමුදලක් ස්ථාපනය කිරීම, වෙනත් වනසත්ව හා මිනිස් ගැටුම අවම කිරීම, මෙමගින් අපේක්ෂිත අරමුණු වේ.

#### 7.3.2.1 අලි මිනිස් ගැටුම අවම කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 284.40 |
| වියදම | - රු. මි. 206.79 |

**භෞතික ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් දැනට ඉදි කර ඇති විදුලි වැටවල් නඩත්තු කරමින් පවතී. මේ සඳහා සිවිල් ආරක්ෂක නිලධාරීන් 1,662ක් සහ වනජීවී කාර්යාල වලට නිලධාරීන් 390ක් අනුයුක්ත කර ඇත.
- වනඅලි පාලන ඒකක 05 මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සිදු කරන ලදී.
- ජාතික රූපවාහිණී සංස්ථාව මඟින් සොබාධාරා රූපවාහිනි වැඩසටහන් 50ක් නිෂ්පාදනය කර විකාශනය කර ඇත.
- යෝජිත වනඅලි සංක්‍රමණ මාර්ග 9ක් සිතියම් ගත කර අවසන් කර ඇත
- වනජීවී කලාප සඳහා කන්ටේනර් පෙට්ටි 10ක් සහ වල් කපන යන්ත්‍ර (Grass Cutter) 204ක් මිල දී ගෙන ඇත.

#### 7.3.2.2 ජනවිඥිදුම්කරණ වැඩසටහන

ප්‍රතිපාදන - රු. මි. 2.0
වියදම - රු. මි. 1.89

- සහභාගිත්ව කළමණාකරන සැලසුම් මඟින් ප්‍රජා පාදක ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා වැඩසටහන් 2ක්, ශ්‍රමදාන වැඩසටහන් 04ක් හා වනජීවී රක්ෂිත අවට ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් 08ක් පවත්වා ඇත.

#### 7.3.2.3 වාසස්ථාන සුපෝෂණය

ප්‍රතිපාදන - රු. මි. 38.0
වියදම - රු. මි. 31.49

- විල්මැන්න අභයභූමියේ සහ යාල ජාතික උද්‍යානයේ වැව් 03ක් අළුත්වැඩියා කර ඇත.
- විල්පත්තු, කුමන, වස්ගමුව සහ යාල ජාතික උද්‍යානවල හෙක්. 225ක් දුරට මාර්ගවල යටි රෝපණ ඉවත් කිරීම සිදුකර ඇත.
- හෙක්ටයාර් 200ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සහ තෘණ භූමි නඩත්තු අවසන් කර ඇත.
- දිය පොකුණු ඇතුළු ජල ප්‍රභවයන් 29ක සංවර්ධන කටයුතු සිදුකර ඇත.
- මාදුරුඔය ජාතික උද්‍යානයේ ජල සැපයුම් පද්ධති 02ක් සඳහා ජල නල එළීමේ කටයුතු සිදු කර ඇත.

### 7.3.3 රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය කිරිම

**මූල්‍ය ප්‍රගතිය**

ප්‍රතිපාදන - රු. මි. 35.00
වියදම - රු. මි. 20.67

**භෞතික ප්‍රගතිය**

- රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය යටතේ හෙක්ටයාර් 20 ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම, හෙක්ටයාර් 53 ක වාසස්ථාන සුපෝෂණය සිදු කිරීම,වැව් 2 ක අළුත්වැඩියා කටයුතු සහ දිය වලවල් 06ක් ඉදි කිරීම් කටයුතු සිදු කර ඇත.
- විල්පත්තු ජාතික උද්‍යානයේ ජල සම්පාදන පද්ධති 01ක් ස්ථාපිත කරන ලදී.
- බුද්ධංගල අභයභූමියේ ජල මූලාශ්‍රයක් ඉදි කර අවසන් කර ඇත

### 7.3.4 රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

ප්‍රතිපාදන - රු. මි. 40.00
වියදම - රු. මි. 17.38




වනජීවී රක්ෂිත ප්‍රදේශවල මාර්ග ප්‍රතිසංස්කරණය

**භෞතික ප්‍රගතිය**

සපත්තු පාලම් 38ක් සහ ජාතික උද්‍යානවල මාර්ග පද්ධතියේ කි.මී. 73ක් සංවර්ධනය කර ඇත.

### 7.3.5 රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 10.00 |
| වියදම | - රු. මි. 5.93 |

**භෞතික ප්‍රගතිය**

- කාර්යාල සහ නිල නිවාස සඳහා ජල සැපයුම් පද්ධති 12ක් සහ විදුලි සැපයුම් පද්ධති 13ක් අවසන් කර ඇත.
- කාර්යාල වැසිකිළි පද්ධති 04ක් පිළිසකර කිරීම.

### 7.3.6 මාදුරු ඔය සහ ගල් ඔය ජාතික උද්‍යාන සංවර්ධනය කිරීම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 75.0 |
| වියදම | - රු. මි. 11.7 |

**භෞතික ප්‍රගතිය**

- කි.මී.76ක මාර්ග පද්ධතිය ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.
- ගිම්හාන කුටි 03 ක් ඉදිකිරීම් සිදුකර ඇත.
- සංචාරක බංගලා 02ක් අළුත්වැඩියා කිරීම හා දේශන ශාලාව, නිවාඩු නිකේතනය ඉදිකරමින් පවතී

### 7.3.7 පුත්තලම ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 11.50 |
| සංශෝධිත ප්‍රතිපාදන | - රු.මි. 6.30 |
| **වියදම** | **- රු. මි. 3.21** |

**භෞතික ප්‍රගතිය**

- විල්පත්තුව ජාතික උද්‍යානයේ ගගේ වාඩිය ප්‍රදේශයේ බයෝ බැබ් ගස වටා ඇවිදින මංතීරුව සකස් කිරීම හා භූමි අලංකරණය සිදුකිරීම එම ගස වටා ආරක්ෂිත බැම්මක් ඉදිකිරීම සහ බෝට්ටු අංගනයක් ඉදිකිරීම සිදුකර ඇත.

- එළුවන්කුලම උද්‍යාන පිවිසුමේ භූමි අලංකරණ කටයුතු කිරීම, ගිම්හාන කුටියක් ඉදිකිරීම සිදුකර ඇත.
- විල්පත්තුව ජාතික උද්‍යානයේ කුදිරමලේ ගිම්හාන කුටියක් ඉදිකර ඇත.

### 7.3.8 උතුරු පළාත් ඒකාබද්ධ සංචාරක සංවර්ධන සැලැස්ම

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 10.0 |
| වියදම | - රු. මි. 0.00 |

**භෞතික ප්‍රගතිය**

**සටහන :**

උතුරු ප්‍රදේශයේ සංචාරක විභවතාවයක් ඇති ප්‍රදේශ හඳුනාගැනීම සඳහා සහ එම ප්‍රදේශයේ ජෛව විවිධත්වය පිළිබඳ සොයා බැලීම සඳහා පර්යේෂණ සිදුකිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම වුවත් ඒ සඳහා ආයතනයක් තෝරා ගැනීම සඳහා තුන්වරක් මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදුකලද නමුත් කිසිම ආයතනයක් ඒ සඳහා ඉදිරිපත් වී නොමැත.

### 7.3.9 වෙනත් ආයතන වලින් ලද ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

**මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු**

**අරමුණු**

- කළුගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සහ එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම.
- ඉහත ප්‍රදේශයේ වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා වනජීවී බාධක පිහිටුවීම (විදුලි වැටවල්, අගල් කැපීම ආදිය).
- වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාපෘතියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| ප්‍රතිපාදන | - රු. මි. 73.90 |
| වියදම | - රු. මි. 32.46 |

**භෞතික ප්‍රගතිය**

- වස්ගමුව ජාතික උද්‍යානයේ මාර්ග දෙපස කි.මී. 40ක් දුරට යටි කැලය සහ තවත් හෙක්ටාර් 40ක ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සිදුකර ඇත.

- වස්ගමුව ජාතික උද්‍යානයේ දකුණු මායිම මැනුම් කර ඇත
- විදුලි වැට කි.මී. 15ක් අවසන් කර ඇත.
- බකමූණ, අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ දියබෙදුම බීට්ටු කාර්යාලය, කවුඩුල්ල ජාතික උද්‍යානයේ මැදිරිගිරිය බීට්ටු කාර්යාලය, නිල නිවස සහ මාදුරුඔය ජාතික උද්‍යානයේ පනිජ්ජඔය බීට්ටු කාර්යාලය අළුත්වැඩියාවන් සිදු කර ඇත.
- මින්නේරිය ජාතික උද්‍යානයේ රඹවිල වනජීවී සංචාරක නිවාසය ඉදිකර 2018 මාර්තු මස 30 දින ගරු තිරසර සංවර්ධන හා වනජීවී ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.
- අංගම්මැඩිල්ල ජාතික උද්‍යානයේ ප්‍රවේශ පත්‍ර කවුළුව සහ නැරඹුම් මධ්‍යස්ථානය ඉදි කිරීමේ කටයුතු අවසන් කර ඇත.
- කවුඩුල්ල ජාතික උද්‍යානයේ ගොඩනැගිලි 02ක් අළුත්වැඩියා කිරීම් සිදුකර ඇත.
- වස්ගමුව ජාතික උද්‍යානයේ කිරිඔය සංචාරක මධ්‍යස්ථානය ඉදි කිරීම 50% පමණ සිදු කර ඇත.

## 7.4 2018 වර්ෂයේ සිදුකරන ලද සුවිශේෂ සේවාවන් හා වැඩසටහන්

දිවයින පුරා වන අලි උවදුර හේතුවෙන් පීඩාවන්ට පත් වු ජනතාව සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා වනඅලි හානි සඳහා වන්දි ගෙවීම පහත සදහන් පරිදි ගෙවීම් සිදුකර ඇත.

වගුව 7.4

| වන්දි වර්ගය | 2018.12.31 දිනට වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව | 2018.12.31 දිනට ගෙවීම් (රු.මි.) |
|---|---|---|
| ජීවිත හානි | 95 | 45.50 |
| ශාරීරික හානි | 37 | 4.43 |
| දේපල හානි | 838 | 44.27 |
| **එකතුව** | **970** | **94.20** |

*මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

(ඉහත වන්දි මුදල් තුළ 2018 වසරේ සිදුවූ හානිවලට අමතරව 2018 වසරට පෙර වසරවල සිදු වූ එහෙත් 2018 වසරේදී ඉදිරිපත් වූ ඉල්ලීම් සඳහා ගෙවීම් ද අතුලත් වේ.)

- WILDLANKA අන්තර් ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 වසරේ අගෝස්තු මස 07, 08 හා 09 තෙදින තුල Watege හෝටලයේදී “මුහුදේ සිට ගොඩබිම දක්වා සංරක්ෂණය” තේමාව යටතේ දේශීය හා විදේශීය පර්යේෂකයින් රැසකගේ සහභාගිත්වයෙන් පැවත් විය.

## 7.5 විදේශ ව්‍යාපෘති

### පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

ලෝක බැංකු ආධාර මත පරිසර පද්ධති සංරක්ෂණ හා කළමණාකරණ ව්‍යාපෘතිය (ESCAMP) 2017-2021 දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක වන අතර මේ සඳහා ඇමෙරිකන් ඩොලර් මි. 45ක ප්‍රතිපාදන පහත සඳහන් සංරචක ක්‍රියාත්මක කිරීමට වෙන් වී ඇත.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ තෝරාගත් රක්ෂිත ප්‍රදේශවල ඇතුලත හා පිටත ගොඩබිම්, සමුද්‍රීය සහ තෙත් බිම් පරිසර පද්ධති කළමනාකරණ ක්‍රියාවලීය වැඩිදියුණු කිරීම වේ.

### 7.5.1 මූල්‍ය ප්‍රගතිය (සාරාංශය) - 2018

වගුව 7.5

| | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය(රු.මි) |
|---|---|---|---|
| 1 | වනජීවී රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම | 0.48 | 0.48 |
| 2 | අලි-මිනිස් යහපැවත්ම තුලින් වනඅලි හානි අවම කිරීම | 120.42 | 116.74 |
| 3 | වනජීවී රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සහ කළමණාකරනය | 84.50 | 81.06 |
| 5 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතන ධාරිතාව සහ අයෝජන හැකියාව වර්ධනය කිරීම | 173.60 | 173.39 |
| | **එකතුව** | **379.0** | **371.67** |

*මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*


### 7.6 සංචාරක පැමිණීම සහ ආදායම - 2018

වගුව 7.6

| ජාතික උද්‍යානය | සංචාරක පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| යාල | 317,878 | 311,368 | 629,246 | 19.23 | 684.66 | 273.88 | 977.78 |
| හෝටන් තැන්න | 293,626 | 117,632 | 411,258 | 16.29 | 275.03 | 125.95 | 417.27 |
| උඩවලව | 199,822 | 211,810 | 411,632 | 11.87 | 496.66 | 200.82 | 709.35 |
| වස්ගමුව | 32,708 | 2,545 | 35,253 | 1.01 | 3.47 | 7.62 | 12.10 |
| මින්නේරිය | 93,336 | 97,578 | 190,914 | 5.53 | 222.66 | 77.33 | 305.52 |
| බූන්දල | 85,571 | 12,199 | 97,770 | 0.54 | 19.00 | 10.83 | 30.37 |
| හොරගොල්ල | 7,346 | 5 | 7,351 | 0.27 | 0.01 | 0.04 | 0.32 |
| කවුඩුල්ල | 129,221 | 157,114 | 286,335 | 5.08 | 240.67 | 113.17 | 358.92 |
| ලුණුගම්වෙහෙර | 2,892 | 1118 | 4,010 | 0.13 | 1.69 | 5.80 | 7.62 |
| ගල්ඔය | 12,053 | 3,783 | 15,836 | 0.35 | 2.13 | 9.73 | 12.22 |
| කුමන | 32,538 | 9,554 | 42,092 | 1.25 | 15.04 | 13.24 | 29.53 |
| අංගම්මැඩිල්ල | 3,704 | 9 | 3,713 | 0.14 | 0.02 | 0.67 | 0.83 |
| ගැල්වේස්ලෑන්ඩ් | 5,767 | 277 | 6,044 | 0.22 | 0.42 | 0.15 | 0.79 |
| විල්පත්තු | 60,869 | 32,991 | 93,860 | 3.55 | 76.88 | 49.26 | 129.69 |
| මදුරුඔය | 2,299 | 570 | 2,869 | 0.10 | 0.99 | 1.25 | 2.35 |
| ලාහුගල | 797 | 42 | 839 | 0.01 | 0.07 | 1.16 | 1.24 |
| පරෙවි දූපත් | 86,885 | 33,120 | 120,005 | 3.64 | 49.35 | 23.97 | 76.96 |
| හික්කඩුව | 30,280 | 3,699 | 33,979 | 0.14 | 0.10 | 0.00 | 0.24 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 198,043 | 99,880 | 297,923 | 3.39 | 43.29 | 9.95 | 56.62 |
| කලා වැව | 1,153 | 93 | 1,246 | 0.05 | 0.14 | 0.22 | 0.41 |
| වැලිපර අභය භූමිය | 14,000 | 5,048 | 19,048 | 0.28 | 6.21 | 2.31 | 8.80 |
| එකතුව | **1,610,788** | **1,100,435** | **2,711,223** | **73.08** | **2,138.49** | **927.35** | **3,138.91** |

*මූලාශ්‍රය: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

# 8.
# ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව



## 8. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

**දැක්ම**

"ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම."

**මෙහෙවර**

"නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීති වලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම."

**ප්‍රධාන පරමාර්ථ**

- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණය
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය

## 8.1 හැඳින්වීම

වන සතුන් පිටරට සත්වෝද්‍යාන වෙත ප්‍රවාහනය කරන තුරු රඳවා තබා ගන්නා පුද්ගලික වන සත්ත්ව එකතුවක් ලෙස 1920 දශකයේ පෙර භාගයේ දී දෙහිවල ප්‍රදේශයේ අක්කර 11ක භූමි භාගයක් තුළ ජර්මන් ජාතික ජෝන් හාගෙන්බර්ග් මහතා විසින් ආරම්භ කරන ලද දෙහිවල සත්වෝද්‍යානය වර්ෂ 1936 ජූලි 01 වන දින රජයට පවරා ගන්නා ලදී.

පසුව මෙම සත්වෝද්‍යානය වර්ෂ 1946 දී ස්වාධීන රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදී. පසුව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ පාලනය සහ කළමනාකරණය කිරීමේ කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන යටතට පත් කරන ලදී.

මේ වන විට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දෙහිවල ජාතික සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානයේ ශ්‍රී ලංකානු කලාපය සහ රිදියගම සෆාරි උද්‍යානය යන උද්‍යාන ද ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ ද පාලනය වේ.

## 8.2 සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය - 2018

වගුව 8.1

| වැඩසටහන | ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන (රු.මි) | ඒකාබද්ධ අරමුදලේ වියදම (රු.මි) | *අරමුදලේ ප්‍රතිපාදන (රු.මි) | *අරමුදලේ වියදම (රු.මි) | මුළු ප්‍රතිපාදන (රු.මි) | මුළු වියදම (රු.මි) | % |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම | 5.65 | 5.63 | | | 5.63 | 5.63 | 100 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 10.58 | 10.58 | | | 10.58 | 10.58 | 100 |
| මානව සම්පත් සංවර්ධනය | 0.95 | 0.90 | | | 0.95 | 0.90 | 95 |
| දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය ** (අයවැය යෝජනා සමග) | 150.0 | 59.67 | 70.00 | 64.25 | 220.0 | 123.92 | 56 |
| පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය ** (අයවැය යෝජනා සමග) | 175.0 | 77.93 | 50.00 | 49.84 | 225.0 | 127.77 | 57 |
| පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය | 96.45 | 43.49 | 40.00 | 26.05 | 136.45 | 69.54 | 51 |
| හම්බන්තොට සෆාරි උද්‍යානය සංවර්ධනය | 294.87 | 100.29 | 120.00 | 93.38 | 414.87 | 193.67 | 47 |
| නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම | | | 50.00 | 27.96 | 50.0 | 27.96 | 55 |
| වාහන අත්පත් කර ගැනීම | | | | | | | |
| වෛද්‍ය උපකරණ මිලදීගැනීම | | | 45.00 | 22.25 | 45.0 | 22.25 | 49 |
| සතුන් මිලදී ගැනීම | | | 100.00 | | 100.0 | | |
| ප්‍රාග්ධන වියදම් | 733.50 | 298.48 | 475.00 | 283.74 | 1208.5 | 582.22 | 48 |

*සත්වෝද්‍යාන සංවර්ධන සහ සුභ සාධන අරමුදල

මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

** දෙහිවල සත්වෝද්‍යානය - හිපෝ අරණ ඉදිකිරීම (රු.මි 75)

** පින්නවල අලි අනාථාගාරය - නිදහස් අලි අරණෙහි බගී රථ මාර්ගය ,නැරඹුම් මැදිරිය ,අප ජලය පිරිපහදු ඒකකය (රු.මි 75)

8.2.1 මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018 වගුව 8.2

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රාග්ධන (රු.මි) | | | පුනරාවර්තන (රු.මි) | | මුළු ප්‍රතිපාදන හා වියදම (රු.මි) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | සත්‍ය වියදම | අතැති බිල්පත් | ප්‍රතිපාදන | සත්‍ය වියදම | ප්‍රතිපාදන | සත්‍ය වියදම | සත්‍ය ප්‍රගතිය % | අතැති බිල්පත් සමග ප්‍රගතිය % |
| රජයේ ඒකාබද්ධ අරමුදල | 733.50 | 298.48 | 107.06 | 421.21 | 420.92 | 1154.71 | 719.40 | 62 | 71 |
| සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල | 475.00 | 283.74 | 50.13 | 551.22 | 509.15 | 1026.22 | 792.89 | 77 | 82 |
| **එකතුව** | **1208.50** | **582.22** | **157.19** | **972.43** | **930.07** | **2180.93** | **1512.30** | **69** | **76** |

*මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව*

*සටහන:*
*2018.12.31 දින වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම සඳහා රු.මි.107.06ක් සහ සත්වෝද්‍යාන සංවර්ධන හා සුබ සාධන අරමුදලින් ගෙවීම සඳහා රු.මි.50.13ක බිල්පත් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සතුව පැවතුණි. නමුත් අපේක්ෂා කළ අයුරින් රජයේ ඒකාබද්ධ අරමුදලින් මුදල් නොලැබුනු නිසා 2018 වසර සඳහා අපේක්ෂා කළ මූල්‍ය ප්‍රගතිය අත් කර ගැනීමට අපහසු විය.*

## 8.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

### 8.3.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

නවීන සත්වෝද්‍යාන සංකල්ප වලට අනුව සත්ත්වයින් සඳහා වැඩි ඉඩකඩ සහිත සත්ත්ව අරණ සහ නරඹන්නන් සඳහා නවීන පහසුකම් සපයමින් 2010 වර්ෂයේ සිට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ නවීකරණ කටයුතු ආරම්භ කර ඇත.



සත්ත්ව රෝහල



ළමා මුළුව

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු.මි. 220.00 |
| වියදම | - රු.මි. 123.92 |
| අතැති බිල්පත් සමග | - රු.මි. 169.12 |

**භෞතික ප්‍රගතිය**

- සත්ත්ව රෝහල පළමු අදියරෙහි 95% ක වැඩ අවසන් කර ඇත.
- නව ප්‍රවේශ ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කර ඇත.
- ළමා උයන අළුත්වැඩියා කිරීම සිදුකර ඇත.
- මායිම් තාප්පය අලුත්වැඩියාව සිදුකර ඇත.
- නිදහස් අලි අරණෙහි නරඹන්නන් සඳහා මාර්ගය ඉදිකර අවසන් කර ඇත.
- හිපෝ අරණ නැවත ඉදිකිරීම් 70%ක් සිදුකර ඇත

- වැසිකිලි පද්ධතිය ඉදිකිරීම් 65%ක් අවසන් කර ඇත.

### 8.3.2 පින්නවල අලි අනාථාගාරය



සේවා සපයන මාර්ගය

**මූල්‍ය ප්‍රගතිය**

| | | |
|---|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු.මි. | 225.00 |
| වියදම | - රු.මි. | 127.77 |
| අතැති බිල්පත් සමග | - රු.මි. | 161.01 |

**භෞතික ප්‍රගතිය**



අලි මඩු ඉදිකිරීම

- සත්ත්ව ආහාර කැබලි කරන සහ අප ද්‍රව්‍ය කුඩා කැබලි කරන යන්ත්‍ර මිලදී ගැනීම සඳහා (Food Cutter and Garbage Crusher) කටයුතු කරමින් පවතී.
- බගී රථ මිලදී ගෙන ඇත.
- වැව පුළුල් කිරීම 80%ක් ඉදිකිරීම් අවසන් කර ඇත.
- නිදහස් අලි අරණෙහි බගී රථ මාර්ගය 36%ක් නැරඹුම් මැදිරිය 95%ක් හා අප ජලය පිරිපහදු ඒකකය 60%ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- ආපන ශාලා හා වැසිකිලි පද්ධතිය80%ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- අලි මඩු ඉදිකිරීම ,අකුණු සන්නායක සවිකිරීම, සේවා සපයන මාර්ගය (නිදහස් අලිපෙදෙස), සූර්ය පැනල ස්ථාපනය කිරීම හා කුඩා පරිමාණ සංවර්ධන කටයුතු නිමකර ඇත.

### 8.3.3 පින්නවල නව සත්වෝද්‍යානය



සමනළ උයන

**මූල්‍ය ප්‍රගතිය**

| | | |
|---|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු.මි. | 136.40 |
| වියදම | - රු.මි. | 69.54 |
| අතැති බිල්පත් සමග | - රු.මි. | 99.72 |



ජලජ පක්ෂි දූපත අදියර 1

**භෞතික ප්‍රගතිය**

- පශු වෛද්‍ය රෝහල සඳහා උපකරණ මිලදී ගැනීම හා බගී රථ මිලදීගැනීම සිදුකර ඇත.
- පශු වෛද්‍ය අංශය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම් සිදුකර ඇත.
- සමනළ උයන ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- සමනළ පර්යේෂණ මධ්‍යස්ථානය ,වඳුරු දූපත -II ,මෝදරවත්ත රථගාල ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.
- ජලජ පක්ෂි දූපත - අදියර I ඉදිකිරීම් අවසන්කර ඇත.
- ප්‍රවේශ ගොඩනැගිල්ලේ විවේක කාමරයේ වහලය අළුත්වැඩියා කිරීම 70% අවසන් කර ඇත.

- වැසි වන ගොමු ඉදිකිරීම් අවසන් කර ඇත

### 8.3.4 හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු

**මූල්‍ය ප්‍රගතිය**

| | | |
|---|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු.මි. | 414.87 |
| වියදම | - රු.මි. | 193.67 |
| අතැති බිල්පත් සමග | - රු.මි. | 243.07 |



ද්විත්වදොර සහිත ආරක්ෂිත ගේට්ටුව - පිටවීම

**භෞතික ප්‍රගතිය**

- බෙංගාලි කොටි කලාපයේ භූමි අලංකරණ කටයුතු, ද්විත්ව දොර සහිත ආරක්ෂක ප්‍රවේශ හා පිටවීමේ ගේට්ටු සැකසීම හා විදුලිවැට ඉදිකිරීම නිම කර ඇත.
- ජිරාෆ් පෙදෙසෙහි විදුලිවැට වැඩ අවසන් කර ඇත.
- සුරතල් සත්ව කලාපය 90%ක් අවසන් කර ඇත.
- චීටා කලාපයේ ද්විත්ව දොර සහිත ආරක්ෂක ප්‍රවේශ ගේට්ටුව ඉදිකිරීම, සෆාරි මාර්ගයේ ඉදිකිරීම් 68%ක් හා ආසියානු අලි කලාපය අදියර 2 හා චීටා කලාපය අතර ඇති 16 චේන්ලින්ක් වැට 64%ක් ඉදිකිරීම් අවසන් කර ඇත.



මාර්ග පද්ධතිය; නරඹන්නන් සහ බගී රථ සඳහා - අදියර - 01

- කුඩා සෆාරි උද්‍යානයේ ශාක භක්ෂක සත්ත්ව කලාපයේ ඉදිකිරීම් අවසන් කර සතුන් ඇතුලත් කර ඇත.
- අලි අරණ සහිත ආසියානු කළාපයේ රුක් නිවාස හා බොරළු මාර්ගය අඩක් නිමකර ඇත. සුරතල් සත්ත්ව කලාපය අතර අලි මඩු ඉදිකිරීම් අවසන් කර ඇත.
- කුඩා සෆාරි උද්‍යානයේ සේවා සපයන මාර්ග 93%ක් වැඩ අවසන් කර ඇති අතර නරඹන්නන් හා බගී රථ සඳහා මාර්ග පද්ධතිය ඉදිකිරීම් අවසන් කර ඇත.
- සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ 63%ක් වැඩ අවසන් කර ඇති අතර සමනළ උයන නැවත ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් කරුවකුට ලබාදී ඇත.
- කුළුණු මත රඳවන ජල ටැංකිය හා අප ජල ටැංකියෙහි 50%, නිල නිවාස සහ සේවා සපයන මාර්ග හා එහි විදුලි සැපයුම් අදියර 2 45%, ආපන ශාලාව සැකසීම 84%ක ඉදිකිරීම් අවසන් කර ඇත.
- සේවා කලාපය තුල කබානා 4ක් ඉදිකිරීම් සිදුකර ඇත.
- ෆුට් බාත් (Foot bath) ඉදිකර අවසන්.
- අංක 03 සිංහ ගුහාව 90%ක් හා අප්‍රිකානු අලි අරණ 55%ක් වැඩ අවසන් කර ඇත.

### 8.3.5 සත්ත්ව ආහාර සපයන ගෝනපොල ගොවිපළ

දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාකභක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාර වලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපළ 1997 වර්ෂයේ දී හොරණ- ගෝනපොල ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුල ස්ථාපිත කරන ලදී. (2018 අයවැය යෝජනා යටතේ සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම් කටයුතු සිදුකරයි.)

**මූල්‍ය ප්‍රගතිය**

*මුළු ප්‍රතිපාදන - රු.මි. 20.00
වියදම - රු.මි. 4.79

** වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වැය ශීර්ෂය හරහා ප්‍රතිපාදන ලැබී ඇත.*

**භෞතික ප්‍රගතිය**

- කබල්ලෑවා, උණහපුළුවා, කොළ දිවියා යන සතුන් සංරක්ෂණය කිරීමේ අරමුණින් ඉදිකරනු ලබන සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 70%ක් නිමකර ඇත.

## 8.4 2018 වර්ෂයේ විශේෂ වැඩසටහන්

- සිංහල හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් අලි ඇතුන් උදෙසා හිස තෙල් ගෑමේ උත්සවය පැවැත්වීම
- 2018 අගෝස්තු මස 12 වැනිදාට යෙදුණු **"ලෝක අලි දිනය"** ට සමගාමීව පින්නවල අලි අනාථාගාරයේ අලි ඇතුන්ට හා සේවකයින් සඳහා ආශිර්වාදාත්මක පිරිත් සජ්ඣායනයක් සහ අලි ඇතුන් සඳහා වන පළතුරු දානමය පිංකමක් සංවිධානය කරන ලදි.
- පින්නවල අලි අනාථාගාරයේදී 2018.12.14 වන දින" වන දිවිය" අතිරේකයේ චිත්‍ර වැඩමුළුව පවත්වන ලදී.
- ලෝක ළමා දිනය වෙනුවෙන් සෑම උප ආයතනයක්ම අධ්‍යාපනික හා විනෝදාත්මක වැඩසටහන් පැවැත්වීම.

## 8.5 සංචාරක පැමිණීම සහ ආදායම – 2018

වගුව 8.3

| උද්‍යානය | පැමිණීම | | | ආදායම (රු.මි.) | | | |
|---|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | වෙනත් | එකතුව |
| දෙහිවල සත්වෝද්‍යානය | 1,537,694 | 30,902 | 1,568,596 | 123.98 | 45.42 | 26.70 | 196.10 |
| පින්නවල අලි අනාථාගාරය | 588,266 | 337,662 | 925,928 | 43.47 | 649.51 | 14.52 | 707.49 |
| පින්නවල සත්වෝද්‍යානය | 301,699 | 3,788 | 305,487 | 22.83 | 2.37 | 6.45 | 31.65 |
| හම්බන්තොට සෆාරි උද්‍යානය | 296,576 | 754 | 297,330 | 68.37 | 1.54 | 1.27 | 71.17 |
| **එකතුව** | **2,724,235** | **373,106** | **3,097,341** | **258.65** | **698.84** | **48.93** | **1,006.42** |

*මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව*

## 8.6 සත්ත්ව සංරක්ෂණය සහ අභිජනනය

වගුව 8.4

| 2018.12.31 දිනට සත්ව එකතුව | | | | 2018 වර්ෂය තුල ජාතික සත්වෝද්‍යානය තුළ උපත ලද සතුන් | |
|---|---|---|---|---|---|
| සත්ව වර්ගීකරණය | | විශේෂ/පවුල් | සත්ත්වයින් ප්‍රමාණය | විශේෂ/පවුල් | සත්ත්වයින් ප්‍රමාණය |
| දෙහිවල ජාතික සත්වෝද්‍යානය | | | | | |
| 1 | ක්ෂීරපායී | 63 | 313 | 13 | 30 |
| 2 | පක්ෂි | 78 | 809 | 04 | 29 |
| 3 | උරග | 33 | 167 | 01 | 07 |
| 4 | මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන් | 68 | 3151 | | |
| එකතුව | | **242** | **4440** | **18** | **66** |
| පින්නවල අලි අනාථාගාරය | | | | | |
| 1 | **ක්ෂීරපායී - ආසියානු අලියා** | 01 | 86 | | |
| **එකතුව** | | **01** | **86** | | |
| පින්නවල සත්වෝද්‍යානය | | | | | |
| 1 | ක්ෂීරපායී | 12 | 136 | 07 | 18 |
| 2 | පක්ෂි | 06 | 34 | | |
| 3 | උරග | 03 | 09 | | |
| **එකතුව** | | **21** | **179** | **07** | **18** |
| හම්බන්තොට සෆාරි උද්‍යානය | | | | | |
| 1 | ක්ෂීරපායී | 35 | 303 | 08 | 21 |
| 2 | පක්ෂි | 16 | 61 | | |
| 3 | උරග | 04 | 694 | | |
| **එකතුව** | | **55** | **1058** | **08** | **21** |
| ගෝනපොල - ගොවිපළ | | | | | |
| 1 | ක්ෂීරපායී | 02 | 11 | | |
| 2 | පක්ෂි | 05 | 148 | 01 | 20 |
| **එකතුව** | | **07** | **159** | **01** | **20** |
| **මුළු එකතුව** | | **246** | **5922** | **34** | **125** |

*මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව*

## 8.7 සත්ව හුවමාරු වැඩසටහන් -2018

වගුව 8.5

| අපනයනය කරන ලද සතුන් | | | | |
|---|---|---|---|---|
| සත්ව වර්ගය | ප්‍රමාණය | | අපනයනය දිනය | සත්වෝද්‍යානය සහ රට |
| | ගැහැණු | පිරිමි | | |
| ඇනකොන්ඩා | 01 | 01 | 2018.04.28 | Sri Chamarajendra Zoological Gardens, Mysore, India |

| ආනයනය කරන ලද සතුන් | | | | |
|---|---|---|---|---|
| සත්ව වර්ගය | ප්‍රමාණය | | ආනයනය දිනය | සත්වෝද්‍යානය සහ රට |
| | ගැහැණු | පිරිමි | | |
| කැන්ගරු | 03 | 01 | 2018.03.15 | Nagoya Higashiyama Zoo, Japan |

*මූලාශ්‍රය: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව*

# 9.
# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව



## 9. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

### දැක්ම

උද්භිද විද්‍යාත්මක හා සෞන්දර්යාත්මක කටයුතු උසස් මට්ටමකින් පවත්වාගනිමින් නිවර්තන කලාපීය හොඳම උද්භිද උද්‍යාන බවට පත් වීම.

### මෙහෙවර

ස්වාභාවික සහ නිර්මිත පරිසරයන් තුල ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය, අගය කිරීම තුලින් ශාක සම්පත ජනතාවට සමීප කරවීම.

### කාර්යභාරය

1. ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමෙහිලා පරිබාහිර සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
2. අධ්‍යාපන හා සන්නිවේදන ක්‍රමවේද උපයෝගි කරගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත පිළිබඳව හා ශාක සම්පත සමග බැඳී පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ නිවැරැදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබා දීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මල්වගා ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ පර්යේෂණ හා තාක්ෂණ ක්‍රමවේද අත් හදා බැලීම හා ක්‍රියාවට නැංවීම.
4. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වා ගෙන යාම.
5. සුදුසු ස්ථාන වල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍ය වන්නා වූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම.
6. අලංකරණ උද්‍යාන විද්‍යාව(Amenity Horticulture) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
7. ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුත් වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම.
8. අනුරාධපුර ජයසිරි මහබෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

## 9.1 හැඳින්වීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, උද්භිද විද්‍යාත්මක කටයුතු සම්බන්ධ ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනය වේ. ශාක විතැන් සංරක්ෂණය සහ ශාක පිළිබඳ අධ්‍යයන කටයුතු ,උද්‍යාන අලංකරණ පිළිබඳ විද්‍යාත්මක කටයුතු ප්‍රවර්ධනය සඳහා වන පර්යේෂණාත්මක සහ තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා හඳුන්වා දීම, මල්වගා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව විශාල දායකත්වයක් ලබාදෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනාගත් ස්ථානයන් ද වේ.

ප්‍රධාන උද්භිද උද්‍යානයන් වන පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861), ගම්පහ පිහිටි හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය (1876) සහ ගනේවත්ත වන ඖෂධ උද්‍යානයට අමතරව මෑතකාලයේදී පිළිවෙලින් 2013 සහ 2015 වර්ෂයන් හි හම්බන්තොට පිහිටි මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය සහ අවිස්සාවේල්ලෙහි පිහිටි සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය මහජනතාවට විවෘත කර තිබේ.

මීට අමතරව ජාතික ශාකාගාරය සංවර්ධනය, මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් පැවැත්වීම, සුවහස් මල්සෙවන කාර්යාලය මගින් සුවහස් මල් සංගම් වල නිෂ්පාදනය අලෙවි කිරීම, අතිගරු ජනාධිපතිතුමාගේ සහ ගරු අගමැතිතුමාගේ නිල නිවාස යාබඳ උද්‍යාන නඩත්තු හා පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් වල උද්‍යානවල කළමනාකරණ කටයුතු ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

## 9.2 මූල්‍ය ප්‍රගතිය සාරාංශය - 2018

වගුව 9.1

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මි) | *වියදම (රු.මි) | % |
|---|---|---|---|
| ප්‍රාග්ධන | 397.70 | 384.56 | 97 |
| පුනරාවර්තන | 412.51 | 404.73 | 98 |
| මුළු ප්‍රතිපාදන හා වියදම | 810.21 | 789.18 | 97 |

*අතැති බිල් සමග

*මූලාශ්‍රය: ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව*

### 9.2.1 සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය - 2018

වගුව 9.2

| වැඩසටහන | **ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන (වෙනත් වියදම් සමග) (රු.මි) | ඒකාබද්ධ අරමුදලේ වියදම (රු.මි) | උද්භිද උද්‍යාන අරමුදලේ ප්‍රතිපාදන (රු.මි) | උද්භිද උද්‍යාන අරමුදලේ වියදම (රු.මි) | මුළු ප්‍රතිපාදන (රු.මි) | *මුළු වියදම (රු.මි) | % |
|---|---|---|---|---|---|---|---|
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 8.29 | 8.29 | 66.22 | 66.22 | 74.52 | 74.51 | 100 |
| ගම්පහ උද්භිද උද්‍යානය සංවර්ධනය | 23.71 | 22.36 | 8.12 | 8.09 | 31.82 | 30.46 | 95 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| හක්ගල උද්භිද උද්‍යානය සංවර්ධනය | 4.59 | 4.15 | 45.90 | 45.88 | 50.48 | 50.36 | 99 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය | 6.87 | 6.78 | 0.00 | 0.00 | 6.87 | 6.78 | 100 |
| මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය | 7.50 | 7.48 | 0.00 | 0.00 | 7.50 | 7.48 | 99 |
| අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන | 0.50 | 0.45 | 1.12 | 1.12 | 1.63 | 1.57 | 97 |
| ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ වැඩසටහන | 1.57 | 1.56 | 16.00 | 15.86 | 17.57 | 17.43 | 99 |
| ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන | 60.50 | 60.33 | 0.00 | 0.00 | 60.50 | 60.33 | 100 |
| සීතාවක තෙත් කළාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 29.09 | 28.72 | 4.15 | 4.14 | 33.24 | 32.86 | 98 |
| මිරිජ්ජවිල වියළි කළාපීය උද්භිද උද්‍යානය සංවර්ධනය | 65.37 | 65.30 | 1.25 | 1.23 | 66.26 | 66.54 | 100 |
| ප්‍රධාන කාර්යාලයේ වැඩිදියුණු කිරීම් කටයුතු සහ උද්භිද උද්‍යානයන් හි අලංකාරය හා ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම | 4.70 | 4.45 | 32.25 | 31.95 | 36.94 | 36.41 | 98 |
| අයවැය යෝජනා මගින් මල්වගා සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබුණු මුදල | 10.0 | 0.0 | - | - | 10.00 | 0.00 | 0 |
| **එකතුව** | **222.70** | **209.92** | **175.0** | **174.53** | **397.70** | **384.45** | **97** |

*** අතැති බිල් සමග*

*මූලාශ්‍රය: ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව*

## 9.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

සියළුම උද්‍යානයන්හි භූමි අලංකරණ කටයුතු නිසි පරිදි සිදුකිරීම තුලින් ද නව සංවර්ධිත ප්‍රදේශ, අඩිපාරවල්, වීදි, උද්‍යාන කාර්යක්ෂමව නඩත්තු කිරීම තුලින් ද උද්‍යානයන් හි අලංකරණය හා තත්ත්වය උසස් මට්ටමකින් පවත්වාගෙන යනු ලැබේ.

### 9.3.1 පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු.මි. 74.52 |
| වියදම | - රු.මි. 74.51 |

**භෞතික ප්‍රගතිය**

- උද්‍යානයේ සජීවී ශාක එකතුවට නව ශාක විශේෂ එක් කිරීම, නව බීජ තවානක් ස්ථාපිත කිරීම හා එලිමහන් පැළ තවානෙහි අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- තොරතුරු මධ්‍යස්ථානයක් සහිත කෞතුකාගාරය ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.
- පර්ණාංග ශාක එකතුව සඳහා වන ජලසම්පාදන පද්ධතියෙහි වැඩිදියුණු කිරීම් හා ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම් කටයුතු සිදු කර ඇත.
- උද්‍යානයේ ප්‍රධාන මාර්ග හා අභ්‍යන්තර මාර්ග පද්ධති වැඩි දියුණු කිරීම.
- අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සිදුකර ඇත.
- CCTV කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකර ඇත.
- බැටරි බලයෙන් ධාවනය වන බස් රථයක් මිලදී ගැනීම හා ස්වයංක්‍රීයව පැදගෙන යා හැකි කොළ එකතු කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කර ඇත.
- උද්‍යාන යන්ත්‍රෝපකරණ නවතා තැබීම සහ ගබඩා කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.
- උද්‍යානය සඳහා ආසන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අළුතින් බංකු මිලදී ගැනීම් කටයුතු සිදු කරන ලදී.
- මා ඔය ජල සැපයුම අළුත්වැඩියා කිරීම් කටයුතු සිදු වෙමින් පවතී.



රාජකීය උද්භිද උද්‍යානයේ ශාක සංරක්ෂණාගාරයේ නිමවූ අභ්‍යන්තර නිර්මාණ කටයුතු



වැඩ අවසන් කරන ලද උද්‍යාන යන්ත්‍රෝපකරණ නවතා තැබීම සහ ගබඩා කිරීම සඳහා සැකසූ ගොඩනැගිල්ල

- නව සනීපාරක්ෂක පද්ධතියක් ඉදිකිරීම හා කාර්යාල සනීපාරක්ෂක පද්ධතිය නවීකරණය කිරීම, නිලධාරී නිල නිවාස 02 ක් අලුත්වැඩියා කිරීම සිදුකර ඇත.

### 9.3.2 හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

මුළු ප්‍රතිපාදන - රු.මි. 31.82
වියදම - රු.මි. 30.46

**භෞතික ප්‍රගතිය**


වැඩ අවසන් කරන ලද ඕකිඩ් ශාක ගෘහයෙහි ඇතුලත දර්ශනයක්

- උද්‍යානයේ ශාක එකතුවට නව ශාක විශේෂ එක්කර ශාක සංරක්ෂණ කටයුතු සිදුකරන ලදී. 81,838ක පැළ ප්‍රමාණයක් නිපදවා ඇති අතර ශාක නාම පුවරු සවිකිරීම් කටයුතු සිදුකර ඇත.
- ඕකිඩ් ශාක ගෘහයේ ඉදිකිරීම් කටයුතු හා සමනල උද්‍යානය වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකර ඇත.
- උද්‍යානයේ පිහිටි ගොඩනැගිලි, නිලනිවාස, පැල ගෘහ, උද්‍යානය වටා තාප්පය, ගිම්හාන කුටි සහ සෙවන ගෘහයෙහි අළුත්වැඩියා කටයුතු හා භූමි සංවර්ධන හා වැඩිදියුණු කිරීම් කටයුතු සහ සෙසු නඩත්තු කටයුතු ද සිදු කරන ලදී.


අළුත්වැඩියා කරන ලද උද්‍යානයේ ස්ථාපිත කුඩා ළමුන් සඳහා වන

- ගරාජය ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත.
- යන්ත්‍ර සූත්‍ර ගබඩා කිරීම සඳහා අවශ්‍ය දෙමහල් ගොඩනැගිල්ලේ දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත.
- සූර්ය බලශක්ති කෝෂ පද්ධතියක් ස්ථාපිත කරන ලදී.
- උද්‍යානයේ කුඩා ළමුන් සඳහා ස්ථාපිත වෘක්ෂ ගෘහය අළුත්වැඩියා කරන ලද අතර ප්‍රධාන දොරටුව අසල ඩිජිටල් තොරතුරු පුවරුවක් ස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.

### 9.3.3 හක්ගල උද්භිද උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

මුළු ප්‍රතිපාදන - රු. මි. 50.48
වියදම - රු.මි. 50.36

- උද්‍යානයේ පිහිටි භූමි සංවර්ධන කටයුතු ගොඩනැගිලි, නිලනිවාස, පැල ගෘහ, ගිම්හාන කුටි, සංචාරක බංගලාවෙහි හා වෙනත් ආකෘති වල තීන්ත ආලේප කර අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදී.
- උද්‍යානයේ පිටවන දොරටුව අසල පැල අලෙවි සැලක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.


උද්‍යානයේ මාර්ගවල ගල් ඇතිරීම

- උද්‍යානයේ 137,690 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී. අවශ්‍ය ශාක නාම පුවරු ද සවි කරන ලදී.
- උද්‍යානයේ නව පිවිසුම් දොරටුව අසල රථගාලෙහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත.

* උද්‍යානයේ මාර්ගවල ගල් ඇතිරීමේ කටයුතු සිදු කරන ලදී.

* ගබඩා කාමරය පළමු අදියර නිමකර ඇත.

### 9.3.4 ගනේවත්ත වන ඖෂධ උද්‍යානය සංවර්ධනය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු. මි. 6.87 |
| වියදම | - රු. මි. 6.78 |

**භෞතික ප්‍රගතිය**



උද්භිද විද්‍යාත්මක ශාක ගවේශන වැඩසටහන යටතේ ශාක ගවේශන

* උද්‍යානයේ ශාක ප්‍රචාරණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර පැළ 26,572 කට අධික ප්‍රමාණයක් නිපදවන ලදී.
* ඖෂධ ශාක පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ පුද්ගලයින් 1795 දෙනෙකු සඳහා දේශන පවත්වා දැනුවත් කරන ලදී.
* ජල ටැංකි දෙකක් ස්ථාපිත කිරීමට කටයුතු සිදුකර ඇත.

### 9.3.5 ශාකාගාරය සහ ශාක වර්ගීකරණ පර්යේෂණ

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු. මි. 17.57 |
| වියදම | - රු.මි. 17.43 |

**භෞතික ප්‍රගතිය**



මල්වගා කරුවන්ගේ මල් පැළ සහ ආශ්‍රිත ද්‍රව්‍ය අලෙවිකරණය ඉහළ නැංවීම සඳහා පවත්වන ලද ප්‍රදර්ශනයක්

* ශාක හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේශන පිළිබඳ වැඩමුළු, ඖෂධීය පැලෑටි ගවේෂණය
* ජාතික ශාකාගාරය හා එහි කාර්යභාරය ශාකාගාර තාක්ෂණය, ශාක හඳුනාගැනීම, ශාක වර්ගීකරණය හා ජෛව විවිධත්වය පිළිබඳ පාසල් සිසුන් 653 ක්ද රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිළධාරීන් 436 ක්ද විශ්වවිද්‍යාල සිසුන් 655 ක්ද දැනුවත් කරන ලදී.
* උද්භිද විද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණ 19 ක් සිදු කරන ලද අතර සජීවී සපුෂ්පික ශාක නිදර්ශක 802 ක් මීවන ශාක නිදර්ශක 22 ක් සහ පාසි ශාක නිදර්ශක 28 ක් එකතු කෙරිණි. වඳ වී ගිය ශාක කාණ්ඩයේ එක් ශාක විශේෂයක්ද, දැඩි ලෙස වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 6ක්ද, වඳ වී යාමේ අවදානමට ලක්වූ ශාක 133 ක් ද, අනාගතයේ දී අවදානමට ලක්විය හැකි ශාක 212 ක්ද, තර්ජනයට ලක්වීමට ආසන්න ශාක 124 ක් ද

හඳුනා ගන්නා ලදී. පර්යේෂණ අධ්‍යයන කටයුතු සඳහා ශාක 981 ක්ද නීතිමය කටයුතු සඳහා ශාක නිදර්ශක 21 ක්ද ශාකසාර කර්මාන්ත සඳහා ශාක නිදර්ශක 14 ක්ද හඳුනාගන්නා ලදී.

- ජාතික ශාකාගාරය මගින් ජාතික රතු දත්ත නාමාවලි ග්‍රන්ථය සැකසීමේ කටයුතු සිදුකර ඇත.
- "හරමානිස් ද අල්විස් ශාක චිත්‍ර රූප එකතුව" ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සිදුකරන ලදී.

### 9.3.6 ජාතික මල්වගා සංවර්ධන වැඩසටහන

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු. මි. 60.50 |
| වියදම | - රු.මි. 60.33 |

**භෞතික ප්‍රගතිය**

- ඇන්තූරියම්, ඕකිඩ්, රෝස, ජර්බෙරා, කැපූ පත්‍ර වගාවන් සහ පටක රෝපණය පිළිබඳ එක් දින පුහුණු පාඨමාලා සඳහා පුද්ගලයින් 14,387 ක් පුහුණු කර දැනුම ලබා දී ඇත. මල්වගා කරුවන්ගේ තාක්ෂණික නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම
- ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශන 152, දිස්ත්‍රික් මට්ටමේ විශාල ප්‍රදර්ශන 28 ක් පවත්වන ලදී. පැළ තවාන් 445 කට ගොස් ක්ෂේත්‍ර ගැටළු සඳහා උපදෙස් ද ලබාදෙන ලදී.



දියත උයනේ පවත්වන ලද මල් ප්‍රදර්ශනය

- වාණිජමය මල්වගාව, තවාන් පාලනය, වගාවන් සම්බන්ධ පළිබෝධ සහ රෝග කළමනාකරණය ආශ්‍රිතව පැන නගින ගැටළු සම්බන්ධව පුද්ගලයින් සහ ආයතන සඳහා අය කිරීමකින් තොරව උපදේශන කටයුතු සිදු කරන ලදී.
- උසස් ගුණාත්මක බවින් යුතු නව මල් ප්‍රභේද හඳුන්වා දීම, ඕකිඩ් දෙමුහුන් වර්ග සහ ඇන්තූරියම් සැකසීම සඳහා අත්හදා බැලීමේ කටයුතු සිදුකිරීම, පේරාදෙණිය උද්‍යානයෙහි පැල තවාන් හා ගම්පහ උද්භිද උද්‍යානයෙහි ඕකිඩ් සඳහා වන වීදුරු ගෘහය විශාල කිරීම් කටයුතු සිදු කරන ලදී.



ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හදාරන සිසුන් පිරිසක් ප්‍රායෝගික පුහුණුව ලබමින්

- පර්යේෂණාගාර, පරීක්ෂණාගාර සඳහා සූර්ය බල කෝෂ පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
- මල්වගා පර්යේෂණ පිළිබඳ ජාතික සමුළුව නොවැම්බර් 09 වන දින පවත්වන ලද අතර සියළු දිස්ත්‍රික්කයන් නියෝජනය වන පරිදි ජාතික මට්ටමේ මල් ප්‍රදර්ශනයක් නොවැම්බර් 9-11 දක්වා බත්තරමුල්ල දියත පරිශ්‍රයේ පවත්වන ලදී.

### 9.3.7 අධ්‍යාපනය සහ පුහුණුව

**මූල්‍ය ප්‍රගතිය**

මුළු ප්‍රතිපාදන - රු. මි. 1.63
වියදම - රු.මි. 1.57

**භෞතික ප්‍රගතිය**

- පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කරන ලද අතර අළුත්වැඩියා කටයුතු සිදු කරන ලදී.
- තරුණයින් 47 දෙනෙකු නවීන මල් වගා ක්‍රමවේද, භූ අලංකරණ ක්‍රම වේද පිලිබඳව ත්‍රෛමාසික සහතික පත්‍ර පාඨමාලාව හරහා පුහුණු කරන ලදී
- භූ දර්ශණ සංවර්ධන සහකාර ලෙස ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය - මට්ටම 4 (NVQ- level 4) ලබා දෙන එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම් සිදුකරන ලද අතර 4 දෙනෙකු ලියාපදිංචි වී පාඨමාලාව හදාරයි.
- රෝස වගාව, තවාන් කළමනාකරණය, ශාක හඳුනාගැනීම, ශාක ශල්‍යකර්මයන්, මල් සැකසුම්, පශ්චාත් අස්වනු තාක්ෂණය, භූමි අලංකරණය සහ සෙසු ආශ්‍රිත විෂයයන් පිළිබඳව පුද්ගලයින් 14,142 ක් පුහුණු කරන ලදී. මීට අමතරව ජෛව විවිධත්වය හා එහි සංරක්ෂණය පිළිබද පාසල් සිසුන් ඇතුළුව පුද්ගලයින් 30 ක් ද දැනුවත් කරන ලදී.
- දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් හා අවශ්‍ය අවස්ථා වලදී දෙපාර්තමේන්තුවට පරිබාහිර ස්ථාන වලදී දේශීය හා විදේශීය පුහුණුව දීමට ද කටයුතු කරන ලදී.

### 9.3.8 මීගලෑව හරිත පියස පුහුණු මධ්‍යස්ථානය

**මූල්‍ය ප්‍රගතිය**

මුළු ප්‍රතිපාදන - රු. මි. 7.50
වියදම - රු.මි. 7.48

**භෞතික ප්‍රගතිය**

- ක්ෂේත්‍ර කාර්යාල ගොඩනැගිල්ල අංක. 05 හි අළුත්වැඩියා කටයුතු සිදුකිරීම සිදු කෙරුණු අතර එහි කටයුතු නිම කරන ලදී.
- පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 38,320 ප්‍රමාණයක් නිපදවන ලදී.
- පැළ සෙවණ ගෘහයක් සහ පැළ අලෙවි සැලක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී.
- මීට අමතරව ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, කාර්යාලීය ලී බඩු හා වෙනත් අවශ්‍ය මෙවලම් මිලදී ගන්නා ලදී.
- ජල පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත. උද්‍යාන බංකු කිහිපයක් පුහුණු වීමට පැමිණෙන පුද්ගලයින් සඳහා ආසන පහසුකම් සැපයීමේ අරමුණින් ස්ථාපිත කරන ලදී



අලුතින් ඉදිවන නිල නිවාස 04 ක්



ඉදිවෙමින් පවතින නව කාර්යාලයක්, කුඩා ශාකාගාරයක්,

- මධ්‍යස්ථාන පරිශ්‍රයට හා වගාවන්ට වන සතුන්ගෙන් වන උවදුරු අවම කිරීම සඳහා විදුලි වැට ඉදිකිරීමේ කටයුතු අවසන් කරන ලදී.

### 9.3.9 මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු. මි. 66.26 |
| වියදම | - රු.මි. 66.54 |

**භෞතික ප්‍රගතිය**

- නිල නිවාස 04 ක් සහිත නිවාස සංකීර්ණයක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- සේවකයින් සඳහා වන ගොඩනැගිල්ලක සහ ගබඩාවක ඉදිකිරීම් කටයුතු වල පළමු අදියර අවසන් කර ඇත.
- මල්වගා ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වල දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය වන ඒකකයක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- ළමුන් සඳහා අධ්‍යාපනික වශයෙන් වැදගත් වන ළමා උද්‍යානයක් පිහිටුවීම සඳහාද අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගන්නා ලදී
- සජීවී ශාක හා නව ශාක විශේෂ එක් කරමින් 23,544 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.
- නව කාර්යාලයක්, කුඩා ශාකාගාරයක්, සාකච්ඡා කාමරයක්, පුස්තකාලයක් සමඟ නරඹන්නන් සඳහා මධ්‍යස්ථානයක් දකුණු දොරටුව අසල ඉදිකිරීම සිදුකර ඇත.

### 9.3.10 සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය

**මූල්‍ය ප්‍රගතිය**

| | |
|---|---|
| මුළු ප්‍රතිපාදන | - රු. මි. 33.24 |
| වියදම | - රු.මි. 32.86 |

**භෞතික ප්‍රගතිය**

- පැල තවාන සඳහා සෙවණ ගෘහයක් ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත.
- ගරාජයක් ගබඩාවක් සහිත ක්ෂේත්‍ර කාර්යාලයක් හා මුරකුටිය ඉදිකිරීම් කටයුතු අවසන්
- ඇන්තූරියම් හා ඕකිඩ් පැල තවාන සහිත සෙවන ගෘහ සඳහා නවීන තාක්ෂණික ජල සැපයුම් පද්ධති ස්ථාපිත කරන ලදී.
- උද්‍යානයේ 47,322 පැළ ප්‍රමාණයක් නිපදවන ලදී.
- උද්‍යානය තුල යටිතල පහසුකම් සංවර්ධනය

## 9.4 2018 වර්ෂයේ විශේෂ වැඩසටහන්

- අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් යටතේ ත්‍රෛමාසික පහුණු පාඨමාලාවන් පවත්වන ලද අතර මීගලෑව හරිත පුහුණු මධ්‍යස්ථානයේ පැළ රෝපණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර පැළ 38,320ක ප්‍රමාණයක් නිපදවන ලදී.
- හක්ගල උද්භිද උද්‍යානයේ නව ප්‍රවේශ පත්‍ර කවුළුව තිරසර සංවර්ධන හා වනජීවී ගරු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ සුරතින් විවෘත කිරීම.
- නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සකස් කරන ලද පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පැල සංරක්ෂණාගාරය මහජනතාව උදෙසා විවෘත කිරීම.
- "සීතාවක මල් දැක්ම" 2018.12. 21 සිට 23 දක්වා සීතාවක උද්භිද උද්‍යානයේදී පැවැත්වීම.
- උද්භිද විද්‍යාඥයින් වන මහාචාර්ය නිමල් ගුණතිලක මහතා හා මහාචාර්ය සාවිත්‍රී ගුණතිලක මහත්මිය සහභාගීත්වයෙන් ශාක හඳුනාගැනීම සහ ක්ෂේත්‍ර ගවේෂණ පිළිබඳ දෙදින වැඩමුළුවක් හා එක්දින වැඩමුළුවක් පැවැත්වීම

## 9.5 සංචාරක පැමිණීම සහ ආදායම 2018

වගුව 9.3

| | සංචාරක පැමිණීම | | | ආදායම (රු.මි) | | |
|---|---|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | එකතුව | දේශීය | විදේශීය | එකතුව |
| පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය | 1,109,125 | 431,199 | 1,540,324 | 52.60 | 627.06 | **679.66** |
| හක්ගල උද්භිද උද්‍යානය | 782,581 | 31,626 | 814,207 | 35.38 | 45.12 | **80.49** |
| ගම්පහ උද්භිද උද්‍යානය | 157,698 | 385 | 158,083 | 8.69 | 0.55 | **9.24** |
| මිරිජ්ජවිල වියළි කලාපීය උද්භිද උද්‍යානය | 80,822 | 275 | 81,097 | 3.21 | 0.39 | **3.60** |
| සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය | 234,423 | 210 | 234,633 | 11.45 | 0.31 | **11.75** |
| **එකතුව** | **2,364,649** | **463,695** | **2,828,344** | **111.34** | **673.43** | **784.8** |

*මූලාශ්‍රය: ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව*

# 10.
# ශ්‍රී ලංකා වනජීවී භාරය



## 10. ශ්‍රී ලංකා වනජීවී භාරය

### දැක්ම

" ශ්‍රී ලංකාවේ වන සතුන් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය සඳහා දායක වීම."

### මෙහෙවර

" වනජීවී සම්පත් සංරක්ෂණය උදෙසා ප්‍රජාව දැනුවත් කිරීම."

### අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම.
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම.
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම.
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම.
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම.

### පරිපාලනය

ශ්‍රී ලංකා වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන් ද, වනජීවී භාරය අයත් අමාත්‍යාංශයේ ලේකම්තුමා ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ද, මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු ද, ලංකා සංචාරක මණ්ඩලයේ නියෝජිතයෙකු ද, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙකු ද, රාජ්‍ය නොවන ආයතන දෙකක නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් නියෝජිතයන් දෙදෙනෙකු ද වශයෙනි.

## 10.1 වනජීවී භාරය

### වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග කිහිපයක් හඳුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පහසුකම් ලබාදීම.
- රාජ්‍යය හා පෞද්ගලික ආයතන වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ විවිධ වැඩසටහන් පැවැත්වීම.
- පාරිසරික සංචාරක කටයුතු පවත්වාගෙන යාම.
- අලෙවි කටයුතු (පොත්පත්/ ප්‍රකාශන/ පෝස්ටර්/ සමරු භාණ්ඩ ආදිය)
- සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැඳී පවතී.

## 10.2 වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

- ප්‍රජා අධ්‍යාපන වැඩමුළු පැවැත්වීම
- පාසල් අධ්‍යාපනික වැඩමුළු හා පාරිසරික කටයුතු
- ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම
- පර්යේෂණ කටයුතු
- සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය

## 10.3 වනජීවී භාරය මගින් සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

- රන්දෙණිගල පුහුණු කේන්ද්‍රයේ නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම.
- අලෙවි මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම
- පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම.
- අන්තර්ජාලයේ වෙබ් පිටුව පවත්වාගෙන යාම.

## 10.4 2018 වර්ෂයේ ජූනි මස සිට දෙසැම්බර් මස දක්වා ආදායම - වියදම සාරාංශය

වගුව 10.1

| අයිතම | ආදායම (රු.මි) |
|---|---|
| මුළු ආදායම | 9.40 |
| මුළු වියදම | 11.22 |
| ලාභය/අලාභය | (1.82) |
| රන්දෙණිගල පුහුණු කේන්ද්‍රය | |
| මුළු ආදායම | 5.16 |
| මුළු වියදම | 5.45 |
| ලාභය/අලාභය | (0.29) |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා වනජීවී භාරය*

# 11.
# ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව



## 11. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

### 11.1 හැඳින්වීම

වසර තුළදී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ක්‍රිස්තියානි ප්‍රජාවගේ යහපැවැත්ම තහවුරු වන පරිදි ක්‍රිස්තු ධර්මයේ සහ එම සංස්කෘතියෙහි පැවැත්ම හා වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 11.2 දැක්ම

ක්‍රිස්තියානි ජනතාවගේ සුභසිද්ධිය සඳහා ක්‍රියාකිරීම

### 11.3 මෙහෙවර

ක්‍රිස්තියානි ධර්මයේ සහ සංස්කෘතියෙහි වටිනාකම් හා විශ්වාසයන් සමාජයේ පිළිගත් ආකාරයට ප්‍රවර්ධනය කිරීම

### 11.4 අරමුණ

සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැඟීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කිරීම හා අධීක්ෂණය.

### 11.5 ක්‍රියාකාරකම්

වන්දනා ගමන් ආඥාපනත යටතේ

- ආර්ථික සහය අවශ්‍ය කිතුනු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.
- කිතුනු දහම් අධ්‍යාපන කටයුතු නංවාලීම සහ දහම් ගුරුසේවා ඇගයීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
- කිතුනු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම.
- බයිබලීය දැනුම වර්ධනය කිරීම උදෙසා බයිබල් දැනුම මිනුම තරඟය පැවැත්වීම.
- කිතුනු ජනතාවගේ අති උතුම් මංගල්‍යය වූ පාස්කු මංගල්‍යයට අදාල වැඩසටහන් සඳහා දායකත්වය ලබාදීම.
- කිතුනු ජනතාවගේ ගෞරවාදරයට පත් උතුම් මංගල්‍යය වූ නත්තල් උත්සවය සඳහා දායකත්වය ලබාදීම හා රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය කිරීම.
- ජාතික හා ආගමික වශයෙන් වැදගත් උත්සව සංවිධානය කිරීම.
- කිතුනු ජනතාවගේ අධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේවස්ථාන ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය කිරීම.

- ආගමික කටයුතු සඳහා පැමිණෙන විදේශික පැවිදි හා ගිහි පාර්ශව වෙත වීසා නිර්දේශ ලබාදීම සහ වන්දනාකරුවන් සඳහා අනුග්‍රාහ වීසා නිර්දේශ නිකුත් කිරීම.
- ආගමික ආයතන සඳහා ජල විදුලි හා තීරුබදු සහන ලබා දීම.
- කිතුනු දේශීය පැවිදි පාර්ශව සඳහා විදේශ ගමන් බලපත්‍ර හා හැඳුනුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම.
- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන විශේෂ ව්‍යාපෘතීන්
- කතෝලික දේවස්ථාන, දහම් පාසල් හා ආගමික ආයතන පිළිබඳව ලියාපදිංචි සහතික නිකුත් කිරීම හා දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

### 11.6 අනුමත කළ වාර්ෂික අයවැය හා වියදම් 2018 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

වගුව : 11.1

| විස්තරය | වාර්ෂික අයවැය මත ප්‍රතිපාදන (රු.මි) | වියදම් 2018/12/31 දිනට (රු.මි) |
|---|---|---|
| පුනරාවර්තන | 185.47 | 167.100 |
| ප්‍රාග්ධන | 57.420 | 48.936 |
| **එකතුව** | **242.56** | **216.03** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7 ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගතිය -2018

#### 11.7.1 දේවස්ථාන ඉදිකිරීම් පුනරුත්ථාපනය කිරීම් හා යටිතල පහසුකම් සංවර්ධනය

වගුව : 11.2

| පදවිය | දේවස්ථාන ගණන | ව්‍යාපෘතිය | මුදල (රු.) |
|---|---|---|---|
| කුරුණෑගල | දේවස්ථාන 04 | ප්‍රතිසංස්කරණය | 2,272,580.54 |
| මඩකලපුව | දේවස්ථාන 04 | ප්‍රතිසංස්කරණය | 300,000.00 |
| මහනුවර | දේවස්ථාන 02 | ප්‍රතිසංස්කරණය | 1,323,046.90 |
| අනුරාධපුරය | දේවස්ථාන 03 | ප්‍රතිසංස්කරණය | 921,700.00 |
| කොළඹ | දේවස්ථාන 09 | ප්‍රතිසංස්කරණය | 4,478,250.00 |
| ත්‍රිකුණාමලය | දේවස්ථාන 04 | ප්‍රතිසංස්කරණය | 1,960,000.00 |
| ගාල්ල | දේවස්ථාන 01 | ප්‍රතිසංස්කරණය | 200,000.00 |

| | | | |
|---|---|---|---|
| **රත්නපුර** | දේවස්ථාන 02 | ප්‍රතිසංස්කරණය | 600,000.00 |
| **මන්නාරම** | දේවස්ථාන 01 | ලූර්දු ගුහාව ප්‍රතිසංස්කරණය | 586,000.00 |
| **ක්‍රිස්තියානි සභා** | දේවස්ථාන 02 | ප්‍රතිසංස්කරණය | 1,815,000.00 |
| **ජාතික** | ආයතන 01 | ප්‍රතිසංස්කරණය | 450,000.00 |
| | **එකතුව** | | **16,074,572.44** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.2 ප්‍රසිද්ධ දේවස්ථානයන්හි පැවැත්වෙන වාර්ෂික මංගල්‍යයන් සඳහා ආධාර ලබාදීම

**වගුව :11.3**

| | **පදවිය** | **දේවස්ථානය** | **වැඩසටහන** | **මුදල (රු.)** |
|---|---|---|---|---|
| 1 | **කුරුණෑගල** | මහ ගල්ගමුව ශාන්ත ජුසේවාස් සිද්ධස්ථානය | මංගල්‍යය | 600,000.00 |
| 2 | | කට්ටිමහන ශාන්ත ආනා සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 400,000.00 |
| | | සිරිකුරුස දේවස්ථානය මොරොත්ත | මංගල්‍යය | 300,000.00 |
| 3 | **ගාල්ල** | මාතර අප ස්වාමි දුවගේ සිද්ධස්ථානය | වාර්ෂික මංගල්‍යය | 500,000.00 |
| 4 | | වැලිගම සුවසහනයේ දේවස්ථානය | වාර්ෂික මංගල්‍යය | 400,000.00 |
| 5 | **කොළඹ** | තේවත්ත ලංකා අප ස්වාමි දුවගේ සිද්ධද්ථානය | වාර්ෂික මංගල්‍යය | 500,000.00 |
| 6 | **හලාවත** | තලවිල ශා.ආනා මුනිතුමියගේ සිද්ධස්ථානය | මාර්තු මංගල්‍යය | 750,000.00 |
| 7 | | මාරවිල ශ්‍රී කුරුස සිද්ධස්ථානය | වාර්ෂික මංගල්‍යය | 100,000.00 |
| 8 | | තලවිල ශා.ආනා මුනිතුමියගේ සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 737,300.00 |
| | | ශාන්ත අන්තෝනි දේවස්ථානය පල්ලෙකන්ඩාල් වනාතවිල්ලුව | මංගල්‍යය | 29717.54 |
| 9 | **මන්නාරම** | ඓතිහාසික මරද මඩු මෑනියන්ගේ සිද්ධස්ථානය | ජූලි මංගල්‍යය | 1,000,000.00 |
| 10 | | ඓතිහාසික මරද මඩු මෑනියන්ගේ සිද්ධස්ථානය | අගෝස්තු මංගල්‍යය | 1,000,000.00 |
| 11 | **මහනුවර** | වාසලකෝට්ටේ ශාන්ත අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානය | ජුනි මංගල්‍යය | 600,000.00 |
| 12 | **යාපනය** | සුභ ගමනේ රාජේශ්වරියගේ දේවස්ථානය | වාර්ෂික මංගල්‍යය | 50,000.00 |
| | **එකතුව** | | | **6,967,071.54** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.3 ආර්ථික සහය අවශ්‍ය කිතුනු දේවස්ථානවල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම.

ආර්ථික දුෂ්කරතා සහිත දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථානයන්හී සිදු කෙරෙන සුළු පරිමාණ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මුල්‍ය සහාය දැක්වීම මේ යටතේ සිදු කෙරේ.

වගුව : 11.4

| පදවිය | විස්තරය | මුදල (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|
| **කොළඹ** | කදාන ශාන්ත සෙබස්තියන් දේවස්ථානය - අලුත්වැඩියාව | 500,000.00 | සම්පූර්ණයි |
| | මග්ගොන ශාන්ත වින්සන්ට් නිවාසය -විදුලි පද්ධතිය අළුත්වැඩියාව | 133,603.01 | සම්පූර්ණයි |
| | මග්ගොන කල්වාරි පුදබිම - අලුත්වැඩියාව | 211,200.00 | සම්පූර්ණයි |
| | මරදාන ෆාතිමා දේවස්ථානය - අලුත්වැඩියාව | 308,000.00 | සම්පූර්ණයි |
| **යාපනය** | කච්චතිව් ශාන්ත අන්තෝනි දේවස්ථානය - මංගල්‍ය වියදම් (ප්‍රතිපාදන මාරු කිරීම) | 4,938,708.72 | සම්පූර්ණයි |
| | කිළිනොච්චි පලයිතිවු ශාන්ත අන්තෝනි දේවස්ථානය - මංගල්‍ය වියදම් | 60,000.00 | සම්පූර්ණයි |
| **කුරුණෑගල** | මාවතගම කල්වාරි පුදබිම - අලුත්වැඩියාව | 321,000.00 | සම්පූර්ණයි |
| **ගාල්ල** | හිනිදුම කල්වාරි පුදබිම - අළුත්වැඩියාව | 300,000.00 | සම්පූර්ණයි |
| | ගනේගම ශාන්ත මයිකල් කන්‍යාරාමය - අලුත්වැඩියාව | 200,000.00 | සම්පූර්ණයි |
| **මහනුවර** | වාසලකොට්ටේ ශාන්ත අන්තෝනි දේවස්ථානය - මංගල්‍ය වියදම් | 287,310.86 | සම්පූර්ණයි |
| **හලාවත** | පල්ලෙකන්ඩාල් ශාන්ත අන්තෝනි දේවස්ථානය - මංගල්‍ය වියදම් | 180,000.00 | සම්පූර්ණයි |
| | **එකතුව** | **7,439,822.59** | |

**මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

### 11.7.4 කිතුනු දහම් අධ්‍යාපනය නංවාලීම සහ කිතුනු ඉරුදින දහම්පාසල් ගුරුභවතුන්ගේ සේවා ඇගයීම

රටක සංවර්ධනය භෞතික හා අධ්‍යාත්මික යන දෙඅංශයෙන්ම සිදුවිය යුතුය යන්න රජයේ අරමුණයි. මෙම අරමුණ යථාර්තයක් බවට පත් කරනුවස් 2018 වසර තුලදී පහත සඳහන් ආකාරයට වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

### 11.7.5 ඉරුදින දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිළ ඇඳුම් ලබා දීම

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව දහම් පාසල් අධ්‍යාපනය නංවනුවස් , ඒ සඳහා කැපවී ක්‍රියාකරන දහම් පාසල් ගුරුභවතුන්ට නිළ ඇඳුම් ලබාදීම සිදු කෙරේ. පැවිදි දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිළ ඇඳුම් සඳහා රෙදි, කමිස හා කලිසම් සඳහා රෙදි හා නිළ ඇඳුම් සාරි ලබාදීමට කටයුතු කෙරේ. පැවිදි නිළ ඇඳුම් සඳහා රෙදි

හා කමිස කලිසම් රෙදි පදවි අතරෙහි බෙදාහරින ලදි. නිළ ඇඳුම් සාරි සැපයීම සඳහා ටෙන්ඩරය පිරිනමන ලද අතර 2018-12-31 දක්වා නිළ ඇඳුම් සාරි 3500 ක් බෙදාහරින ලදි.

පුස්තකාල පොත් ලබාගැනීමේ දීමනාව ලෙස ඉරුදින දහම් පාසල් ගුරුභවතුන් සඳහා රු.5000 ක දීමනාවක් ප්‍රදානය කිරීම දහම් පාසල් ගුරුභවතුන්ගේ සේවය ඇගයීමේ අරමුණින් මෙම දීමනාව ප්‍රදානය කිරීමට රජය පියවර ගනී.

**වගුව :11.5**

| පදවිය | දහම් ගුරුවරුන් ගණන | මුදල (රු.) |
|---|---|---|
| **කොළඹ** | 6101 | 30,505,000.00 |
| **හලාවත** | 2514 | 12,570,000.00 |
| **කුරුණෑගල** | 926 | 4,630,000.00 |
| **මහනුවර** | 913 | 4,565,000.00 |
| **රත්නපුර** | 466 | 2,330,000.00 |
| **අනුරාධපුර** | 230 | 1,150,000.00 |
| **බදුල්ල** | 305 | 1,525,000.00 |
| **ගාල්ල** | 208 | 1,040,000.00 |
| **යාපනය** | 1522 | 7,610,000.00 |
| **මන්නාරම** | 960 | 4,800,000.00 |
| **මඩකලපුව** | 596 | 2,980,000.00 |
| **ත්‍රිකුණාමලය** | 272 | 1,360,000.00 |
| **එකතුව** | **15013** | **75,065,000.00** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.6 අධ්‍යාත්මික පෞරුෂත්ව වැඩසටහන්

මේ යටතේ එක් එක් වසරේ වෙන් වන ප්‍රතිපාදන වලින් දහම් දැනුමින් හා අධ්‍යාත්මිකව ජනතාව පෝෂණය කර කිතුනු වටිනාකම් ජනතාව තුල ගොඩනංවීම අරමුණු කරගෙන සංවිධානය කරන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දීම සිදු කෙරේ.

**වගුව :11.6**

| පදවිය | වැඩසටහන | වැඩසටහන් ගණන | මුදල (රු.) |
|---|---|---|---|
| **කොළඹ** | ළමා වැඩසටහන් | 03 | 265,000.00 |
| | දහම් ගුරුවරුන්ගේ වැඩසටහන | 01 | 5000.00 |
| **යාපනය** | තරුණ වැඩසටහන් | 07 | 100,000.00 |
| | පවුල් වැඩසටහන් | 06 | 60000.00 |
| | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 05 | 50000.00 |
| **ත්‍රිකුණාමලය** | පවුල් වැඩසටහන | 01 | 20,000.00 |
| **ගාල්ල** | පවුල් වැඩසටහන් | 02 | 40,000.00 |
| **මහනුවර** | තරුණ වැඩසටහන් | 02 | 75,000.00 |
| | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 02 | 30000.00 |
| | පවුල් වැඩසටහන | 01 | 28000.00 |
| | ළමා වැඩසටහන් | 03 | 215000.00 |

| | | | |
|---|---|---|---|
| **හලාවත** | පවුල් වැඩසටහන් | 03 | 30000.00 |
| | තරුණ වැඩසටහන් | 02 | 20000.00 |
| | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 01 | 10000.00 |
| **කුරුණෑගල** | දහම් ගුරුවරුන්ගේ පුහුණු වැඩසටහන | 01 | 30,000.00 |
| | පවුල් වැඩසටහන | 01 | 10000.00 |
| | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 01 | 10000.00 |
| **බදුල්ල** | පෞර්ෂත්ව සංවර්ධන වැඩසටහන | 01 | 30,000.00 |
| | වැඩිහිටි ධර්මෝපදේශ වැඩසටහන | 01 | 200000.00 |
| **රත්නපුර** | තරුණ වැඩසටහන් | 05 | 213000.00 |
| | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | 04 | 60000.00 |
| | අධ්‍යාත්මික වැඩසටහන | 01 | 19450.00 |
| | පවුල් වැඩසටහන් | 02 | 20000.00 |
| **මඩකලපුව** | අධ්‍යාත්මික වැඩසටහන | 01 | 15,000.00 |
| | විභාග පුහුණු වැඩසටහන | 01 | 20000.00 |
| | නායකත්ව පුහුණු වැඩසටහන | 01 | 32500.00 |
| **මන්නාරම** | තරුණ වැඩසටහන් | 01 | 30,000.00 |
| **අනුරාධපුර** | ළමා වැඩසටහන් | 01 | 37850.00 |
| **ජාතික** | අධ්‍යාත්මික වැඩසටහන් | 04 | 158,747.00 |
| **ක්‍රිස්තියානි** | ළමා වැඩසටහන | 01 | 32,000.00 |
| **එකතුව** | | | **1,866,547.00** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.7 දහම් අධ්‍යාපන වැඩසටහන්

**වගුව :11.7**

| | පදවිය | වැඩසටහන | මුදල (රු.) |
|---|---|---|---|
| 1 | කුරුණෑගල | නව දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 20,000.00 |
| 2 | | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 20,000.00 |
| 3 | | රජයේ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් | 15,000.00 |
| 4 | | සංවර්ධන නිළධාරීන් මඟින් විශේෂ අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම | 30,000.00 |
| 5 | කොළඹ | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන | 100,000.00 |
| 6 | | දහම් ගුරුවරුන් සඳහා ප්‍රායෝගික පරීක්ෂණ | 50,000.00 |
| 7 | | ළමා දිනය වෙනුවෙන් වැඩසටහන් | 50,000.00 |
| 8 | | අධ්‍යාපන වැඩසටහන් | 58,060.00 |
| 9 | මහනුවර | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබඳ සම්මන්ත්‍රණ | 20,000.00 |
| 10 | | ධර්මාචාර්ය විභාගය සඳහා සම්මන්ත්‍රණ 3ක් පැවැත්වීම | 60,000.00 |
| 11 | | ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් | 20,000.00 |
| 12 | බදුල්ල | ධර්මාචාර්ය විභාගය සඳහා සම්මන්ත්‍රණ 2ක් පැවැත්වීම | 42,000.00 |
| 13 | | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිලිබඳ සම්මන්ත්‍රණ | 20,000.00 |
| 14 | යාපනය | අධ්‍යාපන වැඩසටහන් 4ක් පැවැත්වීම | 100,000.00 |
| 15 | | සංවර්ධන නිළධාරීන් මඟින් වැඩසටහන් 25ක් පැවැත්වීම | 270,000.00 |

| | | | |
|---|---|---|---|
| 16 | **මන්නාරම** | සංවර්ධන නිළධාරීන් මගින් වැඩසටහනක් පැවැත්වීම | 10,000.00 |
| 17 | **මඩකලපුව** | අ.පො.ස සා.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිළිබඳ සම්මන්ත්‍රණ | 10,000.00 |
| 18 | | සංවර්ධන නිළධාරීන් මගින් වැඩසටහන් 04 ක් පැවැත්වීම | 40,000.00 |
| 19 | | අධ්‍යාපන වැඩසටහන් | 10,000.00 |
| 20 | **රත්නපුර** | දහම් පාසැල් සිසුන් සඳහා විශේෂ අධ්‍යාපන වැඩසටහන් | 15,000.00 |
| 21 | | අ.පො.ස සා.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිළිබඳ සම්මන්ත්‍රණ | 25,000.00 |
| 22 | | අධ්‍යාපන වැඩසටහන් | 24,260.00 |
| 23 | | සංවර්ධන නිළධාරීන් මගින් වැඩසටහන් 03ක් පැවැත්වීම | 30,000.00 |
| 24 | **හලාවත** | නව දහම් ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන | 150,000.00 |
| 25 | | සංවර්ධන නිළධාරීන් මගින් වැඩසටහන් 04ක් පැවැත්වීම | 40,000.00 |
| 26 | | අ.පො.ස උ.පෙළ සිසුන් සඳහා කතෝලික ධර්මය පිළිබඳ සම්මන්ත්‍රණ | 50,000.00 |
| 27 | **ත්‍රිකුණාමලය** | දහම් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම | 100,000.00 |
| 28 | **ජාතික** | ජාතික ධර්මෝපදේශ සහ බයිබල් අපෝස්ථලික වැඩසටහන් | 1,500,000.00 |
| 29 | **ක්‍රිස්තියානි** | තරුණ වැඩසටහන් | 300,000.00 |
| | | **එකතුව** | **3,179,320.00** |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*



**අගරදගුරු පදවි උ/පෙ කතෝලික ධර්මය සම්මන්ත්‍රනය**



**හලාවත පදවි ධර්මාචාර්ය වැඩමුළුව**

### 11.7.8 දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම හා කථික තරඟය

කිතුනු දරුවන් තුල බයිබලය පිළිබඳව දැනුම වර්ධනය කරලීම කාලීන අවශ්‍යතාවයක් බැවින් එම අරමුණ පෙරදැරි කොට ජාතික බයිබල් තරඟාවලිය පවත්වන ලදී.

දැනුම මිනුම හා කථික යන අංශ දෙක යටතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය තුනෙන් තරඟය පවත්වන ලදී. තරඟයේ අවසන් වටය කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේ දී පවැත්වූ අතර එහි ත්‍යාග ප්‍රදානෝත්සවය සැප්තැම්බර් 15 වන දින මරදාන ටවර් රඟහලේදී පවත්වන ලදී.

**මුළු වියදම රු. මි. 5.08**





**දීප ව්‍යාප්ත බයිබල් දැනුම මිනුම හා කථික තරඟය හා ත්‍යාග ප්‍රදානෝත්සවය**

### 11.7.9 කිතුනු ආගමික සාහිත්‍ය කලා සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීම.

සිංහල හා දෙමළ මාධ්‍ය යටතේ කෙටි නාට්‍ය තරගාවලිය සංවිධානය කරන ලදී. සිංහල මාධ්‍යයෙන් කණ්ඩායම් 20ක් ඉදිරිපත් වූ අතර මූලික වටයකින් ඉන් කණ්ඩායම් 10ක් අවසන් වටය සඳහා තේරී පත් වුනි. දෙමළ මාධ්‍ය යටතේ කණ්ඩායම් 06ක් තරගය සඳහා ඉදිරිපත් විය. මීට සමගාමීව නාට්‍ය වැඩමුළු 06 ක් දිවයින පුරා සංවිධානය කරන ලදී.

මෙම තරගාවලියේ අවසන් වටය බොරැල්ල කේරි විද්‍යාලයේ දී පැවැත් වූ අතර සම්මාන ප්‍රදාන උත්සවය සැප්තැම්බර් 15 වන දින මරදාන, ටවර් රගහලේ දී පවත්වන ලදී. **මුළු වියදම රු. 4,998,426.85**





**කෙටි නාට්‍ය තරගාවලියේ සම්මාන ප්‍රදාන උත්සවය**

### 11.7.10 වන්දනා ගමන් ආඥාපනත යටතේ හා කතෝලික සභාව විසින් ප්‍රකාශිත ජාතික සිද්ධස්ථානයන්හි සංවර්ධන කාර්යයන් සිදුකිරීම.

වගුව :11.8

| | දේවස්ථානය | වැඩසටහන | මුදල (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | තලවිල ශාන්ත ආනා සිද්ධස්ථානය | වන්දනාකරුවන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | 1,531,028.18 | වැඩ කටයුතු කරමින් පවතී |
| 2 | වැලිගම සුවසහනයේ දේවස්ථානය | වන්දනාකරුවන් සඳහා වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම | 1,019,541.50 | සම්පූර්ණයි |
| 3 | ශාන්ත ආනා දේවස්ථානය කට්ටිමහන | වන්දනාකරුවන් සඳහා වන්දනා ගෘහ ඉදිකිරීම(දිස්ත්‍රික් ලේකම් හරහා ප්‍රතිපාදන මාරු කිරීම) | 1,356,884.29 | වැඩ කටයුතු කරමින් පවතී |
| | එකතුව | | 3,907,453.97 | |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.11 සංවර්ධන සහයන්

වගුව :11.9

| පදවිය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| **ජාතික** | ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 600,000.00 |
| | ජාතික ජන සන්නිවේදන මධ්‍යස්ථානය - ශබ්දාගාරය සඳහා | 300,000.00 |
| | දහම් පාසැල් 14 සඳහා | 225,333.75 |
| **යාපනය** | කච්චතිවු ශාන්ත අන්තෝනි සිද්ධස්ථානය - උපකරණ මිලදී ගැනීම සඳහා | 475,000.00 |
| | යාපනය ධර්ම උපදේශන මධ්‍යස්ථානය සඳහා පරිගණක මිලදී ගැනීම | 111,000.00 |
| **කොළඹ** | පන්නිපිටිය ලූර්දු මාතා දේවස්ථානය - දහම් පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 300,000.00 |
| | රාවතාවත්ත ලුනාව ශු. පේදුරු හා පාවුළු දේවස්ථානය - දහම් පාසල් ගොඩනැගිල්ල අලුත්වැඩියාව | 300,000.00 |
| | පමුණුගම වල්ලබ ශාන්ත ජූඩ් දේවස්ථානය - පුටු මිලදී ගැනීම | 95,000.00 |
| | දළුගම ශාන්ත ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානය - ශබ්ද විකාශන යන්ත්‍ර මිලදී ගැනීම | 200.000.00 |
| **හලාවත** | දුම්මලකොටුව නිමල මරිය දේවස්ථානය - දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 250,000.00 |
| | බැරිස්ටර්පුර වේලක්කන්නි මාතා දේවස්ථානය - විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනීම | 175,000.00 |
| **ගාල්ල** | වැලිගම ශාන්ත දොමිනික් කන්‍යාරාමය - වැසිකිලි ඉදිකිරීම | 300,000.00 |
| **කුරුණෑගල** | මිල්ලව ශාන්ත ජෝශප් වාස් දෙව්සත්හල අලුත්වැඩියාව | 300,000.00 |
| **මන්නාරම** | මඩු කුන්චිකුලම් ශාන්ත මරියා දේවස්ථානය - සීනු කණුව ඉදි කිරීම | 490,000.00 |
| | දහම් පාසැල් 15 සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා | 750,000.00 |
| | ධර්මෝපදේශ මධ්‍යස්ථානය සඳහා උපකරණ මිලදී ගැනීම සඳහා | 517,926.50 |
| **අනුරාධපුර** | පලුගස්දමන ශු. ජපමාල දේවස්ථානය - දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 400,000.00 |
| **බදුල්ල** | බදුල්ල ශාන්ත මරියා ආසන දෙව්මැදුර - දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 400,000.00 |
| **ක්‍රිස්තියානි සභා** | යාපනය, නල්ලූර් ශාන්ත ජේම්ස් දේවස්ථානය - මීසම් ගෘහය ඉදිකිරීම | 490,000.00 |
| | කෑගල්ල මල්බෙරිවත්ත දේවස්ථානය සඳහා | 320,000.00 |
| | **එකතුව** | 6,999,260.00 |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*

### 11.7.12 ඓතිහාසික වටිනාකම් ඇති දේවස්ථාන වල සංවර්ධන හා ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආධාර ලබාදීම

වගුව :11.10

| පළාත | දේවස්ථානය | වැඩසටහන | මුදල (රු.) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| මන්නාරම | ශාන්ත මරියා සිද්ධස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | සම්පූර්ණයි |
| | සරණාගතයින්ගේ රාජේශ්වරියගේ දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 500,000.00 | සම්පූර්ණයි |
| යාපනය | රදගුරු මැදුර | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| රත්නපුර | ශාන්ත ඇලෝසියස් දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | ගුරුගල ශාන්ත ෆ්‍රැන්සිස් සේවියර් දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 500,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| කොළඹ | මග්ගොන ශාන්ත මරියා දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | මොරටුව විල්ලෝරවත්ත දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 600,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | සිටිමිෂන් දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 900,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| හලාවත | ශාන්ත අන්තෝනි දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | සම්පූර්ණයි |
| මඩකලපුව | සරණාගතයින්ගේ රාජේශ්වරියගේ දේවස්ථානය | යටිතල පහසුකම් සංවර්ධනය | 1,000,000.00 | සම්පූර්ණයි |
| | ශාන්ත මරියා ආසන දෙව්මැදුර | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | සම්පූර්ණයි |
| ගාල්ල | ශාන්ත ජෝශප් දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | මාතර අප ස්වමිදුවගේ සිද්ධස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | සියළු සාන්තුවරයින්ගේ දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 873,847.00 | සම්පූර්ණයි |
| කුරුණෑගල | ශාන්ත ආනා දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,000,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| | ශාන්ත ජෝශප් වාස් සිද්ධස්ථානය | යටිතල පහසුකම් සංවර්ධනය | 1,640,526.58 | වැඩ කටයුතු කරමින් පවතී |
| මහනුවර | නුවර-එලිය, ශු. ත්‍රිත්වයේ දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 1,992,820.26 | වැඩ කටයුතු කරමින් පවතී |
| ක්‍රිස්තියානි සභා | සිටි මිෂන් දේවස්ථානය | ප්‍රතිසංස්කරණය | 900,000.00 | වැඩ කටයුතු කරමින් පවතී |
| එකතුව | | | 17,007,193.84 | |

*මූලාශ්‍රය: ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව*




සරණාගතයින්ගේ රාජේශ්වරියගේ දේවස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය

### 11.7.13 කොරොස්මීය හා පාස්කු වැඩසටහන්

- පාස්කු වැඩසටහන් 30 ක් සංවිධානය කරන ලදි.
- රු.683,100.00 ක වියදමින් දිනමිණ පුවත්පත සමඟ පාස්කු අතිරේකය බෙදාහරින ලදි.
- රු.664,500.00 ක වියදමින් දුඃඛප්‍රාප්ති නාට්‍ය නිෂ්පාදනය කරන ලදි.
- රු.2,234,725.00 ක වියදමින් දුඃඛප්‍රාප්ති නාට්‍ය විකාශනය කරන ලදි.

### 11.7.14 නත්තල් වැඩසටහන්

කිතුනුවන්ට ඉතා වැදගත් මංගල්‍යයක් වන ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය හෙවත් නත්තල් මංගල්‍යය වෙනුවෙන් දිවයින පුරා කිතුනු ජනතාව සමඟ එක්ව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අතර නත්තල් තැපැල් මුද්දර යුගලයක් සහ මුල්දින කවරයක් නිකුත්කිරීම හා ඒ වෙනුවෙන් නත්තල් චිත්‍ර තරගයක් පැවැත්වීම, නත්තල් තැපැල් මුද්දර නිකුත්කිරීමේ උත්සවය සංවිධානය, නත්තල් සුභ පැතුම්පත මුද්‍රණය, රාජ්‍ය නත්තල් උත්සවය සංවිධානය, හා විවිධ ආයතන වල වැඩසටහන් දායකත්වය ලබා දීම සිදු කරන ලදී. රාජ්‍ය නත්තල් උත්සවය මන්නාරම, නගර සභා ක්‍රීඩාංගනයේදී 2018/12/16 දින පවත්වන ලදී. නත්තල් තැපැල් මුද්දර තරඟය මගින් තේරීපත් වූ චිත්‍ර ඇසුරෙන් නත්තල් තැපැල් මුද්දරය නිකුත් කිරීම 2018/12/09 වන දින පවත්වන ලදී. දීප ව්‍යාප්ත නත්තල් කැරොල් ගායනා තරඟය සංවිධානය කරන ලදී. මුළු වියදම රු. 4,303,000.00

### 11.7.15 ජන වන්දනාව, කිතුනු කලා ශිල්ප හා සංස්කෘතික කටයුතු

කොළඹ අගරදගුරු පදවිය විසින් සංවිධානය කරන ලද ලතින් දිව්‍ය පූජාව සඳහා රු. 1,500,000.00 ප්‍රදානය කරන ලදී.

### 11.7.16 කතෝලික ක්‍රිස්තියානි කතුවරුන් සඳහා අනුග්‍රහ දැක්වීම සඳහා කිතුනු ප්‍රකාශන මිලදී ගැනීම

දෙපාර්තමේන්තුවට අනුයුක්ත සංවර්ධන නිළධාරීන් හරහා දිවයින පුරා දහම් පාසල් 44 ක් සඳහා පුස්තකාල පොත් පාර්සල් ලබා දෙන ලදී.

**මුළු වියදම රු. 806,983.75**

**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**
சுற்றுலா அபிவிருத்தி, வனஜீவராசிகள் மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சு
**Ministry of Tourism Development, Wildlife and Christian Religious Affairs**

6 වන මහල, රක්ෂණ මන්දිරය, නො.21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
6 ஆம்மாடி ரக்சன மந்திரய இல:21, வொக்ஷல்வீதி கொழும்பு 02.
6TH Floor Rakshana Mandiraya, No.21. Vauxhall Street Colombo 02.